# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 12,158 — 1960 ජූලි 15 වැනි සිකුරාදා — 15.7.1960**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... | 509 | තොටුපළ් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | 512 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | 516 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... | — | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... | 535 | විවිධ දැන්වීම් ... ... ... | 535 |


## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මෙම දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාර යෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කායශී සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

**3. සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් සවකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙවීවත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබිම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනතට අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටමු රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණ යකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

**4. නවප්‍රවේශක නිලධාරීහු.**—(i) විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරනු ලබන "නවප්‍රවේශක නිලධාරීන්" සම්බන්ධයෙන් කිසියම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇති අවස්ථාවන්හිදී මිස අන් හැම අවස්ථාවකදීම ආධුනික/පරීක්ෂා කාලය යථායෝග්‍ය පරිදි තුන් වර්ෂයක් වේ.

(ii) "නවප්‍රවේශක නිලධාරීන්" ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත් විශේෂයෙන්ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමත් සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන් ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූලව ක්‍රියා කළ යුතු වේ.

(iii) (අ) මෙම නිලධාරීන් සවකීය ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාවක් ලබා ගත යුතුය.

(ආ) සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත් වීම, ආධුනික/පරීක්ෂා කාලය අවසන් වීමෙන් එම නිලධාරීන්ගේ තනතුරු ස්ථිර කිරීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අතුරින් එකක් වේ.

ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාව සම්බන්ධයෙන් නියමිත වූ තත්ත්වයට එළඹීමට අසමත් වන අය තනතුරෙන් පහකරනු ලැබීමට ඉඩ තිබේ. එහෙත් "ඔවුන් රාජ්‍ය භාෂාව හැදෑරීමෙහි ලා අව්‍යාජ ප්‍රයත්නයක් දරා ඇතැ"යි ඔවුන් එම තනතුරුවලට පත් කළ බලධාරීන් විසින් පිළිගැණෙතොත් එසේ තනතුරුවලින් පහ කිරීම ප්‍රමාද කිරීමට ඉඩ තිබේ. එබඳු වූ කිසියම් නිලධාරියකු නියමිත දිනයට පසු සැහෙන කාල සීමාවක් ඇතුළත සිංහල භාෂා ප්‍රවීණතාව සම්බන්ධයෙන් පැවැත්වෙන පරීක්ෂණයකින් සමත් වුවහොත්, කලින් අසමත් වීම නිසා ඔහුට නැති වී ගිය ජ්‍යෙෂ්ඨත්වය නැවත ලබා දීම එම කාර්යය පිළිබඳ නිසි බලධාරීහුගේ කැමැත්ත පරිදි සිදු වේ.

509—ජේ. ඇන්. බී 25005—6,798 (7/60).

(iv) සිංහල මාධ්‍යයෙන් සුදුසු කම් ලබා රාජ්‍ය සේවාවට ඇතුළු වන නවප්‍රවේශක නිලධාරීහු සිංහල භාෂා ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබෙත්.

**සංලක්ෂ්‍යය.**—"නව ප්‍රවේශක නිලධාරීහු" යනුවෙන් මෙහි දී අදහස් කෙරෙනුයේ 1956 සැප්තැම්බර් 24 වැනිදා හෝ ඊට පසු ව හෝ රාජ්‍ය සේවාවේ තනතුරුවලට පත් කරනු ලැබුවා වූද එසේම 1957 මැයි 23 වැනි දින නිකුත් කළ අංක 379 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛනයේ 2 (ii) (ආ) සහ 2 (ii) (ඇ) දරන අනුච්ඡේදයන්ට අනුකූල ව ආදි ප්‍රවේශක නිලධාරීන් වශයෙන් නොසැලකෙන්නා වූද තැනැත්තෝ වෙත්.

5. **අවශ්‍ය සුදුසුකම්.**—තමා ලාංකිකයකු වූ බවට සැහෙන සාක්ෂ්‍ය සෑම ඉල්ලුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතු ය. "ලාංකික" යනුවෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

6. **යුද්ධ සේවා අනුග්‍රහය.**—මෙම තනතුරු සඳහා අන්‍ය සෑම අයුරෙක ම සුදුසුකම් ලැබ සිටින්නා වූද, මහා රාජිනියන් වහන්සේගේ යුද හමුදාවන්හි යෙදී සිට සේවා මුක්ත වූද අයට හා සහාය ගිනි නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහජනාරක්ෂක සේවාව යන මෙම සේවාවන්හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිටි (සිය කැමැත්තෙන් ම සේවයෙන් අස් වූවන් හැර) සෑම කෙනෙකුට මද ඔවුනු 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුටුදායක ලෙස නොකඩව සේවය කළෝ නම්, වයස පිළිබඳ සුදුසුකම් ලබා ගැනීම සඳහා පමණක්, ඉතා ඈතින් 1939 සැප්තැම්බර් 3 වැනි දිනත් ඉතා මෑතින් 1949 දෙසැම්බර 31 වැනි දිනත් යන මෙදෑතුර තමන් එසේ සේවයෙහි යෙදී සිටි කාලපරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

7. **වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින අවශ්‍ය සුදුසුකම් ඇති නිලධාරීන් මෙම තනතුරුවලට ඉල්ලුම් පත් එවිය යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මාර්ගයෙනි. රාජ්‍ය සේවාවේ ස්ථිර තනතුරු දරන නිලධාරීන් විසින් එවන ලද ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීහු, එම ඉල්ලුම් කරුවන් (තෝරාගනු ලැබුවහොත්) කාර්ය සංවිධාන සංග්‍රහයේ 109 වැනි පාලන රෙගුලාසියට අනුකූල ව ඔවුන්ගේ නිලවලින් මුදා හැරීමට තමන් සූදානම් ව සිටිත් ද නැද්දැයි සඳහන් කොට එවිය යුතු ය.

(ii) සම්මුඛ පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන තැනකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසි ම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නො ලැබේ.

(iii) කිසියම් අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යමකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවත් අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරන ලැබුව හොත්, ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

(iv) යම් අයදුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාර්‍යයෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(v) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නො ගැළපෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

---

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

### දෙවැනි පෙළේ සටහන්කරු තනතුර (තාවකාලිකයි)

ජාතික නිවාස දෙපාර්තමේන්තුවේ දෙවෙනි පෙළේ සටහන්කරු තාවකාලික තනතුරු 1ක් සඳහා ඉල්ලුම් පත්‍ර එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙහි පහත දක්වා ඇති ආකෘති පත්‍රයේ ආකාරයට පිළියෙල කරන ලද ඉල්ලුම් පත්‍ර 1960 අගෝස්තු මස 5 වැනි දිනට මත්තෙන් කොළඹ 2, පාර්සන්ස් පාරේ ජාතික නිවාස කොමසාරිස් තුමාට ලැබෙන සේ එවිය යුතුයි.

2. **වැටුප.**—රුපියල් 1,260—120—3,780 වාර්ෂික වැටුපක් ලැබේ. රුපියල් 2,820න් ඉහළට නැගීමට පෙර කාර්ය සූරතා කඩඉමෙන් පැනිය යුතුයි.

3 **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවන් ම—

(අ) 1960 අගෝස්තු 5 වැනි දිනට තමාගේ වයස අවුරුදු 20ට නොඅඩු බවටත්, අවුරුදු 50ට නොවැඩි බවටත් ;

(ආ) තමා විශිෂ්ට චරිතයකින් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බවටත් ; හා

(ඉ) (1) ලංකා කාර්මික විද්‍යාලයේ සටහන්කරුවන් සඳහා පවත්වන අවුරුද්දක සම්පූර්ණ පාඩම් මාලාවක් හෝ එම තත්ත්වයේ වෙනත් පාඩම් මාලාවක් හා අවුරුදු දෙකක ආධුනික සේවයක් සාර්ථක අන්දමින් අවසන් කර ඇති ; හෝ

(2) ලංකා කාර්මික විද්‍යාලය මගින් පවත්වන සුළු පරිපාලකයන් සඳහා පවත්වන පාඩම් මාලාව සහිත අවුරුද්දක ආධුනික සේවය සාර්ථක අන්දමින් අවසන් කර ඇති ; හෝ

(3) සැලකිය යුතු ඉංජිනේරු ආයතනයක හෝ පිළිගත් ඉංජිනේරුවන් හෝ ගෘහ නිර්මාණ ශිල්පීන් යටතේ අවුරුදු හතරක ආධුනික සේවයක් හා ලංකා කාර්මික විද්‍යාලයේ නොයෙක් තරාතිරමේ සැන්දෑ පන්තිවල අවුරුදු 3ක කාලයක් ඉගෙනීම ලබා ඇති (මේ සුදුසුකම් ඇති ඉල්ලුම්කරුවන්ට රුපියල් 1,620න් වාර්ෂික පඩියක් ලැබීමට සුදුසුය) ; හෝ

(4) 1947ට පෙර ලංකා කාර්මික විද්‍යාලයේ ගොඩනැගිලි ඉදිකිරීමේ දෙවන කොටසෙන් සාමාර්ථය ලත් අවුරුදු 2ට වැඩි කාලයක් සටහන්කරුවකු වශයෙන් හෝ ඇස්තමේන්තු පිළියෙල කරන්නෙක් වශයෙන් සැලකිය යුතු වෙළඳ ආයතනයක හෝ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක සේවය කළ ; හෝ

(5) පස් අවුරුද්දක කාලයක් සටහන්කරුවකු වශයෙන් සැලකිය යුතු ඉංජිනේරු ආයතනයක හෝ පිළිගත් ඉංජිනේරුවන් හෝ ගෘහ නිර්මාණ ශිල්පීන් යටතේ සේවය කළ බවටත් ;

සැහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(අවශ්‍ය සුදුසුකම් නැති අයදුම්කරුවන් ඉල්ලුම් කිරීමට අනවශ්‍යයි)

4. **සේවයට බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි.**—තනතුර තාවකාලිකය. විශ්‍රාම වැටුප් රහිතය. මසක කල්දීමක් ඇතුව සේවය අවසන් කළ හැකිය. රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලේ කොටස් කරුවෙකු විය හැක.

5. මේ සම්බන්ධ සියලුම ඉල්ලුම් පත්‍ර සහ ලියුම් ගනුදෙනු, ජාතික නිවාස කොමසාරිස් තැනට ලැබෙන සේ එවිය යුතුයි. මේ හැර ජාතික නිවාස දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුට පෞද්ගලික වශයෙන් නොඑවිය යුතුයි.

6. අයදුම්කරුවන් තම ඉල්ලුම් පත්‍රවල පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොව) අමුණා එවිය යුතුය.

(අ) උප්පැන්න සහතිකය. (ස. ල. බවුතීස්ම සහතික පත්‍ර, උපකෘත පාඨශාලා පිළිබඳ ව්‍යවසථා පොතේ සඳහන් කටයුතු සඳහා දෙන සහතික පත්‍ර භාරගනු නොලැබේ.)

(ආ) ලබාගත් උසස්ම අධ්‍යාපන හෝ වෘත්තීය සහතික පත්‍රය.

(ඇ) තම සුදුසුකම්, චරිතය, මේ තනතුරට පත්වීමට ඇති යෝග්‍යතාව යන මේවා සම්බන්ධයෙන් මෑතදී ලබාගත් සහතික පත්‍ර තුනක්. (රාජ්‍ය සේවයෙහි සිටින අයදුම්කරුවන්ට මේ උප වගන්තිය යටතේ සහතික පත්‍ර එවීමට නියම කරනු නොලැබේ.)

7. මේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වැනි ඡේදයේ මුල පළවූද, රාජ්‍ය සේවාවේ තනතුරුවලට කරන පත්කිරීම්වලට අදාළ වූද පොදු කොන්දේසි බලන ලෙස මතක් කරමි.

8. එවන සියලුම ඉල්ලුම් පත් ලැබුණු බව දන්වනු ලැබේ. ඉල්ලුම් පත්‍ර භාර ගැනීම නවත්වා 10 දිනක් ඇතුළත එබඳු දැන්වීමක් යම් අයදුම්කරුවකුට නොලැබුණහොත් ඒ බව ජාතික නිවාස දෙපාර්තමේන්තුවේ කොමසාරිස් තැනට වහාම දැන්විය යුතුයි. මෙසේ නොකළහොත් ඔහු ගැන සලකා බැලීමට ඇති යුතුකම නැතිවේ.

ආර්. ඇල්. ආර්නෝල්ඩ්,
ජාතික නිවාස කොමසාරිස් තැන.

ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
පාර්සන්ස් පාර, කොළඹ 2,
1960 ජූලි 9 දින.

### ආකෘති පත්‍රයයි

### ජාතික නිවාස දෙපාර්තමේන්තුව

### සටහන්කරු (දෙවන පෙළ) තනතුරක්

(1) සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන් ලිවිය යුතුයි) :————.

(අ) පෙළපත් නාමය :————.

(ආ) වෙනත් නම් :————.

(2) තැපැල් ලිපිනය :————.

(3) (අ) 1960 අගෝස්තු 5 වැනි දිනට නියම වයස :————

(ආ) උපන් දිනය. (උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණා එවිය යුතුයි. එය ආපසු එවනු නොලැබේ.) :————.

(4) ජාතිය සහ කෙසේ ලැබුනේ ද යන බව :————.

(5) ඉල්ලුම්කරුගේ පියාගේ සම්පූර්ණ නම :————.

(6) උපන් ස්ථානය—
(අ) ඉල්ලුම්කරුගේ :————.
(ආ) ඔහුගේ පියාගේ :————.
(ඉ) ඉල්ලුම්කරුගේ පිය පාර්ශ්වයේ සීයාගේ :————.
(ඊ) ඉල්ලුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තනුවන්ගේ : ————.

(7) විවාහක, අවිවාහක හෝ වැන්දඹු බව :————.
(විවාහක නම් විවාහවූ දිනය සහ දරුවන් ගණන සඳහන් කරන්න)

(8) අධ්‍යාපන සුදුසුකම් සහ අන්තිමට සාමර්ථ්‍යය ලත් විභාගය : ————.
(දින සහිතව)
(අ) ඉංග්‍රීසි :————.
(ආ) සිංහල/දෙමළ :————.

(9) කාර්මික සුදුසුකම් සහ සාමර්ථ්‍යය ලත් විභාග :————.
(දින සහිතව)

(10) ඉහත සඳහන් 3 වන ඡේදයේ (ඉ) කොටසේ කුමන වගන්ති යට අයත් සුදුසුකම් වලින් ඔබ මෙම තනතුරට ඉල්ලුම් කිරීමට සුදුස්සකු වී දැයි සඳහන් කරන්න :————.

(11) කාර්මික පළපුරුද්ද :————.

(12) පාසැලෙන් අස්වූදා සිට කළ රක්ෂාවල් :————.

(13) වෙනත් විශේෂ සුදුසුකම් ඇතොත් ඒ පිළිබඳ තොරතුරු : ————.

(14) ඔබ ණයගැතිකමින් නිදහස් ද? නොඑසේ නම් කොතරම් ණය ගැතිද ? :————.

(15) වෙනත් විස්තර :————.

මේ ඉල්ලුම් පත්‍රයේ සඳහන් කර ඇති කරුණු සත්‍යවූ සහ නිවැරදි බවට සහතික කරමි. තවද මෙහි සඳහන් කරුණු අසත්‍ය හෝ වැරදි සහගත යයි කලින් දැනගතහොත් එය මේ තනතුර සඳහා නුසුදුසුකමක් හැටියටත් පත්වූවාට පසු දැනගතහොත් කිසිම වන්දි ආදියක් නැතිව සේවයෙන් නෙරපා හැරීමේ දඬුවමටත් යටත් වන බව මම හොඳින් දනිමි.

————.
ඉල්ලුම්කරුගේ අත්සන.

දාතම :————.

සටහන් : ඉල්ලුම් පත්‍ර භාරගන්නා අන්තිම දිනය : 1960 අගෝස්තු මස 5 වැනි දින.

ඉල්ලුම් පත : ජාතික නිවාස කොමසාරිස්,
පාර්සන්ස් පාර,
කොළඹ 2.

---

## ග්‍රාම සංවර්ධන සහ ගෘහ කර්මාන්ත දෙපාර්තමේන්තුව

### අඹන්නකුගේ තනතුර

ග්‍රාම සංවර්ධන සහ ගෘහ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ අඹන්නෙකුගේ තනතුර සඳහා ඉල්ලුම් පත්‍ර බාරගනු ලැබේ. ඉල්ලුම් පත්‍ර පහත දැක්වෙන ආකෘති පත්‍රයේ ප්‍රකාර පිළියෙළකර, කොළඹ 7, ටොරින්ටන් චතුරශ්‍රයේ ග්‍රාම සංවර්ධන සහ ගෘහ කර්මාන්ත අධ්‍යක්ෂක තැන වෙත 1960 ජුලි 30 වැනි දිනට හෝ ඊට කලින් ලැබෙන සේ එවිය යුතුයි.

2. **වැටුප් :** මේ තනතුරට අයත් වාර්ෂික වැටුප් ක්‍රමය වූ කලී රු. 834—42—රු. 1,296 කි.

3. **සුදුසුකම් :** සෑම අයදුම් කරුවෙක් ම තමා—

(අ) 1960 ජුලි මස 30 වැනි දිනට අවුරුදු 21 ට නො අඩු බවටත්, අවුරුදු 40 ට නොවැඩි වූ බවටත්,

(ආ) සිංහල, දෙමල හෝ ඉංග්‍රීසි හත්වැන්න හෝ ඊට උසස් විභාගයකින් සමත් වී ඇති බවටත්,

(ඉ) රජයේ ලලිත කලායතනය මඟින් පවත්වනු ලබන මූර්ති ශිල්පය පිළිබඳ සාමාන්‍ය පෙළ සහතිකය ලබා තිබෙන බවට සහ ඇඹීම පිළිබඳ මනා පළපුරුද්දක් සහ දැනීමක් ඇති බවට සහ ;

(ඊ) විශිෂ්ඨ චරිතයකින් යුක්ත බවටත් සහතික ඉදිරිපත් කළ යුතුයි.

4. **සේවා පිළිබඳ කොන්දේසි :** මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් රහිතය. තෝරාගනු ලැබූ අයදුම් කරුගේ පත්වීම තුන් වසක් ගතවන තුරු පරීක්ෂණයකට භාජනව පවතින බව සැලකිය යුතුයි.

5. අයදුම්කරුවන් විසින් තම අයදුම් පත්වලට පහත සඳහන් සහතික (මුල් පිටපත් නොව) පිටපත් අමුනා එවිය යුතුයි.

(අ) උප්පැන්න සහතිකය : බව්තීස්ම සහතික පත්‍ර හෝ උපකෘත පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථා පොතේ සඳහන් කූටයුතු සඳහා නිකුත් කරන සහතික පත්‍ර බාරගනු නො ලැබේ.

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපනය පිළිබඳ සහතික පත්‍රය,

(ඉ) කාර්මික සුදුසුකම් සහ ඇඹීම පලපුරුද්ද සහ දැනීම පිළිබඳ සහතික පත්‍ර.

(ඊ) තම චරිතය, මේ තනතුරට පත්වීමට ඇති යෝග්‍යතාව යන මේවා සම්බන්ධයෙන් මෑතදී ලබාගත් සහතික 3 ක්. (රාජ්‍ය සේවාවෙහි යෙදී සිටින අයදුම්කරුවන් විසින් මෙම උප වගන්තිය යටතේ සහතික පත්‍ර එවීම අනවශ්‍යය.)

**සැලකිය යුතුයි :** සහතික පත්‍රවල සහ චරිත සහතිකවල මේ පිටපත් ආපසු එවනු නොලැබේ.

6. මේ ගැසට් පත්‍රයේ පළමුවෙනි කොටසේ 2 වැනි ඡේදයේ මුල පළවෙන රාජ්‍ය සේවා තනතුරුවලට පත්කිරීම් සම්බන්ධ පොදු කොන්දේසි ද බලනු මැනවි.

7. අයදුම් පත් සහ ඒවා පිළිබඳ සියලුම ලියුම් කියුම්, කොළඹ 7, ටොරිංටන් චතුරශ්‍රයේ ග්‍රාම සංවර්ධන සහ ගෘහ කර්මාන්ත අධ්‍යක්ෂක තැන වෙත එවිය යුතුයි. ඒවා මේ දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ පුද්ගලික ලිපිනයට නොඑවිය යුතුයි.

ඇම්. ඇස්. පෙරේරා,
ග්‍රාම සංවර්ධන සහ ගෘහ කර්මාන්ත අධ්‍යක්ෂ තැන.

ග්‍රාම සංවර්ධන සහ ගෘහ කර්මාන්ත දෙපාර්තමේන්තුව,
කොළඹ 7, 1960 ජුලි 9 වැනි දින.

### අයදුම් පත්‍රය

#### අඹන්නෙකුගේ තනතුර

#### ග්‍රාම සංවර්ධන හා ගෘහ කර්මාන්ත දෙපාර්තමේන්තුව

1. සම්පූර්ණ නම :————.
(අගට යෙදෙන නම මුලින්)

2. ලිපිනය :————.

3. පුරවැසි භාවය—
(අ) උත්පත්තියෙන් ද ? : ————.
(ආ) පරම්පරානුගතවද ? :————.
(ඉ) ලියා පදිංචි කිරීමෙන් ද ? :————.

4. (අ) වයස හා උපන් දිනය :————.
(ආ) විවාහකද ? අවිවාහකද ? යන වග :————.

5. උපන් ස්ථානය—
(අ) අයදුම් කරු :————.
(ආ) අයදුම් කරුගේ පියා :————.
(ඉ) ඔහුගේ පිය පාර්ශවයේ මුත්තා :————.
(ඊ) ඔහුගේ පිය පාර්ශවයේ මී මුත්තා :————.

6. සාමාර්ථය ලැබූ විෂයයන් හා දිනයන් ඇතුලුව, ලබන ලද උසස්ම අධ්‍යාපන සුදුසුකම් :————.

7. පාසැලෙන් අස්වූ දිනය හා ඉගෙන ගත් පාසැලේ නම :————.

8. කාර්මික සුදුසුකම් :————.

9. මූර්ති ශිල්පය පිළිබඳ පලපුරුද්ද සහ දැනීම :————.

10. පාසැලින් අස්වූ දින සිට කළ රක්ෂාවල් හා ඒ සම්බන්ධවූ දිනයන් හා ආණ්ඩුවේ රක්ෂාවක් කරන ලද්දේ නම් ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර :————.

11. කියවීම, ලිවීම, කථා කිරීම හා අර්ථ නිරූපනය පිළිබඳ ප්‍රවීණතාවය—
(අ) සිංහල :————.
(ආ) දෙමළ :————.
(ඉ) ඉංග්‍රීසි :————.

12. වෙනත් සුදුසුකම් හා තනතුර පිළිබඳ ඉදිරිපත් කළ හැකි අයිතිවාසිකම් සම්බන්ධ විස්තර :————.

13. චරිතය පිළිබඳ සහතික ලබාගත් තිදෙනාගේ නම් සහ තනතුරු (එම සහතික පත්වල මුල් ලිපි නොව, පිටපත් අයදුම් පතට ඇමිණිය යුතුයි) :————.

————.
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

අංකය : 1/23/2/9 (ජී).

## සාමාන්‍ය ලිපිකරු සේවයේ විධායක ලිපිකරු පංතියේ දෙවැනි ශ්‍රේණියට උසස් කිරීමේ විභාගය

**විභාගය පවත්වන දිනය.**—සාමාන්‍ය ලිපිකරු සේවයේ විධායක ලිපිකරු පංතියේ දෙවැනි ශ්‍රේණියට උසස් කිරීමේ තරඟ විභාගයක් වර්ෂ 1960 වේ ඔක්තෝබර් මාසයේ 8 වැනිද කච්චේරි පිහිටි සියලු ම නගරවලදී විභාග කොමසාරිස් විසින් පවත්වනු ලැබේ.

අපේක්ෂකයන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නැති කච්චේරි පිහිටි කිසි නගර මධ්‍යස්ථානයක් වේනොත් එම මධ්‍යස්ථානය අවලංගු කෙරෙනු ඇත.

2. **ප්‍රතිඵල ප්‍රසිඩ කිරීම.**—සමත් වූ අපේක්ෂකයන්ගේ නම් **ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි** පළ කරනු ලැබේ.

3. **වැටුප් සහ සේවා කොන්දේසි :** සාමාන්‍ය ලිපිකරු සේවය පිළිබඳව වර්ෂ 1955 හේ ඔක්තෝබර් මාසයේ 1 වැනි දිනයෙහි 10,844 වැනි අංකය දරණ **ආණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ** පළ කරන ලද වාර්තාව බලනු මැනවි.

4. **සුදුසුකම්.**—පහත සඳහන් අපේක්ෂකයෝ **පමණක්** මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුස්සෝ වෙති :—

(අ) වර්ෂ 1960 වේ ඔක්තෝබර් මාසයේ 1 වැනි දිනයෙහි හෝ ඊට පෙර හෝ සාමාන්‍ය ලිපිකරු පංතියේ අවුරුදු 4 ක සේවයක් සතුටුදායක ලෙස සම්පූර්ණ කර ඇති, සාමාන්‍ය ලිපිකරු සේවයේ සාමාන්‍ය ලිපිකරු පංතියේ ලිපිකරුවෝ. එවැනි ලිපිකරුවන්ගේ අයදුම් පත් දෙපාර්තමේන්තු ප්‍රධානයන්ගේ මාර්ගයෙන් එවිය යුතු ය. එසේ අයදුම් පත් එවන විට, සතුටුදායක සේවය පිළිබඳ සහතික ද, ඊට ඇතුළත් කළ යුතු ය.

(ආ) * වර්ෂ 1935 හේ අගෝස්තු මාසයේ 1 වැනි දිනයට පෙර ආණ්ඩුවේ සේවයේ හෝ රබර් පාලක දෙපාර්තමේන්තුවේ නැතහොත් තේ පාලක දෙපාර්තමේන්තුවේ හෝ සේවයේ යෙදී සිටි (රේගු, තැපැල් මිනින්දෝරු, වරාය ඉංජිනේරු හෝ දුම්රිය දෙපාර්තමේන්තුවල සමාජිකයන් හැර) කුමන අරමුදලකින් ගෙවීම ලැබුවේ වී නමුත්, රාජ්‍ය සේවා ව්‍යවස්ථාවල (දැන් අවලංගු කර ඇති) "අ" උපග්‍රන්ථයේ (Appendix A) 11 වැනි වගන්තියේ විග්‍රහ කර ඇති පරිදි එවකට ආණ්ඩුවේ සේවයේ ලිපිකරුවන් ව සිටි **එම තත්ත්වය ම තවමත් අයිති** පසුගිය අවුරුදු තුන ඇතුළත සේවය සතුටුදායක වූ ලිපිකරුවෝ. ඔවුන්ගේ අයදුම් පත්, සතුටුදායක සේවය පිළිබඳ සහතිකයක් සහ වර්ෂ 1935 හේ ජූලි මාසයේ සිට අද දක්වා අඛණ්ඩ සේවයක් ඇති බවට සහතිකයක් ද කැටුව ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන්ගේ මාර්ගයෙන් එවිය යුතු ය.

**සැලකිය යුතුයි.**—රාජ්‍ය සේවයේ යෙදී නැති අය විභාගයට පෙනී සිටීමට සුදුස්සෝ නොවෙති.

5. **අයදුම් පත්.**—(i) දෙපාර්තමේන්තුවල හෝ කාර්යාලවල හෝ ප්‍රධානයන් විසින් තම දෙපාර්තමේන්තුවල හෝ කාර්යාලවල හෝ සේවය කරන නිලධාරීන්ගේ ප්‍රයෝජනය සඳහා, විභාගයට ඇතුළත් වීමේ අයදුම් පත් පෝර්ම වර්ෂ 1960 වේ ජූලි මස 22 වැනි දිනයෙහි සිට අගෝස්තු මස 12 වැනි දිනය දක්වා කාලය තුළ කොළඹ 2, මැලේ වීදියේ, විභාග දෙපාර්තමේන්තුවෙන් ලබා ගත යුතු ය. පෞද්ගලිකව පැමිණෙන හෝ තැපැල් මඟින් ඉල්ලුම් කරන හෝ තනි ඉල්ලුම්කරුවන් වෙත අයදුම් පත් පෝර්ම නිකුත් කරනු නො ලැබේ.

(ii) සෑම අයදුම් පතක් ම සර්වප්‍රකාරයෙන් ම නිවැරදි ලෙස සම්පූර්ණ කර ඇති බවට හා අයදුම් පතට යා කර ඇති සහතිකය තමන් විසින් අත්සන් කොට ඇති බවට දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් වග බලා ගත යුතු ය. සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගේ අයදුම් පත්, දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් කොළඹ 2, විභාග කොමසාරිස් තැන වෙත වර්ෂ 1960 වේ අගෝස්තු 15 වැනි දිනයට හෝ ඊට පෙර හෝ ලැබෙන සේ ලියා පදිංචි කළ තැපෑලෙන් යැවිය යුතුයි. නියමිත දිනට පසු ව ලැබෙන අයදුම් පත් භාර ගනු නො ලැබේ.

6. **විභාගයට ඇතුළත් වීම.**—(i) තමන්ගේ අයදුම් පත් අනුමත කරගත් සියලුම අපේක්ෂකයන්ට විභාග කොමසාරිස් තැන විසින් ඇතුළත් වීමේ පත්‍රිකා නිකුත් කරනු ලැබේ. විභාගය සඳහා පෙනී සිටින අපේක්ෂකයන් විසින්, විභාග පරිපාලනය කිරීම සඳහා පත් කළ නිලධාරි තැන වෙත ඔවුන්ගේ ඇතුළත් වීමේ පත්‍රිකා ඉදිරිපත් කළ යුතු ය. එවැනි පත්‍රිකා නොමැතිව ඔවුන්ට විභාගයට ඇතුල් වීමට ඉඩ දෙනු නො ලැබේ.

(ii) එක් එක් අපේක්ෂකයා වෙත කාල සටහන් නිකුත් නො කරනු ලැබේ. මෙම නිවේදනයේ 9 වැනි ඡේදයේ දැක්වෙන කාල සටහන අපේක්ෂකයන් විසින් සටහන් කර ගත යුතු ය.

(iii) විභාගය පැවැත්වීම පිළිබඳව විභාග කොමසාරිස් තැන විසින් පනවන ලද ව්‍යවස්ථා සහ රෙගුලාසිවලට අපේක්ෂකයෝ බැඳී සිටිය යුතු වෙති. තව ද මේ ව්‍යවස්ථා සහ රෙගුලාසි උල්ලංඝනය කළ හොත්, විභාග කොමසාරිස් තැන විසින් පනවන ලද ඕනෑම දඬුවමකට යටත් වීමට ඔවුන්ට සිදු වෙනවා ඇත.

7. **විභාගයට පෙනී සිටීම සඳහා ආණ්ඩුවේ නිලධාරීන්හට නිවාඩු.**—තමන්ගේ අයදුම් පත් විභාග කොමසාරිස් තැන විසින් අනුමත කර ගත් අපේක්ෂකයන්ට විභාගයට පෙනී සිටීමට හැකි වන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් නිවාඩු දිය යුතු ය. ගමන් ගාස්තු ගෙවනු නො ලැබේ.

8. **විභාග පරිපාටිය.**—විභාගයේ විෂයයන් සහ එක් එක් විෂයයට අයිති ලකුණු ගණන පහත දක්වා ඇත. සියලුම උත්තර පත්‍රිකාවල අශෝභන ලෙස ලියා ඇති විට සහ අක්ෂර වින්‍යාසයේ වැරදිවලට ලකුණු අඩු කරනු ලැබේ. කියවිය නො හැකි ලෙස ලියා ඇති අපේක්ෂකයන් නුසුදුස්සන් කරනු ලැබීමට ඉඩ ඇත.

| | | ලකුණු |
|---|---|---|
| (1) ගණිත් (පැය එක හමාරක පත්‍රයකි) | ... | 100 |

මෙම පත්‍රය ගණිත් සහ එකතු කිරීම් අභ්‍යාස හා සම්බන්ධ ප්‍රශ්නවලින් සමන්විත වනු ඇත. එය ඉලක්කම් හා සම්බන්ධ වැඩ කිරීමේ දී ඇති නිරවද්‍යතාව සහ ගණිත් පිළිබඳ සරල මූලික නීති—රීතීන් ගැන දැනීම විභාග කිරීම පිණිස පිළියෙල කර ඇත.

| | | |
|---|---|---|
| (2) ව්‍යවස්ථා, කාර්ය පරිපාටිය හා කාර්යාලයීය ක්‍රම | ... | 200 |

(පැය දෙකක පත්‍රයකි) ලිපිකරුවකු වශයෙන් නිලධාරියකුගේ ප්‍රයෝජනය සහ ප්‍රවීණතාව විභාග කර බැලීම පිණිස මෙම ප්‍රශ්න පත්‍රය පිළියෙල කරනු ලැබේ. සැබෑ කාර්යාලයීය ලියුම් මාලාවක සාරාංශයක් ලිවීමට, නියෝගයක් අනුව කෙටුම්පත් ලිපියක් ඉදිරිපත් කිරීමට, සූචි ක්‍රමය සහ ලිපි ගොනු කිරීමාදිය හා සම්බන්ධ දැනුමක් විදහා පෑමට ඔහුට සිදු වෙනවා ඇත. තව ද ලිවීමේ දී පැහැදිලිව අදහස් ප්‍රකාශ කිරීමේ දැනුම ද පෙන්විය යුතු ය.

**සැලකිය යුතුයි.**—(i) මෙම එක් එක් ප්‍රශ්න පත්‍රයට සම්පූර්ණ වශයෙන් ඉංග්‍රීසියෙන් හෝ සිංහලෙන් හෝ උත්තර සැපයීමට අපේක්ෂකයන්ට පුළුවන.

(ii) මෙය තරඟ විභාගයක් වුව ද මෙම එක් එක් විෂයයෙන් අපේක්ෂකයන් විසින් අඩුම ගණනේ ලකුණු සියයට හතළිස් පහක් ගැනීම ද විෂයයන් දෙකේ ම මුළු ලකුණු ගණනින් සියයට පණහක් ගැනීම ද අවශ්‍ය ය.

(3) සිංහල හෝ දෙමළ—

| | | ලකුණු |
|---|---|---|
| (අ) පැය එක හමාරක ලිවීමේ ප්‍රශ්න පත්‍රයක් | ... | 100 |
| (ආ) සම්මුඛ පරීක්ෂණයක් | ... | 100 |

ලිඛිත ප්‍රශ්න පත්‍රයට පහත සඳහන් අභ්‍යාස ඇතුළත් වෙයි :—

(i) සරල ගද්‍ය කොටස් අවබෝධය ;

(ii) පහත සඳහන් රචනා විධි එකක් හෝ වැඩි ගණනක් හෝ :—
විස්තරාත්මක රචනා, දෙබස් හා ලියුම් ලිවීම් ;

(iii) (අ) වාක්‍යයන් සිංහලට/දෙමළට ද,
(ආ) සරල ගද්‍ය කොටසක් ඉංග්‍රීසියට ද පරිවර්තනය කිරීම.

(iv) වචනවල අර්ථය, ක්‍රියාකාරිත්වය සහ එකිනෙකට සම්බන්ධ කම, පාඨ සහ වාක්‍ය, වැරදි ආදිය.

**සැලකිය යුතුයි.**—(i) මෙම විෂය හා සම්බන්ධ විභාග අපේක්ෂකයන් හට වැඩ කිරීමට හැකි තරමේ භාෂා ඥානයක් ඇතිදැයි පරීක්ෂා කිරීම් වස් පිළියෙල වූවකි.

(ii) (1) සහ (2) වැනි විෂයයන් දෙකේ ම මුළු ලකුණු ගණනින් එක්තරා අඩුම ප්‍රමාණයකට වඩා වැඩි ලකුණු ගණනක් ගෙන ඇති අපේක්ෂකයන් සම්මුඛ පරීක්ෂනයකට කැඳවනු ලැබේ. එවැනි අපේක්ෂකයන් තෝරා ගැනීමට සුදුසුවීම පිණිස ඔවුන් විසින් ලිඛිත

---

* රාජ්‍ය සේවයේ ව්‍යවස්ථාවල "අ" උපග්‍රන්ථයේ (Appendix A) 11 වැනි වගන්තියේ විග්‍රහ කර ඇති පරිදි "රාජ සේවා ලිපිකරුවෝ" යන්නට පහත දක්වා ඇති අය ඇතුළත් වෙති :—

(අ) රාජකාරිය හැටියට ප්‍රධාන වශයෙන් ලිපිකාර වැඩ කරන්නා වූ ආණ්ඩුවේ සථිර හෝ තාවකාලික හෝ දෙපාර්තමේන්තුවක සේවයේ නියුක්ත ව සිටින්නා වූ ද ආණ්ඩුවේ ඇස්තමේන්තුවල සම්මත මුදල් වලින් ගෙවීම් ලැබුවා වූ ද තාවකාලික ලිපිකරුවෝ, පොත් බඳින්නෝ සහ ගබඩා භාරකරුවෝ : එසේ වන්නේ, එවැනි තාවකාලික නිලධාරීන් දෛනික වැටුප් ලබන අය නම්, ඔවුන් ඉඳ හිටලා නොව නො කඩවා සේවයේ යෙදී සිටියහොත් පමණි.

(ආ) රාජකාරි හැටියට ප්‍රධාන වශයෙන් ලිපිකාර වැඩ කරන්නා වූ ද ආණ්ඩුවේ ඕනෑම දෙපාර්තමේන්තුවක සේවයේ නියුක්ත වූ ද පිළිගත්, අනුමත කළ ගාස්තුවලින් ගෙවීම් ලැබූ ලිපිකරුවෝ, පොත් බඳින්නෝ සහ ගබඩා භාරකරුවෝ.

(ඇ) ගම්කාර්ය සභා, ගම්සභා උසාවි, සනීපාරක්ෂක මණ්ඩල, දිස්ත්‍රික්ක පාඨශාලා සභා සහ අධ්‍යාපන දිස්ත්‍රික්ක පාඨශාලා කාරක සභාවල අරමුදල් වලින් ගෙවීම් ලැබූ ලිපිකරුවෝ.

ප්‍රශ්න පත්‍රයේ සහ සම්මුඛ පරීක්ෂණයේ මුළු ලකුණුවලින් සියයට 40 ක් ගත යුතු ය. එහෙත් මෙම විෂයයෙන් ලැබූ ගණන යෝග්‍යතා පිළිවෙල නිශ්චය කිරීමේ දී සැලකිල්ලට භාජනය කරනු නො ලැබේ.

**සංලක්ෂ්‍යය.**—සිංහල හෝ දෙමළ භාෂා පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයේ ඉහළ පෙලින් හෝ පහළ පෙලින් හෝ සමත් වී ඇති අපේක්ෂකයෝ අංක (3) දරණ සිංහල/දෙමළ භාෂාව පිළිබඳ විෂයයෙන් නිදහස් කිරීමට සුදුසුකම් ලබන්නෝ වෙත්.

9. **විභාගය පිළිබඳ කාල සටහන පහත සඳහන් පරිදි ය :—**

පෙරවරු 9.00 සිට පෙරවරු 11.00 දක්වා—ව්‍යවස්ථා, කාර්‍ය්‍ය පරිපාටිය හා කාර්‍යාලයීය ක්‍රම.

පස්වරු 1.00 සිට පස්වරු 2.30 දක්වා—ගණිත්.

පස්වරු 2.45 සිට පස්වරු 4.15 දක්වා—සිංහල/දෙමළ. සිංහල/ දෙමළ පිළිබඳ සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනයත්, වේලාවත්, ස්ථානයත් ඊට සුදුස්සන් වන සෑම අපේක්ෂකයකු වෙතම විභාග කොමසාරිස් තැන විසින් දන්වා යවනවා ඇත.

10. **වෛද්‍ය පරීක්ෂණය.**—විභාගයෙන් සාමාර්ථය ලබන දනට සාමාන්‍ය ලිපිකරු සේවයේ නොමැති අපේක්ෂකයන් ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ඔවුන් සුදුසු ශරීර ශක්තියෙන් යුක්තදැයි සොයා බැලීම පිණිස වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු ය.

එච්. ඊ. පීරිස්,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.

වර්ෂ 1960 ක්වූ ජූලි මස 11 වැනි දින,
කොළඹ,
මහා භාණ්ඩාගාරයේ දී ය.

---

අංකය: 1/23/24/1(ජී).

## සාමාන්‍ය ලිපිකරු සේවයේ සාමාන්‍ය ලිපිකරු පන්තියට ඇතුළත් කරගැනීම සඳහා රජයේ දිස්ත්‍රික් ලිපිකරු සේවයේ නිලධාරීන් උදෙසා පැවැත්වූ (විශෙෂ) විභාගය—1960වෙ පෙබරවාරි

වර්ෂ 1960 වෙ පෙබරවාරි මස පවත්වනු ලැබූ සාමාන්‍ය ලිපිකරුසේවයේ සාමාන්‍ය ලිපිකරුපංතියට ඇතුළත් කරගැනීම සඳහා, රජයේ දිස්ත්‍රික් ලිපිකරුසේවයේ නිලධාරීන් උදෙසා පැවැත්වූ (විශෙෂ) විභාගයේ ප්‍රතිඵල අනුව, පහත සඳහන් අපේක්ෂකයන් සාමාන්‍ය ලිපිකරුසේවයේ සාමාන්‍ය ලිපිකරුපංතියට තෝරාගෙන තිබෙන බව මෙයින් නිවේදනය කරනු ලැබේ :—

| නම | ලිපිනය |
|---|---|
| අතුකෝරාල, ඩී. කේ. ... | ආණ්ඩුවේ අභ්‍යාස විද්‍යාලය, මීරිගම |
| අදිකාරි, කේ. ... | මාවතගොඩ මධ්‍ය මහා විද්‍යාලය, අරනායක |
| අබේවර්ධන, ආර්. වයි. ... | ඉඩම් කොමසාරිස් කාර්‍යාලය, කොළඹ |
| අල්විස්, ආර්. ඩී. ඩී. ... | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ |
| අල්විස්, ටී. පී. ජී. එස්. ... | ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්‍යාලය, බද්දේගම |
| ආරියදස, ආර්. ... ... | මධ්‍ය මහා විද්‍යාලය, දෙනියාය |
| ඇතුලත්මුදලි, එම්. ... | ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්‍යාලය, මීහිරිගම |
| ඇල්බට්, ජී. එම්. ... | ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්‍යාලය යටියන්තොට |
| ඉද්දවෙල, අයි. එල්. ආර්. එල්. බී. | ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්‍යාලය, නෙලුන්දෙනිය |
| ඊබට්, ටී. ඩී. ... ... | සහකාර ආහාර පාලක කාර්‍යාලය, නුගේගොඩ |
| එදිරිමාන්න, ඩී. ඩී. ... | ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්‍යාලය, හොරන |
| ඒකනායක, ඒ. ... ... | ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්‍යාලය, කොළඹ 7 |
| කනගරත්නම්, එස්. ... | අධ්‍යාපන කාර්‍යාලය, මහනුවර |
| කපුරුබංඩා, ආර්. එම්. ... | ඉඩම් ලියාපදිංචි කිරීමේ හා දිස්ත්‍රික් ලේකම් කාර්‍යාලය, කුරුණෑගල |
| කරුණානන්ද, එච්. පී. ... | ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්‍යාලය, හඟුරන්කෙත |
| කරුණානායක, ආර්. එම්. බී. ... | සෞඛ්‍ය කාර්‍යාලය, ගම්පොල |
| කරුණාරත්න, එස්. ඒ. ... | ආර්. කේ. ශාඛාව, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, කොළඹ 2 |
| කරුණාරත්න, ටී. එම්. ... | ඉඩම් සහ දිස්ත්‍රික්ලේකම් කාර්‍යාලය, කෑගල්ල |
| කරුණාසේන, එස්. ඒ. ... | ආර්. කේ. ශාඛාව, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, කොළඹ 2 |

| නම | ලිපිනය |
|---|---|
| කලුආරච්චි, පී. ජී. ... | වාරිමාර්ග කාර්‍යාලය, බදුල්ල |
| කුමාරණ, ඊ. එම්. ආර්. ... | ජී. එස්. ශාඛාව, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, කොළඹ 2 |
| ගමගේ, එම්. එස්. ... | විදුලි බල ස්ථානය, කොළඹ 11 |
| ගමගේ, පී. ඩබ්ලිව්. ... | ගම්බද උසාවිය, මොරවක |
| ගුණතිලක, ආර්. පී. ... | කච්චේරිය, අනුරාධපුරය |
| ගුණතිලක, ඩබ්ලිව්. පී. ... | ගම්බද උසාවිය, බද්දේගම |
| ගුණතිලක, ඩී. පී. ඩබ්ලිව්. ... | ලංකා කාර්මික විද්‍යාලය, කොළඹ 10 |
| ගුණදස, එම්. පී. ... | ප්‍රාදේශීය ආදායම් පාලක කාර්‍යාලය නාත්තන්ඩිය |
| ගුණදස, කේ. ඩී. ... | විදුලි කර්මාන්ත, දෙපාර්තමේන්තුව, කොළඹ 10 |
| ගුණදස, ටී. ... ... | ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්‍යාලය, හෝමාගම |
| ගුණපාල, කේ. කේ. ... | ගම්බද උසාවිය, කොග්ගල, හබරාදූව |
| ගුණපාල, ජේ. කේ. ... | ඉඩම් හා දිස්ත්‍රික් ලේකම් කාර්‍යාලය, ගාල්ල |
| ගුණරත්න, එච්. ආර්. ... | මධ්‍ය විද්‍යාලය, තෝලන්ගමුව, නෙලුන්දෙනිය |
| ගුණරත්න, එච්. ඒ. එම්. ... | සමූපාකාර කාර්‍යාලය, රත්නපුර |
| ගුණවර්දන, එන්. පී. එන්. ඩී. ... | අධ්‍යාපන කාර්‍යාලය, ගාල්ල |
| ගුණවර්දන පී. ඒ. ... | ජාතික ඉතිරි කිරීමේ ව්‍යාපාරය, 23, මල්පාර, කොළඹ 7 |
| ගුණවර්ධන, කේ. ඩී. සී. ඩී. ... | ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්‍යාලය, අම්බලන්ගොඩ |
| ගුණවර්ධන, පී. ඒ. ... | ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්‍යාලය, කඹුරුපිටිය |
| ගුණසිංහ, එන්. පී. ඒ. එන්. ... | අධ්‍යාපන කාර්‍යාලය, ගාල්ල |
| ගුණසිංහ, යූ. ඩී. ඒ. ... | ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යංශය, කොළඹ |
| ගුණසේකර, එච්. ඩී. වී. ... | ජාතික නිවාස දෙපාර්තමේන්තුව, කොළඹ 2 |
| ගුණසේකර, බී. ඒ. ... | කම්කරු කර්මාන්ත හා ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යංශය, කොළඹ |
| ගුණසේන, ඩබ්ලිව්. ... | මධ්‍ය විද්‍යාලය, නාරම්මල |
| චන්ද්‍රදස, බී. ඒ. ... ... | ගම්බද උසාවිය, හක්මන |
| චන්ද්‍රසේන, කේ. ඩී. ... | ඒ. සී. ශාඛාව, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, කොළඹ 2 |
| ජගත්සේන, ඩී. ඒ. ... | ඔඩිට් ශාඛාව, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, කොළඹ 2 |
| ජමීල්, එම්. එස්. ... ... | විදුලි කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ගබඩාව, කොලොන්නාව, වැල්ලම්පිටිය |
| ජයතිස්ස, ඩී. පී. ... | ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්‍යාලය, පොල්ගහවෙල |
| ජයරත්න, ඩබ්ලිව්. ඒ. එස්. ... | මෝටර්රථ ගමනාගමන දෙපාර්තමේන්තුව, කොළඹ 5 |
| ජයවර්දන, ඒ. ජී. ... | ආහාර පාලක අංශය, කච්චේරිය, රත්නපුරය |
| ජයසිංහ, ඊ. ඒ. ... ... | ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව, කොළඹ 1 |
| ජයසිංහ, එච්. එච්. ... | මධ්‍ය විද්‍යාලය, වේයන්ගොඩ |
| ජයසිංහ, එච්. එල්. ඒ. ... | ලංකා ගුවන් විදුලි සම්ප්‍රේෂන ස්ථානය, ඒකල, ජාඇල |
| ජයසේකර, එල්. ... | ලංකා කාර්මික විද්‍යාලය, කොළඹ 10 |
| ජයසේන, ආර්. ඩී. ... | කර්මාන්ත, දෙපාර්තමේන්තුව, කොළඹ 2 |
| ජයසේන, එච්. පී. ... | ප්‍රධාන ගණකාධිකාරි කාර්‍යාලය, ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව, කොළඹ 10 |
| ජිනදස, ඩබ්ලිව්. ඒ. එම්. ... | ගම්බද උසාවිය, මිහින්තලේ |
| ජිනදස, ඩී. එම්. ... | පළාත් පාලන කාර්‍යාලය, කුරුණෑගල |
| ජේමිස් අප්පුහාමි, ආර්. එම්. පී. ... | ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්‍යාලය, උඩදුම්බර, මාදුගොඩ |
| ජෝර්ජ්, බී. ... ... | ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්‍යාලය සම්මන්තුරෙයි |
| ඥානරත්න, ටී. ඒ. ... | ගම්බද උසාවිය, ගංගොඩවිල, නුගේගොඩ |
| ඩේවිඩ්, එච්. ... ... | කේ. එස්. ශාඛාව, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, කොළඹ 2 |
| ඩේවිඩ්, එච්. පී. ඩී. ... | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ 7 |
| ඩේවිඩ්. ටී. කේ. ... ... | ආණ්ඩුවේ මධ්‍ය විද්‍යාලය, පිළියන්දල |
| ඩේවිඩ්, පී. කේ. ... ... | වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් කාර්‍යාලය, කොළඹ 1 |

| නම | ලිපිනය |
|---|---|
| ඩේවිඩ්, සී. ඒ. ඩී ... | ... සහකාර ආහාර පාලක කාර්යාලය, නුගේගොඩ |
| තියාගරාජා, ඒ. ආර්. | ... ප්‍රාදේශීය කෘෂිකර්ම කාර්යාලය, කන්තලේ |
| තෙන්නකෝන්, ටී. එම්. ටී. බී. | ... ගම්බද උසාවිය, වාරියපොල |
| තේනුවරගම, එම්. | ... සෞඛ්‍ය කාර්යාලය, බද්දේගම |
| තෝමිස්, කේ. ඒ. ... | ... ඔඩිට් දෙපාර්තමේන්තුව, කොළඹ 7 |
| ත්‍රිමාන්න, ටී. එම්. | ... කච්චේරිය, කලුතර |
| දයානන්ද, ඒ. ඩී. | ... ප්‍රාදේශීය ආදයම් නිලධාරි කාර්යාලය, කුරුවිට |
| දයානන්ද, ඩබ්ලිව්. පී. | ... සංඛ්‍යා ලේඛන ශාඛාව, ප්‍රධාන ගණකාධිකාරි කාර්යාලය, ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව, මරදන |
| ද සිල්වා, ආර්. ඒ. | ... සංඛ්‍යා ලේඛන ශාඛාව, ප්‍රධාන ගණකාධිකාරි කාර්යාලය, ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව, මරදන |
| ද සිල්වා, එම්. සී. | ... පළාත් පාලන කාර්යාලය, කොළඹ 1 |
| ද සිල්වා, එස්. පී ... | ... ශ්‍රේෂ්ඨාධිකරණය, කොළඹ 12 |
| ද සිල්වා, ජේ. එම්. | ... ප්‍රාදේශීය ආදයම් නිලධාරි කාර්යාලය, කඳාන |
| දිසානායක, ඩබ්ලිව්, එස්. | ... මධ්‍ය මහා විද්‍යාලය, පැල්මඩුල්ල |
| දෙලුන්ගහවත්ත, ඩී. | ... ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව, කොළඹ 7 |
| දේවසුරේන්දර, ඩී. ඩබ්ලිව්. | ... ප්‍රාදේශීය ආදයම් නිලධාරි කාර්යාලය, 55, කිරිල්ලපන මාවත, කොළඹ 6 |
| ධර්මජීව, ජී. ඒ. ... | ... සෞඛ්‍ය නිලධාරි කාර්යාලය, වලස්මුල්ල |
| ධර්මතිලක, යූ. කේ. ජී. එස්. | ... සෞඛ්‍ය කාර්යාලය, ඌරුගල |
| ධර්මදස, ජී. ඩී. ... | ... විදුලි කර්මාන්ත දෙපාර්තමේන්තුව, තැ. පෙ. නො. 540, කොළඹ |
| ධර්මසේකර, කේ. පී. | ... වැන්දඹු සහ අන්තදරු විශ්‍රාම වැටුප් අරමුදල් කාර්යාලය, කොළඹ |
| ධර්මසේන, එල්. ඩී. | ... ආණ්ඩුවේ ගබඩා දෙපාර්තමේන්තුව, කොළඹ |
| නක්කාවිට, එන්. කේ. ජී. | ... ප්‍රාදේශීය ආදයම් නිලධාරි කාර්යාලය, කොලොන්න |
| නඩේසන්, කේ. ... | ... ගම්බද උසාවිය, වෙන්කලඩි |
| නන්දසේන, ඒ. ජී. | ... ප්‍රධාන කාර්මික ඉන්ජිනේරු කාර්යාලය, රත්මලාන |
| නානායක්කාර, ජී. ඒ. එස්. | ... විභාග දෙපාර්තමේන්තුව, කොළඹ 2 |
| නානායක්කාර, ඩබ්ලිව්. | ... වාරිමාර්ග දෙපාර්තමේන්තුව, කොළඹ |
| පතිරන, ජේ. කේ. | ... ජනලේඛන සහ සංඛ්‍යා ලේඛන කාර්යාලය, කොළඹ 7 |
| පියතිස්ස, ඒ. ඒ. එස්. | ... කච්චේරිය, කෑගල්ල |
| පියතුංග, කේ. එල්. | ... ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය, කොළඹ 1 |
| පියරත්න, ජේ. ඒ. | ... ආණ්ඩුවේ ප්‍රකාශක මණ්ඩලය, කොළඹ |
| පියසේන, ආර්. ඒ. | ... අධ්‍යාපන කාර්යාලය, මහනුවර |
| පියසේන, කේ. කේ. ඩබ්ලිව්. | ... ඉඩම් ලියාපදිංචි කිරීමේ හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මඩකලපුව |
| පීරිස්, ඊ. එම්. ඩී. ... | ... කම්කරු කාර්යාලය, මහනුවර |
| පෙරේරා, අයි. පී. | ... ප්‍රාදේශීය ආදයම් නිලධාරි කාර්යාලය, පිළියන්දල |
| පෙරේරා, එච්. ඒ. ඩී. | ... ප්‍රාදේශීය ආදයම් නිලධාරි කාර්යාලය, කුරුවිට |
| පෙරේරා, එම්. එම්. | ... සංඛ්‍ය ලේඛන අංශය, ප්‍රධාන ගණකාධිකාරි කාර්යාලය, ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව, මරදන |
| පෙරේරා, එම්. ටී. එස්. | ... දුම්රිය සාමාන්‍යාධිකාරි කාර්යාලය, තැ. පෙ. අංකය 355, කොළඹ 10 |
| පෙරේරා, එස්. ඒ. ඒ. | ... ප්‍රාදේශීය ආදයම් නිලධාරි කාර්යාලය, හොරණ |
| පෙරේරා, එස්. සී. | ... තැපැල් ශාඛාව, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, කොළඹ 2 |
| පෙරේරා, ජේ. එම්. ඩබ්ලිව්. | ... ආරක්ෂක සහ විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය, කොළඹ 1 |
| පෙරේරා, ජේ. කේ. ඒ. පී. | ... ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලය, හලාවත |
| පෙරේරා, පී. ඒ. සී. | ... ග්‍රාම සංවර්ධනය හා ගෘහ කර්මාන්ත දෙපාර්තමේන්තුව, කොළඹ 7 |
| පොඩිනිලමේ, ඒ. | ... ප්‍රාදේශීය ආදයම් නිලධාරි කාර්යාලය, යටියන්තොට |
| පොන්සේකා, එච්. බී. | ... ජී. එස්. ශාඛාව, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, කොළඹ 2 |
| ප්‍රනාන්දු, එච්. ඩී. ඩී. | ... කච්චේරිය, කලුතර |
| ප්‍රනාන්දු, ඒ. එච්. | ... ප්‍රාදේශීය කම්කරු කාර්යාලය, මීගමුව |
| ප්‍රනාන්දු, කේ. එල්. | ... ප්‍රාදේශීය ආදයම් නිලධාරි කාර්යාලය, හලාවත |
| ප්‍රනාන්දු, ඩබ්ලිව්. වී. ජේ. | ... සමුපකාර කාර්යාලය, ගම්පහ (බ.ප.) |
| ප්‍රනාන්දු, බී. ජේ. ඇම්. | ... ඉඩම් සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මීගමුව |
| ප්‍රනාන්දු, සී. එල්. එම්. | ... කර්මාන්ත කාර්යාලය, කොළඹ 2 |
| ප්‍රේමචන්ද්‍ර, කේ. වී. එස්. | ... ප්‍රාදේශීය ආදයම් නිලධාරි කාර්යාලය, මතුගම |
| බන්ඩාර, බී. ඩී. ... | ... පරණකුරු කෝරළයේ ප්‍රාදේශීය ආදයම් නිලධාරි කාර්යාලය, කෑගල්ල |
| බාලසුබ්‍රමානියම්, එන්. | ... ගම්බද උසාවිය, වන්කානෙයි |
| බෝගමුව, එස්. ජේ. | ... ප්‍රාදේශීය ආදයම් නිලධාරි කාර්යාලය, මහව |
| මල්ලව ආරච්චි, කේ. | ... ප්‍රාදේශීය ආදයම් නිලධාරි කාර්යාලය, අගලවත්ත |
| මාර්ටින්, කේ. ඒ. | ... ප්‍රාදේශීය ආදයම් නිලධාරි කාර්යාලය, දෙහිඕවිට |
| මාරසිංහ, ඩී. පී. ඊ. | ... ඉඩම් ලියාපදිංචි කිරීමේ සහ දිස්ත්‍රික් ලේකම්, කාර්යාලය, කෑගල්ල |
| මුණසිංහ, එම්. පී. | ... ප්‍රාදේශීය ආදයම් නිලධාරි කාර්යාලය, අනුරාධපුරය |
| මුනිදස, කේ. ජී. ... | ... ප්‍රාදේශීය ආදයම් නිලධාරි කාර්යාලය, හක්මන |
| මොහොමඩ් නිලාෆ්ප්, ඒ. සී. එම්. | ... සංඛ්‍යා ලේඛන ශාඛාව, ප්‍රධාන ගණකාධිකාරි කාර්යාලය, ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව, කොළඹ 10 |
| යාපා, ජේ. ... | ... ස්වදේශ කටයුතු භාර අමාත්‍යාංශය, කොළඹ 7 |
| රණවක, ආර්. ඒ. එස්. | ... ග්‍රාම සංවර්ධනය හා ගෘහ කර්මාන්ත පිළිබඳ දෙපාර්තමේන්තුව, කොළඹ |
| රණසිංහ, එස්. ඒ. | ... පළාත් පාලන කාර්යාලය, බදුල්ල |
| රණසිංහ, ඩබ්ලිව්. එම්. | ... ප්‍රාදේශීය ආදයම් නිලධාරි කාර්යාලය, කුලියපිටිය |
| රණසිංහ, ඩී. ... | ... දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලය, කොළඹ |
| රත්නායක, ආර්. එම්. යූ. බී. | ... ප්‍රාදේශීය ආදයම් නිලධාරි කාර්යාලය, කුලියපිටිය |
| රත්නායක, ඩී. බී. | ... ප්‍රාදේශීය ආදයම් නිලධාරි කාර්යාලය, කුලියපිටිය |
| රත්නායක, පී. ... | ... තෙලිජ්ජවිල මධ්‍ය මහා විද්‍යාලය, තෙලිජ්ජවිල |
| රන් බංඩා, එච්. එම්. | ... ප්‍රාදේශීය ආදයම් නිලධාරි කාර්යාලය, අනුරාධපුරය |
| රාජපක්ෂ, ආර්. පී. සී. | ... ප්‍රාදේශීය ආදයම් නිලධාරි කාර්යාලය, කඳාන |
| රාජපක්ෂ, එස්. ... | ... ප්‍රාදේශීය ආදයම් නිලධාරි කාර්යාලය, ඉපලෝගම |
| රාජපක්ෂ, ටී. බී. ... | ... ඉඩම් සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කුරුණෑගල |
| රාජරත්න, එම්. ... | ... ජී. එස්. ශාඛාව, අධ්‍යාපන කාර්යාලය බ.ප., කොළඹ 3 |
| රාජවෙද, ඩී. සී. බී. | ... ප්‍රාදේශීය ආදයම් නිලධාරි කාර්යාලය, කලවාන |
| රුද්‍රිගු, ජී. පී. ... | ... වාරිමාර්ග දෙපාර්තමේන්තුව, කොළඹ 1 |
| ලියනගේ, ජී. එල්. එල්. | ... කේ. එස්. ශාඛාව, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, කොළඹ 2 |
| වරුසවිතාන, එල්. ඩී. | ... දේශීය ආදයම් දෙපාර්තමේන්තුව |
| වැන්ද බෝනා, ටී. ඒ. | ... ප්‍රාදේශීය ආදයම් නිලධාරි කාර්යාලය, බෙන්තොට |
| වැන්ද බෝනා, සී. | ... ප්‍රාදේශීය ආදයම් නිලධාරි කාර්යාලය, ඇල්පිටිය |
| වැලිකල, ඩී. බී. | ... ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලය, කොළඹ 7 |
| වික්‍රමසිංහ, ඩබ්ලිව්. එම්. එස්. එන්. | විදුලි කර්මාන්ත අධිකාරිතැනගේ කාර්යාලය, තැ. පෙ. නො. 1076, කොළඹ |

| නම | | ලිපිනය |
|---|---|---|
| වික්‍රමසිංහ, පී. වී. | ... | ප්‍රධාන දුම්රිය ගණකාධිකාරිතැනගේ කායර්‍යාලය, මරදන |
| වික්‍රමසේකර, ජේ. එන්. එස්. | ... | පෝට් කොමිෂන් දෙපාර්තමේන්තුව, කොළඹ 1 |
| වික්‍රමසේන, යූ. කේ. | ... | ප්‍රාදේශීය ආදයම් නිලධාරි කායර්‍යාලය, බද්දේගම |
| වික්‍රමාරච්චි, ඩී. කේ. | ... | විභාග දෙපාර්තමේන්තුව, කොළඹ 2 |
| විජේමාන්න, ආර්. ඒ. | ... | ඉඩම් සහ දිස්ත්‍රික් ලේකම් කායර්‍යාලය රත්නපුර |
| විජේරත්න, ඩී. ජී, | ... | ප්‍රාදේශීය ආදයම් නිලධාරි කායර්‍යාලය, මාවනැල්ල |
| විජේසුන්දර, එස්. | ... | කච්චේරිය, පොළොන්නරුව |
| විජේසූරිය, ඩී. ඩී.... | ... | පළාත් පාලන කායර්‍යාලය, 610, කොල්ලුපිටිය |
| වින්සන්ට්, ජේ. | ... | මූලික කාර්මික අභ්‍යාස ආයතනය, රත්මලාන |
| විමලසුරේන්ද්‍රන්, කේ. | ... | විදුලි කර්මාන්ත දෙපාර්තමේන්තුව, තැ. පෙ. අංක 540, කොළඹ 10 |
| විල්මට්, එච්. ඩී. ... | ... | ජී. එස්. ශාඛාව, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, කොළඹ 2 |
| සමරනායක, එස්. එම්. එස්. | ... | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙනිය |
| සමරවික්‍රම, ටී. ඩබ්ලිව්. ඩබ්ලිව්. | ... | ඉඩම් ලේකම් කයර්‍යාලය, කෑගල්ල |
| සමරවීර, එස්. එම්. ඩී. ටී. පී. | ... | ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව |
| සමරසේකර, එන්. ඩී. | ... | අග්‍රාමාත්‍යතුමාගේ කායර්‍යාලය, කොළඹ 1 |
| සයිමන්, ඊ. ජී. ... | ... | වාරිමාර්ග කායර්‍යාලය, තංගල්ල |
| සවනදස, ඩබ්ලිව්. ඩී. | ... | කම්කරු විනිශ්චය සභාව, 167, ස්ටැෆ්ඩ් පෙදෙස, කොළඹ |
| සිත්නතුරෙයි, එම්. | ... | විභාග දෙපාර්තමේන්තුව, කොළඹ 2 |
| සිම්යොන්. එච්. ඩී. | ... | තක්සේරු දෙපාර්තමේන්තුව, කොළඹ 7 |
| සිරිවර්දන, කේ.ඩී. එස්. | ... | ප්‍රාදේශීය ආදයම් නිලධාරි කායර්‍යාලය, අගලවත්ත |
| සිරිවර්ධන, ඩී. ඊ. එම්. | ... | වැන්දඹු සහ අනාථදරු විශ්‍රාම වැටුප් අරමුදල් කායර්‍යාලය, කොළඹ 1 |
| සිරිසේන, එච්. ඩී. | ... | ඉඩම් සහ දිස්ත්‍රික් ලේකම් කායර්‍යාලය රත්නපුර |
| සිරිසේන, කේ. ඒ. | ... | කච්චේරිය, මහනුවර . |
| සිරිසේන, කේ. පී. | ... | දිස්ත්‍රික් රෙජිස්ත්‍රාර් කායර්‍යාලය, රත්නපුර |
| සිවලිංගම්, කේ. ... | ... | යා/මධ්‍ය මහා විද්‍යාලය, වසවිලන් |
| සුගතදස, එස්. ... | ... | රෙජිස්ත්‍රාර් ජනරාල් කායර්‍යාලය, කොළඹ |
| සුගතදස, ජී. පී. ... | ... | ප්‍රාදේශීය ආදයම් නිලධාරි කායර්‍යාලය, හක්මන |
| සුගතපාල, එස්. ඒ. | ... | අධ්‍යාපන කායර්‍යාලය, රත්නපුර |
| සුදුබංඩා, කේ. ... | ... | ප්‍රාදේශීය ආදයම් නිලධාරි කායර්‍යාලය, බුත්තල |
| සුමනදස, ඒ. ... | ... | ඉඩම් හා දිස්ත්‍රික් ලේකම් කායර්‍යාලය, ගම්පහ |
| සුමනදස, ජී. එම්. | ... | ප්‍රාදේශීය ආදයම් නිලධාරි කායර්‍යාලය, නෙලුන්දෙනිය |
| සුමනරත්න, ඩබ්ලිව්. එම්. | ... | ඉඩම් සහ දිස්ත්‍රික් ලේකම් කායර්‍යාලය, කෑගල්ල |
| සෙනරත් බංඩාර, ඒ. ඒ. | ... | ප්‍රාදේශීය ආදයම් නිලධාරි කායර්‍යාලය, ඊරියගම, පේරාදෙනිය |
| සෙනෙවිරත්න, එම්. එම්. | ... | උඩහේවාහැට ප්‍රාදේශීය ආදයම් නිලධාරි කායර්‍යාලය, හඟුරන්කෙත |
| සෙල්වදුරෙයි, ඩබ්ලිව්. එස්. | ... | ෆිපර්න්හැම් පාසල, අච්චුවෙලි |
| සේනාධීර, ඩබ්ලිව්. | ... | දිස්ත්‍රික් කායර්‍යාලය, ග්‍රාම සංවර්ධනය හා ගෘහ කර්මාන්ත දෙපාර්තමේන්තුව, කච්චේරිය, කොළඹ |
| සේනාරත්න, පී. ජේ. | ... | ප්‍රාදේශීය ආදයම් නිලධාරි කායර්‍යාලය, ඇල්පිටිය |
| සේනාරත්න, වයි. ඒ. ඩී. | ... | ප්‍රාදේශීය රෙජිස්ත්‍රාර් කායර්‍යාලය, කොළඹ |
| සේපාල, එම්. ඒ. ... | ... | ප්‍රාදේශීය ආදයම් නිලධාරි කායර්‍යාලය, මීගමුව |
| සොලමන්, ඒ. ඩබ්ලිව්. ඒ. | ... | ප්‍රාදේශීය ආදයම් නිලධාරි කායර්‍යාලය, මිරිස්වත්ත, මුදුන්ගොඩ |
| සෝමතිලක, යූ. කේ. | ... | කම්කරු දෙපාර්තමේන්තුව, කොළඹ 2 |
| සෝමදස, ඩී. එම්. | ... | පළාත් පාලන කායර්‍යාලය, මාතලේ |
| සෝමරත්න, ඒ. ඩබ්ලිව්. | ... | ප්‍රාදේශීය ආදයම් නිලධාරි කායර්‍යාලය, මාලිම්බඩ, පාලටුව |
| හරිස්චන්ද්‍ර, ඒ. ඩී. එස්. | ... | රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, රීඩ් මාවත, කොළඹ |
| හෙට්ටිආරච්චි, එස්. | ... | වාරිමාර්ග දෙපාර්තමේන්තුව, කොළඹ |
| හෙට්ටිගේ, ඒ. ... | ... | ප්‍රාදේශීය ආදයම් නිලධාරි කායර්‍යාලය, හක්මන |
| හේමදස, ආර්. ... | ... | රබර් පාලක කායර්‍යාලය, කොළඹ |
| හේරත්, සී. එච්. එම්. ඩී. බී. | ... | ප්‍රාදේශීය ආදයම් නිලධාරි කායර්‍යාලය, මහව |
| හේවාපතිරන, ඒ. | ... | ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව, කොළඹ |

හ. ඒ. පිරිස්,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.

වර්ෂ 1960ක්වූ ජූලි මස 11 වැනි දින,
කොළඹ, මහා
භාණ්ඩාගාරයේ දීය.

---

භාණ්ඩාගාරයේ අංකය : 1/83/9 (ජී).

### ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියට අයත් ලඝු ලේඛකයන්ගේ කායර්‍යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (ඉංග්‍රීසි)—1960 වේ ජනවාරි

වර්ෂ 1960 ක් වූ අප්‍රේල් මස 8 වැනි දින හා අංක 12,102 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද වර්ෂ 1960 ක් වූ අප්‍රේල් මස 4 වැනි දින දරණ නිවේදනය හා සම්බන්ධයි. වර්ෂ 1960 ක් වූ ජනවාරි මස 9 වැනි දින පවත්වනු ලැබූ ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියට අයත් ලඝු ලේඛකයන්ගේ වාර්ෂික වේතනය රුපියල් 2,940ක් වීමට පෙර කායර්‍යක්ෂමතා කඩඉමෙන් සාමාර්ථය ලැබීමට සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයේදී පහත සඳහන් ලඝු ලේඛකයා ද ඔහුගේ නම ඉදිරියෙන් සඳහන් කොට ඇති විෂයයන්ගෙන් සමර්ථ වී ඇති බැව් මෙයින් දන්වමි :—

| නම | | දෙපාර්තමේන්තුව | විෂයයන් |
|---|---|---|---|
| තිසේරා ඒ. ඈම් | ... | රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය | ... රචනය හා සිංහල |

හ. ඒ. පිරිස්,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.

වර්ෂ 1960 ක් වූ ජූලි මස 8 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය.

---

භාණ්ඩාගාරයේ අංකය : 1/83/7 (ජී).

### ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියට අයත් ලඝු ලේඛකයන්ගේ කායර්‍යක්ෂමතා කඩඉම් පරීක්ෂණය—(ඉංග්‍රීසි)

වර්ෂ 1960 ක් වූ අප්‍රේල් මස 1 වැනි දින හා අංක 12,099 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද වර්ෂ 1960 ක් වූ මාර්තු මස 28 වැනි දින දරණ නිවේදනය හා සම්බන්ධයි. ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියට අයත් ලඝු ලේඛකයන්ගේ වාර්ෂික වේතනය රුපියල් 2,940ක් වීමට පෙර කායර්‍යක්ෂමතා කඩඉමෙන් සාමාර්ථය ලැබීමට සුදුසුකම් ලැබීමේ පරීක්ෂණය සම්බන්ධයෙන් වර්ෂ 1959 ක් වූ නොවැම්බර් මස 17 වැනි දින පවත්වනු ලැබූ සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයෙන් පහත සඳහන් ලඝු ලේඛකයා ද සමර්ථ වී ඇති බැව් මෙයින් දන්වමි. ඔහු යථොක්ත කායර්‍යක්ෂමතා කඩඉමෙන් සාමාර්ථය ලැබීමට දැන් සුදුසුකම් ලබා ඇත :—

| නම | | දෙපාර්තමේන්තුව |
|---|---|---|
| විජේදස, කේ. ජී. | ... | රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය |

හ. ඒ. පිරිස්,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් වෙනුවට ය.

වර්ෂ 1950 ක් වූ ජූලි මස 8 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය.

---

භාණ්ඩාගාරයේ අංකය : 1/83/7 (ජී).

### ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියට අයත් ලඝු ලේඛකයන්ගේ කායර්‍යක්ෂමතා කඩඉම් පරීක්ෂණය—(සිංහල)

වර්ෂ 1960 ක් වූ අප්‍රේල් මස 1 වැනි දින හා අංක 12,099 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද වර්ෂ 1960 ක් වූ මාර්තු මස 28 වැනි දින දරණ නිවේදනය හා සම්බන්ධයි. ස්ථාන මාරුව සහිත

ලිපි ලේඛක සේවයේ පහළ ශ්‍රේණියට අයත් ලිපි ලේඛකයන්ගේ වාර්ෂික වේතනය රුපියල් 2,940ක් වීමට පෙර කාර්යක්ෂමතා කඩ ඉමෙන් සාමාර්ථය ලැබීමට සුදුසුකම් ලැබීමේ පරීක්ෂණය සම්බන්ධයෙන් වර්ෂ 1959 ක් වූ නොවැම්බර මස 21 වැනි දින පවත්වනු ලැබූ සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයෙන් පහත සඳහන් ලිපි ලේඛකයා ද සමර්ථ වී ඇති බැව් මෙයින් දන්වමි. ඔහු යථෝක්ත කාර්යක්ෂමතා කඩඉමෙන් සාමාර්ථය ලැබීමට දැන් සුදුසුකම් ලබා ඇත :—

| නම | | දෙපාර්තමේන්තුව |
|---|---|---|
| විජයදාස, පී. ටී. | ... | රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ |

හ. ඒ. පීරිස්,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.

1960 ජූලි මස 8 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය.

---

# ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ්ඩාගාරයේ 270 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය : තැ. පෙ. 500, කොළඹ 1), 1960.10.1 සිට 1961.3.31 තෙක් ගංවැලි, ළුණු ගස් සහ කළු ගල් සැපයීම සඳහා 1960 අගෝස්තු 9 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

ටෙන්ඩර් විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ පාසන්ස් පාරේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැනගෙන් ෆෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 50 ක් ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළවිට 1960 අගෝස්තු 8 වැනි සඳුදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

ලූ. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරී.

1960 ජූලි 15 වැනි දින,
කොළඹදීය.

---

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ්ඩාගාරයේ 270 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය : තැ. පෙ. 500, කොළඹ 1) 1960 ඔක්තෝබර් 1 වැනි දින සිට 1961 සැප්තැම්බර් 30 වැනිදා දක්වා පහත සඳහන් සේවයන් සඳහා 1960 අගෝස්තු 2 අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ :—

**සේවය**

(1) කපු පුළුන් සැපයීම.
(2) සිමෙන්ති කොන්ක්‍රීට් පයිප්ප සැපයීම.

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර් කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ පාර්සන්ස් පාරේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැනගෙන් ෆෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුයි.

එක් එක් සේවය සම්බන්ධයෙන් රුපියල් 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1960 අගෝස්තු 1 වැනි සඳුදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර ආණ්ඩුවේ ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබාගතහැක.

ලූ. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරී.

1960 ජූලි 15 වැනි දින,
කොළඹදීය.

---

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

### 1960-61 වර්ෂය තුළ පාන් සැපයීම

1960 ඔක්තෝබර් මස 1 වැනිදා සිට 1961 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා මෙහි පහත සඳහන් බන්ධනාගාරවලට පාන් සැපයීම සඳහා ලංකාවේ ලියාපදිංචි වූ හෝ පරම්පරාවෙන් ලාංකිකයන්වූ අය ගෙන් එම උපලේඛනයෙහි සඳහන් දිනවල පෙරවරු 10.30 දක්වා බන්ධනාගාර අධිකාරීන් විසින් ටෙන්ඩර් භාරගනු ලැබේ. ටෙන්ඩර් කියවා මිනිත්තු පහකට පසු එනම් පෙරවරු 10.35 ටෙන්ඩර් විවෘත කරනු ලබනවා ඇත. ඒ වේලාවේදී එහි පෙනී සිටීමට ටෙන්ඩර්කරුවනට අවසර දෙනු ලැබේ.

2. ටෙන්ඩර්කරුවන්, ද්‍රව්‍ය සැපයීම සඳහා මිළ ගණන් ඉදිරිපත් කිරීමේදී ඉලක්කමින් මෙන්ම වචනයෙන් ද ඒවා සඳහන් කළයුතුව ඇත. ඉලක්කමින් සඳහන් කොට ඇති මිළ ගණන් වචනයෙන් සඳහන් කිරීමේදී අසමානත්වයක් ඇති වී තිබුණහොත් හෝ මිළ ගණන් වචනයෙන් සඳහන් වී නොමැති නම් හෝ එබඳු ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමට ඉඩ ඇත්තේ ය.

3. සැපැයීම පිළිබඳ විස්තර පහත සඳහන් ප්‍රකාරය :—

සපයනු ලබන පාන් වඩා පරණ නොවිය යුතුයි. එමෙන්ම හරි හැටියට නොතැම්බුණ ඒවා ද නොවිය යුතුයි: අවුන්ස 6 ප්‍රමාණයක හෝ ඉල්ලුම් කරනු ලබන අන්‍ය පහසු ප්‍රමාණයක හෝ පාන් ගෙඩි වශයෙන් සැපැයිය යුත්තේ ය.

4. සියලුම ටැන්ඩර් පත්‍ර අනු පිටපතක් සහිතව ලියුම් කවරයක බහා සීල් තබා නියමිත බන්ධනාගාර අධිකාරීන් වෙත ලියා පදිංචි කරන ලද තැපැලෙන් එවිය යුතුයි. එසේ තැපැලෙන් නො යවනු ලබන ටෙන්ඩර් පත්‍ර නියමිත අධිකාරී තැනට හෝ ඔහු විසින් පත් කරනු ලබන බලය ලත් නියෝජිතයෙකු වෙත් නම් ඔහුට හෝ භාර දී ඒ භාර ගත් බවට ලියවිල්ලක් ලබාගත යුතුයි.

5. ටෙන්ඩර් පත්‍ර බහා ලූ කවරයේ වම් පැත්තේ උඩ කෙළවරේ "1960-61 අවුරුද්ද තුළ..........................ට පාන් සැපයීම සඳහා ටෙන්ඩරය" යැයි ලියා මෙහි 1 වැනි ඡේදයේ හා උපලේඛනයේ සඳහන් වේලාවට ප්‍රථම නියමිත අධිකාරී තැනට ලැබිය යුතු සේ එවිය යුතුයි.

6. ටෙන්ඩර් සඳහා නියමිත ෆෝර්ම ඒ ඒ ආයතන භාර අධිකාරි වරුන්ගේ කාර්යාලවලින් ලබාගත හැකිය. නියමිත ෆෝර්මයේ ලියා නැති ටෙන්ඩර් භාරගනු නොලැබේ.

7. ටෙන්ඩර් පියවා මාස තුනක් (3) යනතුරු, ටෙන්ඩර්කරුවන් විසින් තමන්ගේ ටෙන්ඩර් පත්‍ර සැළැකිල්ලට භාජන කිරීමට ඉඩ තැබිය යුතුයි.

8. ටෙන්ඩර්වල සියලුම වෙනස් කිරීම් හා මැකීම් වලට ටෙන්ඩර් කරුවන් විසින් තම කෙටි අත්සන යෙදිය යුතුයි.

9. මෙහි පහත සඳහන් පරිදි ටෙන්ඩර් පත්‍ර සඳහා තැන්පත් කළ යුතු මුදල් බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ හෝ (කොළඹ කච්චේරිය හැර) වෙන ඕනෑම කච්චේරියක තැන්පත් කොට ඒ බවට කුවිතාන්සි ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ෆෝර්ම ලබාගත හැක.

යමෙකුට ඔහුගේ ටෙන්ඩරය පිළිගත් බව ලියමනකින් දන්වනු ලැබීමෙන් දින 10ක් ඇතුළතදී අවශ්‍ය ඇප මුදල් ඉදිරිපත් කිරීමට නුපුළුවන් විනි නම් හෝ එසේ කිරීමෙන් වැළැකී සිටී නම් හෝ තැන්පත් කරන ලද මුදල් රාජ සන්තක වෙනවා ඇත. ඉන්පසු රජය සම්බන්ධ කවර කොන්ත්‍රාත්තුවකට හෝ බැඳීමට නොහැකි වන සේ ඔහුගේ නාම කොන්ත්‍රාත්තු කඩකරන්නන්ගේ නාම ලේඛනයට ඇතුළත් කරනවා ඇත. තවද, කොන්ත්‍රාත්තුව කඩකිරීමේ අලාභ වශයෙන් ලංකාවේ වලංගු මුදලෙන් ඒ ඒ කොන්ත්‍රාත්තුවට තබා ඇති ඇප මුදලට සමාන මුදලක් රජය වෙනුවෙන්, බන්ධනාගාර කොමසාරිස්වරයාට ගෙවීමට එම ටෙන්ඩර් කරුවනට සිදුවෙනවා ඇත. මෙම මුදල අලාභ වශයෙන් නීති මාර්ගයෙන් අය කර ගැනීමේ බලය බන්ධනාගාර කොමසාරිස්වරයා වෙත පැවැරී ඇත.

ටෙන්ඩරය පිළිගත් බව දන්වන නිවේදනය ටෙන්ඩර්කරු විසින් දෙනු ලබන ලිපිනයට තැපැලෙන් යවනු ලැබුවහොත් හෝ නො එසේව එහි ගෙන ගොස් භාර දුනහොත් හෝ එම නිවේදනය ටෙන්ඩර්කරුවා වෙත ලැබුණු ලෙස සලකනු ලැබේ. අන්‍ය සියලු තැන්පත් මුදල් කොන්ත්‍රාත්තුවට අත්සන් තැබීමෙන් පසු ආපසු ගෙවනු ලැබේ.

උප ලේඛනයේ සඳහන් පරිදි ඒ ඒ කොන්ත්‍රාත්තුව සඳහා වෙන් වෙන් වශයෙන් ඇප මුදල් තැන්පත් කිරීමේ අවශ්‍යතාවය කෙරෙහි සියලුම ටෙන්ඩර්කරුවන්ගේ සැළැකිල්ල යොමු කරවනු ලැබේ.

10. සාර්ථක වූ ටෙන්ඩර්කරුවන් තම කොන්ත්‍රාත්තුව මනා අන්දමින් ඉටු කරන බවට ඇපකරුවන් වශයෙන් ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට කැමැති වග කිව යුතු පුද්ගලයින් දෙදෙනෙකුගේ නම් ඉදිරිපත් කළ යුතුයි. මේ කොන්ත්‍රාත්තුව ගෙන යාමේදී කොන්ත්‍රාත් කරුවන් විසින් වැඩෙහි යෙදවිය යුත්තේ ලාංකිකයන් පමණකි.

11. සේවාව නිසියාකාර ඉටු කිරීමේදී දත යුතු සියලුම අවශ්‍ය කරුණු උපලේඛනයෙහි සඳහන් අධිකාරිවරුන්ගෙන් දැනගත හැක.

12. ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින බන්ධනාගාර කොමසාරිස් වරයා සමග කොන්ත්‍රාත්තුවට අත්සන් තැබිය යුතුයි. එබඳු නිලධාරි යෙකු ගේ පදවි නාමයෙන් අදහස් කළ යුත්තේ ද ගිණිය යුත්තේද, ලංකාණ්ඩුව යටතේ දැනට එම පදවිය දරන්නාවූ නිලධාරියාද, ඔහුට පසුව එම පදවිය දරන්නාවූ නිලධාරියා ද වේ.

ව. නා. පිල්ලේ,
බන්ධනාගාර කොමසාරිස්.

1960.7.15,
කොළඹ 9,
බන්ධනාගාර මූලස්ථානයේ දීය.

උපලේඛනය

| බන්ධනාගාරය | ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල රු. ශ. | ඇප මුදල රු. ශ. | ටෙන්ඩර් භාර ගන්නා නිලධාරි තැන |
|---|---|---|---|
| අනුරාධපුරය ... | 25 0 ... | 200 0 ... | අනුරාධපුරේ උප බන්ධනාගාර අධිකාරි |
| බදුල්ල ... | 25 0 ... | 200 0 ... | බදුල්ලේ උප බන්ධනාගාර අධිකාරි |
| මඩකලපුව ... | 25 0 ... | 200 0 ... | මඩකලපුව බන්ධනාගාර උප අධිකාරි |
| ගාල්ල ... | 25 0 ... | 200 0 ... | ගාල්ල බන්ධනාගාර උප අධිකාරි |
| එළිමහන් සිර කඳවුර කුණ්ඩසාලේ ... | 25 0 ... | 200 0 ... | කුණ්ඩසාලේ බන්ධනාගාර උප අධිකාරි |
| මාතර ... | 25 0 ... | 200 0 ... | මාතර බන්ධනාගාර උප අධිකාරි |
| කෑගල්ල ... | 25 0 ... | 200 0 ... | මාතර බන්ධනාගාර උප අධිකාරි |
| මීගමුවේ තරුණ වරද කරුවන්ගේ අභ්‍යාස විද්‍යාලය ... | 25 0 ... | 200 0 ... | මීගමුවේ තරුණ වරද කරුවන්ගේ අභ්‍යාස විද්‍යාල අධිකාරි |

ටෙන්ඩර් පියවන දිනය : 1960.8.9

---

## වර්‍ෂ 1960.8.1 දින සිට 1961.9.30 වැනි දින දක්වා යාපනයේ බන්ධනාගාරයේ ඉතිරිවන කෑම සහ මුළුතැන්ගෙයි කුණුකසල මිළ දී ගැනීමයි

වර්ෂ 1960.8.1 වැනි දින සිට 1961.9.30 වැනි දින දක්වා යාපනයේ බන්ධනාගාරයේ ඉතිරිවන කෑම සහ මුළුතැන්ගෙයි කුණුකසල මිළ දී ගැනීම පිළිබඳ ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. දිනපතාම පස්වරු 3ට පෙර කුණුකසල රැගෙන ගිය යුතුයි.

3. සීල් තබන ලද කවරයක පිට පැත්තේ "ඉතිරිවන කෑම සහ මුළුතැන්ගෙයි කුණුකසල මිළ දී ගැනීම පිළිබඳ ටෙන්ඩර් පත්‍ර" යනුවෙන් සඳහන් කළ යුතුයි. යාපනයේ බන්ධනාගාරයේ වැඩබලන අධිකාරි තැන විසින් වර්‍ෂ 1960ක් වූ ජූලි 27 වෙනි දින පෙරවරු 9.30 වනතෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

4. ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලබන්නේ වර්‍ෂ 1960 ජූලි මස 27 වැනි බදාදා පෙරවරු 9.35ට යාපනයේ වැඩබලන බන්ධනාගාර අධිකාරි තැනගේ කාර්‍යාලයේදීය. ටෙන්ඩර් විවෘත කරනු ලබන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවනට එහි පෙනී සිටීමට අවසර දෙනු ලැබේ.

5. මේ පිළිබඳ වැඩි විස්තර යාපනයේ වැඩබලන බන්ධනාගාර අධිකාරි තැනගෙන් දැනගත හැකිය.

බී. ජේ. ඇස්. ද ඉසැඩ් ආඩිහෙට්ටි,
වැඩබලන බන්ධනාගාර අධිකාරි.

1960 ජූලි 15 වැනිදා,
යාපනයේ බන්ධනාගාරයේදීය.

---

## 1960-61 මුදල් වර්‍ෂය තුළ වැලිකඩ බන්ධනාගාරයේ කර්මාන්ත අංශයට අමු ද්‍රව්‍ය සැපයීම

වර්‍ෂ 1960 අගෝස්තු මස 5 වෙනි දින පෙරවරු 9.30 දක්වා පහත අත්සන් කරන අය විසින් 60-61 මුදල් වර්‍ෂය තුළ පහත දක්වෙන අමු ද්‍රව්‍යයන් වැලිකඩ බන්ධනාගාරයේ කර්මාන්ත අංශයට සැපයීම පිණිස ටෙන්ඩර් පත්‍ර බාරගනු ලැබේ.

| | | ටෙන්ඩර් පත්‍රය සඳහා තැන්පත් කළයුතු මුදල රු. ශ. | ඇප මුදල රු. ශ. |
|---|---|---|---|
| 1. | පැළලි සෑදීමට යෝග්‍ය බට ලී ... | 10 00 ... | 150 00 |
| 2. | තල් කෙඳි ... ... | 20 00 ... | 200 00 |
| 3. | ගව වල්ගා ලෝම ... ... | 10 00 ... | 100 00 |
| 4. | පැදුරු විවීම සඳහා "ගල් ඇහ" පන් ... | 10 00 ... | 100 00 |
| 5. | මීහරක් හම් ... ... | 20 00 ... | 150 00 |
| 6. | එළහරක් හම් ... ... | 20 00 ... | 200 00 |
| 7. | පදම් කළ හම් ... ... | 10 00 ... | 50 00 |
| 8. | "බොක්ස් කාෆ්" ... ... | 20 00 ... | 200 00 |
| 9. | බැටලු හම් ... ... | 20 00 ... | 150 00 |
| 10. | සම්පූර්ණ රබර් අඩි ප්‍රමාණය අඟල් 5 සිට 10 දක්වා සෑම ප්‍රමාණයකින්ම | 20 00 | 100 00 (10 සහ 11 සඳහා) |
| 11. | රබර් විලුම් ප්‍රමාණය අඟල් 2 5/6 සිට 4 දක්වා සෑම ප්‍රමාණයකින්ම ... | 20 00 | |

(ද්‍රව්‍ය සම්බන්ධයෙන් සැම්පලයන් වෙනම පහත අත්සන් කරන අයගේ කාර්යාලයට භාරදිය යුතුයි.)

2. කොළඹ බන්ධනාගාර කොමසාරිස් තැනගේ කාර්යාලයේ හෝ කොළඹින් පිට පළාත්වල නම් ඕනෑම කච්චේරියක හෝ නියමිත මුදල තැන්පත් කළ බවට කුවිතාන්සියක් පහත අත්සන් කරන අයට ඉදිරිපත් කිරීමෙන් මේ සඳහා නිකුත් කරන ටෙන්ඩර් ෆෝර්ම වර්‍ෂ 1960 අගෝස්තු මස 4 වෙනිදා පස්වරු 2 දක්වා ලබාගත හැක.

3. ටෙන්ඩර් පත්‍රයන් සීල් තැබූ කවරයන්හි බහා එහි වම් පස කෙළවරෙහි "............................සැපයීම සඳහා ටෙන්ඩරය" යනුවෙන් සඳහන් කොට ලියාපදිංචි කළ තැපෑලෙන් එවීම හෝ පහත අත්සන් කරන අයගේ කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ දැමීම හෝ කළ හැකිය.

4. නියම කරන ලද මිළ ගණන් ටෙන්ඩර් පත්‍රයන්හි අකුරෙන් හා ඉලක්කම් වලින් දක්විය යුතුය. එසේ අකුරෙන් හා ඉලක්කම් වලින් සඳහන් නොකළ ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ඉඩ ඇත. ටෙන්ඩර් පත්‍රයන් පිරවූවාට පසු කිසියම් වෙනස් කිරීම් හෝ අමුතු එක්කිරීම් ඇතුළත් කළහොත් ඒ බව ටෙන්ඩර්කරුවන් විසින්ම අත්සන යොදා සෑබෑ බව සහතික කළ යුතුය.

5. වර්‍ෂ 1960 අගෝස්තු මස 5 වෙනි දින පෙරවරු 10ට පහත අත්සන් කරන ලද අයගේ කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එහිදී ටෙන්ඩර්කරුවනට පෙනී සිටීමට පුළුවන.

6. ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩරයන් හේතු රහිතව ප්‍රතික්ෂේප කිරීමේ හා කොන්ත්‍රාත්තුවක් ඕනෑම අවස්ථාවක නවතාලීමේ සම්පූර්ණ අයිතිය බන්ධනාගාර කර්මාන්ත අධිකාරිවරයා වෙත පැවැරී ඇත.

7. කොන්ත්‍රාත්තුව ලබා ගැනීමට හැකිවූ කොන්ත්‍රාත්කරු ඒ බව දක්වා එවූ දින සිට දින 10ක් ඇතුළතදී බන්ධනාගාර කර්මාන්ත අධිකාරීන් සමග ගිවිසුම් පතකට අත්සන් තැබිය යුතුයි.

8. වැඩි විස්තර දැනගැනීමට පහත අත්සන් කරන අයගෙන් විමසනු මැනැවි.

ජේ. ඒ. පෙරුමාල්,
බන්ධනාගාර කර්මාන්ත අධිකාරි.

1960 ජූලි 15 වැනිදා,
කොළඹ 9,
බන්ධනාගාර මූලස්ථානයේ දී ය.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

මොනරාගල උප කොට්ඨාශයේ මහ වැව ව්‍යාපාරය ඉදිකිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ, මහලේකම් ගොඩනැගිල්ලේ, 355 වැනි කාමරයෙහි වූ, කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ අමාත්‍යාංශයේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1960 අගෝස්තු මස 30 වන දා (අඟහරුවාදා) පෙරවරු 10 වන තෙක් භාරගනු ලැබේ.

වාරිමාර්ග හෝ දුම්රිය හෝ පොදු වැඩ දෙපාර්තමේන්තුවේ හෝ රු. 85,000 කට නො අඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් මේ කාර්යය සඳහා ඉල්ලුම් කළ හැක. බන්ඩාරවෙල, ඌව කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ෆෝර්ම කොළ ලබා ගෙන, ටෙන්ඩර් පත්‍ර ලියා, අනු පිටපතක් ද සහිතව එවිය යුතු. ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රු. 100 ක් කච්චේරියක හෝ මොනරාගල වාරිමාර්ග කාර්යාලයේ හෝ බැඳ, ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කරන අයට, 1960 අගෝස්තු මස 26

වන සිකුරාදා දක්වා, කාර්යාල වේලාවන් තුළ දී ටෙන්ඩර් පෝර්ම කොළ ලබා ගතහැක.

වැඩි විස්තර බණ්ඩාරවෙල, ප්‍රාදේශීය වාරිමාර්ග කාර්යාලයයෙන් ලබා ගත හැක.

බා. සෙල්ලහේවා,
වාරිමාර්ග අධ්‍යක්ෂ වෙනුවට.

1960 ජූනි 28 දා
කොළඹ.

---

රු. 25,000 කට හෝ ඊට වැඩි ගණනකට වාරිමාගී දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී සිටින කොන්ත්‍රාත් කරුවන්ගෙන් 1960 අගෝස්තු 9 වැනි දින උදේ 11.30 වනතෙක් කොළඹ 8, කොටාරෝඩ්හි බස්නාහිර කොට්ඨාශය භාර ප්‍රදේශීය වාරිමාගී ඉංජිනේරු තැන විසින් කිඹුල පිපිය අමුන සෑදීම සඳහා මුද්‍රා තැබූ ටැන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

ටැන්ඩර් පත්‍ර එවිය යුත්තේ අනු පිටපතක් සමගය. ආකෘති පත්‍ර කොළඹ 9යේ වේලුවන පාරේ පිහිටි කොළඹ උප ප්‍රාදේශීය වාරිමාගී ඉංජිනේරුතැනගේ කායඝාලයේදී ලබාගත හැක. වැඩි විස්තර හා සැලැස්ම එම කායඝාළයේදී බලාගත හැක.

ටැන්ඩර් පත්‍ර නිකුත් කරනු ලබනුයේ 1960. 8. 6 වන තෙක් පමණි. එසේ ආකෘති පත්‍ර නිකුත් කරනු ලබන්නේ කොළඹ 9 වේලුවන පාරේ පිහිටි කොළඹ උප ප්‍රාදේශීය වාරිමාගී ඉංජිනේරු කායඝාලයේ දී හෝ ඕනෑම කච්චේරියකදී හෝ ටැන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රු. 25 ක මුදලක් තැන්පත් කළ බවට කුවිතාන්සි ඉදිරිපත් කරන සුදුස්සන්ට පමණි.

දැනට ආණ්ඩුවේ කොන්ත්‍රාත් ලබා සිටින ටැන්ඩර් කරුවන් එම වැඩය සතුටුදායක අන්දමින් කරගෙන යන බවට එම වැඩ භාර නිලධාරියාගෙන් ලබාගත් සහතිකයක් ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුයි.

ඕනෑම ටෙන්ඩරයක ඕනෑම කොටසක් පිළිගැනීමේ හෝ සියලුම ටැන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමේ හෝ බලය රජය සතුය.

ප්‍රා. ඇ. ලෝබෝ,
කොළඹ උප ප්‍රාදේශීය වාරිමාගී ඉංජිනේරු තැන.

උප ප්‍රාදේශීය වාරිමාගී කායඝාලය,
වෙලුවනා පාර,
කොළඹ 9.

---

රු. 12,000 කට හෝ ඊට වැඩි ගණනකට වාරිමාගී දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී සිටින කොන්ත්‍රාත් කරුවන්ගෙන් 1960 අගෝස්තු 9 වැනි උදේ 11.30 වනතෙක් කොළඹ 8, කොටාරෝඩ්හි බස්නාහිර කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් කුරුගලේ ලියන්විල අමුන සෑදීම සඳහා මුද්‍රා තැබූ ටැන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

ටැන්ඩර් පත්‍ර එවිය යුත්තේ අනු පිටපතක් සමගය. ආකෘති පත්‍ර කොළඹ 9යේ වේලුවන පාරේ පිහිටි කොළඹ උප ප්‍රාදේශීය වාරිමාගී ඉංජිනේරුතැනගේ කායඝාලයෙන් ලබා ගත හැක. වැඩි විස්තර හා සැලැස්ම එම කායඝාලයේදී බලාගත හැක.

ටැන්ඩර් පත්‍ර නිකුත් කරනු ලබනුයේ 1960. 8. 6 වන තෙක් පමණි. එසේ ආකෘති පත්‍ර නිකුත් කරනු ලබන්නේ කොළඹ 9 වේලුවන පාරේ පිහිටි කොළඹ උප ප්‍රාදේශීය වාරිමාගී ඉංජිනේරු කායඝාලයේදී හෝ ඕනෑම කච්චේරියකදී හෝ ටැන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රු. 25 ක මුදලක් තැන්පත් කළ බවට කුවිතාන්සි ඉදිරිපත් කරන සුදුස්සන්ට පමණි.

දැනට ආණ්ඩුවේ කොන්ත්‍රාත් ලබා සිටින ටැන්ඩර් කරුවන් එම වැඩය සතුටුදායක අන්දමින් කරගෙන යන බවට එම වැඩ භාර නිලධාරියාගෙන් ලබාගත් සහතිකයක් ඉල්ලුම් පත්‍රයත් සමග ඉදිරිපත් කළ යුතුයි.

ඕනෑම ටෙන්ඩරයක ඕනෑම කොටසක් පිළිගැනීමේ හෝ සියලුම ටැන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමේ හෝ බලය රජය සතුය.

ප්‍රා. ඇ. ලෝබෝ,
කොළඹ උප ප්‍රාදේශීය වාරිමාගී ඉංජිනේරු තැන.

උප ප්‍රාදේශීය වාරිමාර්ග කායඝාලය,
වෙලුවනා පාර,
කොළඹ 9.

---

රු. 25,000 කට හෝ ඊට වැඩි ගණනකට වාරිමාගී දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී සිටින කොන්ත්‍රාත් කරුවන්ගෙන් 1960 අගෝස්තු 9 වැනි දින උදේ 11.30 වනතෙක් කොළඹ 8, කොටාරෝඩ්හි බස්නාහිර කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාගී ඉංජිනේරු තැන විසින් බෝමිරිය ව්‍යාපාරය සෑදීම සඳහා මුද්‍රා තැබූ ටැන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

ටැන්ඩර් පත්‍ර එවිය යුත්තේ අනු පිටපතක් සමගය. ආකෘති පත්‍ර කොළඹ 9යේ වේලුවන පාරේ පිහිටි කොළඹ උප ප්‍රාදේශීය වාරිමාගී ඉංජිනේරුතැනගේ කායඝාලයෙන් ලබා ගත හැක. වැඩි විස්තර හා සැලැස්ම එම කායඝාලයේදී බලාගත හැක.

ටැන්ඩර් පත්‍ර නිකුත් කරනු ලබනුයේ 1960. 8. 6 වන තෙක් පමණි. එසේ ආකෘති පත්‍ර නිකුත් කරනු ලබන්නේ කොළඹ 9 වේලුවන පාරේ පිහිටි කොළඹ උප ප්‍රාදේශීය වාරිමාගී ඉංජිනේරු කායඝාලයේදී හෝ ඕනෑම කච්චේරියකදී හෝ ටැන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රු. 25 ක මුදලක් තැන්පත් කළ බවට කුවිතාන්සි ඉදිරිපත් කරන සුදුස්සන්ට පමණි.

දැනට ආණ්ඩුවේ කොන්ත්‍රාත් ලබා සිටින ටැන්ඩර් කරුවන් එම වැඩය සතුටුදායක අන්දමින් කරගෙන යන බවට එම වැඩ භාර නිලධාරියාගෙන් ලබාගත් සහතිකයක් ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුයි.

ඕනෑම ටෙන්ඩරයක ඕනෑම කොටසක් පිළිගැනීමේ හෝ සියලුම ටැන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමේ හෝ බලය රජය සතුය.

ප්‍රා. ඇ. ලෝබෝ,
කොළඹ උප ප්‍රාදේශීය වාරිමාගී ඉංජිනේරු තැන.

උප ප්‍රාදේශීය වාරිමාර්ග කායඝාලය,
වෙලුවනා පාර,
කොළඹ 9.

---

රු. 6,000 කට හෝ ඊට වැඩි ගණනකට වාරිමාගී දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිවී සිටින කොන්ත්‍රාත් කරුවන්ගෙන් 1960 අගෝස්තු 9 වැනි දින උදේ 11.30 වන තෙක් කොළඹ 8, කොටාරෝඩ්හි බස්නාහිර කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාගී ඉංජිනේරු තැන විසින් කලුඅග්ගල බූන්ඩිගම්පොල ව්‍යාපාරය සෑදීම සඳහා මුද්‍රා තැබූ ටැන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

ටැන්ඩර් පත්‍ර එවිය යුත්තේ අනු පිටපතක් සමගය. ආකෘති පත්‍ර කොළඹ 9යේ වේලුවන පාරේ පිහිටි කොළඹ උප ප්‍රාදේශීය වාරිමාගී ඉංජිනේරුතැනගේ කායඝාලයෙන් ලබා ගත හැක. වැඩි විස්තර හා සැලැස්ම එම කායඝාලයේදී බලාගත හැක.

ටැන්ඩර් පත්‍ර එවිය යුත්තේ අනු පිටපතක් සමගය. ආකෘති පත්‍ර පමණි. එසේ ආකෘති පත්‍ර නිකුත් කරනු ලබන්නේ කොළඹ 9 වේලුවන පාඨේ පිහිටි කොළඹ උප ප්‍රාදේශීය වාරිමාගී ඉංජිනේරු කායඝාලයේදී හෝ ඕනෑම කච්චේරියකදී හෝ ටැන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රු. 25 ක මුදලක් තැන්පත් කළ බවට කුවිතාන්සි ඉදිරිපත් කරන සුදුස්සන්ට පමණි.

දැනට ආණ්ඩුවේ කොන්ත්‍රාත් ලබා සිටින ටැන්ඩර් කරුවන් එම වැඩය සතුටුදායක අන්දමින් කරගෙන යන බවට එම වැඩ භාර නිලධාරියාගෙන් ලබාගත් සහතිකයක් ඉල්ලුම් පත්‍රයත් සමග ඉදිරිපත් කළ යුතුයි.

ඕනෑම ටෙන්ඩරයක ඕනෑම කොටසක් පිළිගැනීමේ හෝ සියලුම ටැන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමේ හෝ බලය රජය සතුය.

ප්‍රා. ඇ. ලෝබෝ,
කොළඹ උප ප්‍රාදේශීය වාරිමාගී ඉංජිනේරු තැන.

උප ප්‍රාදේශීය වාරිමාර්ග කායඝාලය,
වෙලුවනා පාර,
කොළඹ 9.

---

## වාරිමාගී දෙපාතීමේන්තුව

කොළඹ කොටා රෝඩ්හී බස්නාහිර කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරි මාගී ඉංජිනේරු තැන විසින් 1960 අගෝස්තු මස 2 වෙනි දින පෙරවරු 11.30 දක්වා කළුතර දිස්ත්‍රික්කයේ වඩුගම් ඇල අමුන සෑදීම සඳහා රු. 20,000 කට හෝ ඊට වැඩි ගණනකට වාරි මාගී දෙපාතීමේන්තුවේ ලියා පදිංචිවූ කොන්ත්‍රාත් කරුවන්ගෙන් සීල් තබන ලද ටැන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. කළුතර වාරි මාගී ඉංජිනේරු තැන විසින් 1960 ජූලි මස 26 වෙනි දින සිට ජූලි මස 29 වෙනි දින දක්වා ටැන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. ටැන්ඩර් පත්‍ර ලබා ගැනීමේදී රු. 25 ටැන්ඩර් තැන්පත් මුදලක් කච්චේරියක තැන්පත් කළ බවට රිසිට් පතක් හෝ වාරි මාගී අධ්‍යක්ෂක තුමා නමට රු. 25ක මුදල් ඕඩරයක් ඉදිරිපත් කළ යුතුයි.

3. ඕනෑම ටෙන්ඩරයක කොටසක් පිළිගැනීම හෝ සියලුම ටෙන්ඩර් ප්‍රතික්ෂෙප කිරීම රජය සතුය.

4. වැඩි විස්තර කළුතර වාරි මාගී ඉංජිනේරු තැනගෙන් විමසන්න.

ඊ. රණසිංහ,
කළුතර වාරි මාගී ඉංජිනේරු තැන.

වාරි මාගී කායඝාලය,
කළුතර, 8.7.60.

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

මහනුවර කොට්ඨාශය භාර ප්‍රාදේශික වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1960. 8. 10 වැනි දින පෙ. ව. 10 දක්වා මිණිපේ වාරිමාර්ග උප කොට්ඨාශයට අයත් පහත සඳහන් වැඩ සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ, පිළිවෙලින් රු. 18,500/- හා රු. 6,000/-කට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි කරන ලද කොන්ත්‍රාත් කරුවන් ගෙන් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. මෙම වැඩ දෙක සඳහා වෙන් වෙන්ව ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුයි.

(1) අඹගහපැලැස්සේ අස්ථිර නිවාස 4ක් ඉදිකිරීම.

(2) බෙදාහැරීමේ ඇල වල් සඳහා අඟල් 18ක් විෂ්කම්භය ඇති සොරොව් දොරටු 6ක් සැපයීම.

2. මිණිපේ වාරිමාර්ග ඉංජිනේරුතැනගෙන් ලබාගත හැකි ටෙන්ඩර් පත්‍රිකා පිටපත් දෙක බැගින් ඉදිරිපත් කළ යුතුය. මේ සම්බන්ධ සියලු විස්තර ලබාගත හැක්කේ ද එම කාර්යාලයෙනි.

3. දැනට රජයේ කොන්ත්‍රාත් වැඩ භාරව ක්‍රියා කරන අය විසින් එම වැඩවල ප්‍රමාණය ගැනද ඒවා සතුටුදායක අන්දමින් කරගෙන යන බවද සඳහන් වන සහතික පත්‍ර ඒ ඒ නිලධාරීන්ගෙන් ලබා ගෙන ටෙන්ඩර් පත්‍ර සමග ඉදිරිපත් කළ යුතුයි.

4. මිණිපේ වාරිමාර්ග කාර්යාලයේ හෝ කච්චේරියේ මේ සඳහා රු. 25/- බැගින් තැන්පත්කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ කොන්ත්‍රාත්කරුවන්ට 1960. 7. 18 වෙනි දින සිට 1960. 8. 5 වෙනි දින දක්වා ඇති රාජකාරියට නියමිත දවස් සහ වේලාවලදී මිණිපේ වාරිමාර්ග කාර්යාලයෙන් පමණක් ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලැබේ.

ප. වි. ධර්මපාල,
මිණිපේ උප කොට්ඨාශය භාර වාරිමාර්ග
ඉංජිනේරුතැන.

1960. 6. 29 වෙනි දින දීය.
මිණිපේ වාරිමාර්ග කාර්යාලය.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

මඩකලපුවේ, නැගෙනහිර කොට්ඨාශය භාර වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් යට දැක්වෙන එක් එක් වැඩ සඳහා ඒ ඒ වැඩ වලට කෙළින් සඳහන් කර තිබෙන මුදල් ප්‍රමාණ හෝ ඊට වැඩි ප්‍රමාණ වලට ලියා පදිංචිවී සිටින කොන්ත්‍රාත් කරුවන්ගෙන්, වර්ෂ 1960 ක්වූ අගෝස්තු මස 10 වෙනි දින බදාදා පෙ. ව. 9.30 දක්වා ටැන්ඩර් භාර ගනු ලැබේ.

1. වාකනේරිහී පුනානා අමුනේ දක්ෂිණ ඉවුරේ යෝජනා ක්‍රමය යටතේ ඕවර්සියර්වරුන්ගේ නිවාසයක් තැනීම (රු. 16,000.00).

2. වාකනේරිහී පුනානා අමුන දකුණු ඉවුර යෝජනා ක්‍රමය යටතේ ද්විත්ව ආකාරයේ කම්කරු නිවාසයක් තැනීම (රු. 13,300).

ටැන්ඩර් ඉදිරිපත් කළ යුත්තේ වෙන්කලඩිහි, රුගම් උප කොට්ඨාශය භාර වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකි ෆෝර්මවල පිටපත් දෙක බැගින් පිළියෙල කරන ලද ඒවායේ, වර්ෂ 1960ක්වූ අගෝස්තු මස 9 වැනි අඟහරුවාදා දක්වාය.

තවද මඩකලපුවේ ප්‍රාදෙශික වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කායාලේ තිබෙන "ටැන්ඩර් පෙට්ටියේද" ටැන්ඩර් තැන්පත්කළ හැක. වර්ෂ 1960 ක්වූ අගෝස්තු මස 10 වෙනි බදාදා පෙ. ව. 10 ට, මඩකලපුවේ ප්‍රාදේශික වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් විවෘතකරනු ලබන බැවින් ටැන්ඩර් ඉදිරිපත්කළ අයවළුන්, එකී වේලාවට එහි සිටීමට සතුටු නම්, ඔවුන්ට එසේ සිටිය හැකිය.

ටෙන්ඩර් ෆෝර්ම නිකුත්කරනු ලබන්නේ, දැන්වීමේ සඳහන් එක් එක් වැඩ සඳහා එම වැඩවලට කෙලින් සඳහන් කරනලද මුදල් ප්‍රමාණවලට, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියා පදිංචි වී සිටින බවට, කරුණු ඔප්පු කළ හැකි අය වළුන්ට පමණක් වන අතර, එම ටැන්ඩර් කරුවන් නැගෙනහිර පළාතේ වෙන්කලඩිහි වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කායාලයේ හෝ කච්චේරියක, එක වැඩකට රු. 25.00 බැගින් තැන්පත් කර එසේ කිරීමෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි.

දැනට රජයේ කොන්ත්‍රාත්වල යෙදී සිටින ටැන්ඩර්කරුවන්, එම කොන්ත්‍රත්වල කටයුතු මේ දක්වා සතුටුදායක අන්දමට කර තිබෙන බවට එකී දෙපාර්තමේන්තු භාර නිලධාරීන්ගෙන් පිළිවෙලින් සහතික ලබා ගෙන, එම සහතික, ටැන්ඩර් පත්‍ර ඉල්ලුම් කිරීමේදී ඉදිරි පත්කළ යුතුයි. වැඩි විස්තර නැගෙනහිර පළාතේ රුගම් උප කොට්ඨාශය භාර වාරිමාර්ග ඉංජිනේරු තැන ගෙන් ලබා ගත හැක.

සී. ජයසිං,
වාරිමාර්ග ඉංජිනේරු තැන.

වෙන්කලඩි.
4.7.1960.

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—ත්‍රිකුණාමල උපකොට්ඨාශය

ත්‍රිකුණාමළය කොට්ඨාශය භාර ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් "මොරවැව යෝජනාක්‍රමයේ වැ කන්දේ උඩපැත්තේ රළ පනාවට කළුගල් දැමීම" සඳහා මුද්‍රාතැබූ ටෙන්ඩර් පත් 1960-8-10 වැනි බදාදා පෙරවරු 10 දක්වා භාරගනු ලැබේ.

2. කායාලයීය වේලාවන් අතරතුරදී 1960-8-8 වැනි සඳුදින තෙක් පහත අත්සන් තබන අයගේ කායාලයෙන් ලබාගතහැකි ටෙන්ඩර් ආකෘතිපත් සම්පූර්ණකර අත්සන් තබා අනුපිටපතක් සමඟ 1960-8-10 වැනිදා පෙරවරු 10.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ ත්‍රිකුණාමළයේ ඕර්ස් හිල්හි ත්‍රිකුණාමළය කොට්ඨාශය භාර ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත වම් උඩ කෙළවරේ වැඩේ නම සඳහන් කර මුද්‍රා තැබූ කවරවල බහා එවිය යුතුය.

3. ටෙන්ඩර් ආකෘති පත් නිකුත් කරනු ලබන්නේ ටෙන්ඩර් පතක් සඳහා රු. 50ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කරන මෙම දෙපාර්තමේන්තුවේ රුපියල් පනස් දහසකට (රු. 50,000) හෝ ඊට වැඩි ප්‍රමාණයකට ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවකට පමණය. මෙම ටෙන්ඩර් තැන්පත් මුදල ඕනෑම කච්චේරියක තැන්පත් කළ හැකිය.

4. දැනට රජයේ කොන්ත්‍රාත් ලබා තිබෙන අයදුම් කරුවන් තම වැඩ සතුටුදායක අන්දමින් කරගෙන යන බවට එම වැඩ භාර නිලධාරීන්ගෙන් ලබාගත් සහතිකපත් ටෙන්ඩර් ආකෘතිපත් ලබාගැනීමේ දී ඉදිරිපත් කළ යුතුය.

5. ටෙන්ඩර් පත් විවෘත කරන විට ටෙන්ඩර් ඉදිරිපත් කළ අයට පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ.

6. වැඩි විස්තර පහත අත්සන් තබන අයගේ කායාලයෙන් ලබා ගත හැක. මීට ආදල කොන්දේසි හා සැලැස්ම යනාදිය ද මෙහිදී ම බලාගත හැක.

කේ. සිවසුබ්‍රමනියම්,
ත්‍රිකුණාමළය උප කොට්ඨාශය භාර
වාරිමාර්ග නිලධාරි තැන.

වාරිමාර්ග කායාලය,
ඇතුළුවරාය පාර, ත්‍රිකුණාමළය,
1960-7-8.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

උතුරු මධ්‍යම කොට්ඨාශය භාර අනුරාධපුරයේ වාරිමාර්ග ඉන්ජිනේරු තැන විසින් අනුරාධපුර නව නගරයේ ප්‍රාදේශීය වාරිමාර්ග කායාලය ගොඩනැගීම සඳහා 1960 අගෝස්තු මස 10 වැනි බදාදා පස්වරු 2.30 වන තෙක් ටැන්ඩර් බාරගනු ලැබේ.

මෙම ටැන්ඩර් සඳහා දෙපාර්තමේන්තුවේ රුපියල් 35,000 කට හෝ වැඩි ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් සුදුස්සන් වෙත්.

සෑම ටැන්ඩරයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. මේ සඳහා ෆෝර්ම කොල සහ සියලු විස්තර මහකනදරාව වාරිමාර්ග ඉන්ජිනේරු තැනගෙන් ලබා ගත හැකිය. 1960 ජූලි මස 20 වෙනි බදාදා සිට අගෝස්තු මස 6 වෙනි සෙනසුරාදා දක්වා ෆෝර්ම කොල දෙනු ලැබේ.

ටැන්ඩර් ෆෝර්ම දෙනු ලබන්නේ කච්චේරියක හෝ මහකනදරාව වාරිමාර්ග කායාලයෙහි රුපියල් 25ක් තැන්පත් කර කුවිතාන්සියක් ඉදිරිපත් කරන දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වූ බවට සහතික පෙන්විය හැකි කොන්ත්‍රාත්කරුවන්ට පමණි.

දැනට රජයේ කොන්ත්‍රාත් කරන ටැන්ඩර් කරුවන් ඒ වැඩ භාර නිලධාරීන්ගෙන් සතුටුදායක ලෙස වැඩ සිදුවෙන බවට සහතික ඉදිරි පත් කළ යුතුය.

ටැන්ඩර් භාර ගැනීම අවසන් කරන දින පස්වරු 3ට අනුරාධපුර ප්‍රාදේශීය වාරිමාර්ග ඉන්ජිනේරු තුමා විසින් ටැන්ඩර් විවෘත කරනු බැලීමට ටැන්ඩර් කරුවන්ට පැමිණිය හැක.

ඩී. වී. ඒ. සේනාරත්න,
වාරිමාර්ග ඉන්ජිනේරු තැන,
මහකනදරාව.

1960 ජූලි මස 6 වෙනි දින,
මිහින්තලය.

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### මිද්දෙනිය රජයේ ගොවිපළට කෙසෙල් පැල සැපයීම

හම්බන්තොට කෘෂිකර්ම ව්‍යාප්ත නිලධාරි තැන විසින් මිද්දෙනිය ගොවිපළට කෙසෙල් පැල සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1960 අගෝස්තු මස 12 වැනි දින පස්වරු 2.30 වන තෙක් භාරගනු ලැබේ.

2. හම්බන්තොට කෘෂිකර්ම කායශාලයේ කෘෂිකර්ම ව්‍යාප්ත නිළධාරි තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ඒවායෙහි එවිය යුතුයි. සියලුම ටෙන්ඩර් පත්‍ර ලියුම් කවරයක දමා සීල් තබා "කෘෂිකර්ම ව්‍යාප්ත නිළධාරි තැන, කෘෂිකර්ම කායශාලය, හම්බන්තොට" යන්න එහි පිට ලියා එහිම මුදුනේ වම් කොනෙහි "මීද්දෙනියේ ගොවිපළට කෙසෙල් පැල" සැපයීමේ ටෙන්ඩර් පත්‍රය යන්න ලියා එවිය යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපෑලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපෑලෙන් නොඑවතොත් ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් හෝ විසින් හම්බන්තොට කෘෂිකර්ම කායශාලයේ කෘෂිකර්ම ව්‍යාප්ත නිළධාරි තැනට ඒවා අතින්ම භාර දිය යුතුයි.. ටෙන්ඩර් පත්‍ර බහා ලන ලද කවරයෙහි "මීද්දෙනියේ ගොවිපොළට කෙසෙල් පැල" සැපයීමේ ටෙන්ඩර් පත්‍රය යන්න ලියා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළ යුතුයි.

4. රෙජිස්ටර් තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේදීම සියලු ටෙන්ඩර්කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වීමට නියමිත දින සිට දින හතරක් ඇතුළත යම් ටෙන්ඩර්කරුවකුට එවැනි දැන්වීමක් නොලැබුනොත් ඔහු හම්බන්තොට කෘෂිකර්ම කායශාලයේ කෘෂිකර්ම ව්‍යාප්ත නිළධාරි තැනගෙන් වහාම ඒ ගැන කරුණු විමසිය යුතුයි.

5. ටෙන්ඩර් කරුවන්ට උවමනානම් ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේදී ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වීමට නියමිත යටකී දිනයේ යටකී වේලාවේදී හම්බන්තොට කෘෂිකර්ම කායශාලයේදී ඒවා විවෘත කරණු ලැබේ.

6. ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝරම දෙනු ලැබේ. ඒ දීම කරන්නේ එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 10 ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුවය. මේ තැන්පත් කිරීම කච්චේරියක හෝ මහා භාණ්ඩාගාරයේ හෝ කළ යුතුයි. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ.

පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුටම ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දන්වා 10 දිනක් ඇතුළතදී අවශ්‍ය ඇපය තැබීමට හෝ පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමට හෝ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙන්ට ඉඩ තිබේ.

7. නියමිත පෝරමය ලියා නැති නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක් ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර්කරුවාගේ කෙටි අත්සන තැබිය යුතුද වේ.

8. ටෙන්ඩර්කරුවන් තම ලිපිනය පැහැදිලි අකුරින් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුයි.

9. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වූද පිළිගනු ලැබුවාවූද දේවල මුළු වියද මෙන් සියයට පහක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්‍ෂතැනගේ නමින් තැන්පත් කිරීමටත් පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමටත් පත් කරගනු ලැබූ ටෙන්ඩර්කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙන්නේ මේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු කොට නිමවූ විට පමණකි. පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා මේ කොන්ත්‍රාත්තුව ඉටු නොකළ හොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක වෙනවා පමණක් නොව ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙනවාද ඇත.

10. පොරොන්දු පත්‍රයට හා/හෝ ඔප්පුවට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත්කරගනු ලැබූ ටෙන්කරුවා විසින් ගෙවිය යුතුයි.

11. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්‍ෂෙප කිරීමෙන්, ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේ බලය කෘෂිකර්ම අධ්‍යක්‍ෂක වෙත තබා ගනී.

12. පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වැඩ කිරීම සඳහා ලාංකික කම්කරුවන් පමණක් ගත යුතුය. "ලාංකිකයා" යන වචනයේ අර්ථ නම් පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ ලංකාවේ පුරවැසියෙක්වූ තැනැත්තෙක්ය යන්නයි.

13. 1954රේ 19 වැනි අංකය දරණ කම්කරු වන්දි ආඥපනත (117 වැනි පරිච්ෙජදය) යටතේ තමාගේ යම් කිසි සේවකයකු හෝ සේවකයකු වෙනුවෙන් වන්දි ඉල්ලා එවන ලියුම් පත්‍ර ගැන වග කීමෙන් කොන්ත්‍රාත්කරුවා ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

14. කොන්ත්‍රාත්කාරයාට බාරදිය යුතු සියලු දැන්වීම් ඔහුගේ අතට දුන්නොත් නැතහොත් ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපෑලෙන් යැව්වොත් ඔහු අතටම බාර දුන්නා කොට සැළකිය යුතුයි.

15. වැඩට ගැනීමට නුසුදුසුයයි කල්පනා කරනු ලබන යම් කිසි කම්කරුවෙකු කොන්ත්‍රාත්කරුවා වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ ඕනෑම කම්කරුවෙකු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ බලය ආණ්ඩුවට තබාගනු ලැබේ.

16. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමග හෝ නම ඇතුළත්වූ හෝ තමාට සෑහේ යයි පෙනීයන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්‍ෂක තැන විරුද්ධවන හෝ කිසිවකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

17. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරන සියලුම මිළ ගණන් යටත් පිරිසෙයින් සති තුනකට (3) වත් වෙනස් නොවන සථිර ඒවා විය යුතුයි.

18. තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරු විසින් කෙසෙල් පැල 1960 ඔක්තෝබර් මස 1 වෙනිදාට ප්‍රථම සැපයිය යුතුයි.

19. වැඩි විස්තර හම්බන්තොට කෘෂිකර්ම කායශාලයේ කෘෂිකර්ම ව්‍යාප්ත නිළධාරි තැනගෙන් දැන ගත හැක.

ඒ. වී. රිචඩ්ස්,
වැඩ බලන කෘෂිකර්ම අධ්‍යක්‍ෂක.

1960 ජූලි මස 7 වෙනිදා,
පේරාදෙනියේදීය.

### සැපයිය යුතු ද්‍රව්‍ය

ඇඹුල් හොරනවාලු වර්ගයේ කෙසෙල් පැල 3,000. (කෙසෙල් පැල කඳේ මුල සිට කොල පිහිටා ඇති තැන දක්වා උස ප්‍රමාණය අඩි 4 සිට 5 දක්වා විය යුතුයි. කෙසෙල් මුලේ ඉහල කොටසේ විෂ්කම්භය අඟල් 4 විය යුතුයි.

ඉහත සඳහන් පැල නිරෝගී කෙසෙල් පඳුරුවලින් සැපයිය යුතුයි. කෙසෙල් පැල සපයන්නාට බලාපොරොත්තු වන වතු පරීක්‍ෂා කිරීමෙන් පසු පැල සැපයීමට සුදුසුද යන්න තීරණය කරණු ඇත. පැල ඉගිල්ලීම දෙපාර්තමේන්තුවේ නිලධාරියකුගේ ඉදිරියේ කළ යුතුයි. සැපයෙන පැල සම්පූර්ණ විය යුතුයි.)

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### කන්තලේ රජයේ උක්ව්‍යාපාරයේ උක්දඬු කපන ලද අක්කර 1000ක ඉපනැලි කැපීම (රවූනිං)

පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැන විසින් 1960 අගෝස්තු මස 5 වැනි දින පස්වරු 2.30 දක්වා ඉහත සඳහන් වැඩය සඳහා ටෙන්ඩර්පත්‍ර භාරගනු ලැබේ.

(1) කන්තලේ රජයේ උක්ව්‍යාපාරයේ අක්කර 1,000ක පමණ ප්‍රමාණයක අස්වැන්න කපන ලද උක් නැවත කැපීම (රටූනිං).
වැඩ විස්තර :—

(අ) අස්වැන්න කැපීමෙන් පසු උක්පේලිවල ඇති කොළරොඩු ආදිය සුඛකර ඉවත් කොට ඒවා පේලි අතරේ බෙදා හැරීම.

(ආ) උක්පේලිවල කපන ලද උක්දණ්ඩේ මුල්කොටස (ඉපනැල්ල) පස මතුපිටින් අඟලක් පමණ යටින් නැවත කැපීම, කපන ලද දඬු කැබලි උක්පේලි අතරට දැමීම.

(ඇ) උක්දඬු නැවත කපන කල උක් පඳුරේ මුල ඉදිරීමට පෙර හෝ බුරුල් නො කිරීමට වගබලාගත යුතුයි.

(2) ටෙන්ඩර්කරුවන්ට සම්පූර්ණ ප්‍රමාණයට හෝ අක්කර පණහකට වැඩි කිසියම් ප්‍රමාණයකට ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක.

(3) ටෙන්ඩර්කරුවන් වහාම වැඩ ආරම්භ කිරීමට ලැස්තිවී සිටිය යුතුය.

(4) කන්තලේ උක්ගොවිපොළේ සාමාන්‍යාධිකාරීගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර්පත්‍ර ඒවායේ එවිය යුතුයි. සියළුම ටෙන්ඩර් පත්‍ර අනුපිටපතක් ද සහිතව ලියුම් කවරයක දමා සීල්තබා "සභාපති මහතා, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලය, පේරාදෙණිය" යන්න ලියා එහිම මුදුන් වම් කෙළවරේ "කන්තලේ උක්ව්‍යාපාරයේ උක්දඬු කපන ලද අක්කර 1,000ක ඉපනැලි කැපීම සඳහා ටෙන්ඩර් පත්‍රය" යන්නද ලියා එවිය යුතුයි.

(5) එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රු. 25ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි. 1960 අගෝස්තු මස 4 වැනි ද දවල් 12හ දක්වා ටෙන්ඩර් පෝර්ම දෙනු ලැබේ. මේ තැන්පත් කිරීම කච්චේරියක හෝ කොළඹ මහා භාණ්ඩාගාරයේ හෝ කළ යුතුයි. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ. පත්කරගනු ලැබූ ටෙන්ඩර් කරුවාට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බැව් දන්වා දස දිනක් ඇතුළතදී අවශ්‍ය ඇපය තැබීමට හෝ පොරොන්දු පත්‍රය අත්සන් කිරීමට හෝ නො හැකිවුවහොත් ඔහුගේ ටෙන්ඩර්තැන්පත් මුදල රාජ සන්තක වෙනවාත් හැර ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුලත් වීමටද ඉඩ තිබේ.

(6) ටෙන්ඩර් පත්‍ර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුයි. එසේ නැත්නම් ඒවා රිජිස්ටර් තැපැලෙන් එවිය යුතුයි. රිජිස්ටර් තැපැලෙන් නො එවන ටෙන්ඩර් පත්‍ර ටෙන්ඩර්කරුවන් විසින් හෝ ඔවුන්ගේ ඒජන්තවරුන් විසින් හෝ ටෙන්ඩර් භාර ගැනීමට බලය දී තිබෙන නිලධාරීතැනවූ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් ලිපිකරුට අතින්ම භාර දිය යුතුයි. එම ටෙන්ඩර් පත්‍ර බහාලන කවරයෙහි "උක් දඬු කපන ලද අක්කර 1,000ක ඉපනැලි කැපීම සඳහා ටෙන්ඩර් පත්‍රය" යන්න ලියා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළ යුතුයි.

රිජිස්ටර් තැපැලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුන බව ඒවා විවෘත කරන දිනයේදීම දන්වනු ලැබේ. යම් ටෙන්ඩර්කරුවකු විසින් එවැනි දැන්වීමක් ටෙන්ඩර්පත්‍ර විවෘත කිරීමට නියමිත දින සිට දින 4ක් ඇතුලත නො ලැබුණොත් ඒ ගැන පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගෙන් වහාම විමසිය යුතුයි.

(7) ටෙන්ඩර්කරුවන්ට වුවමනානම් ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේදී ඉදිරියේ සිටීමට ඉඩදෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාරගැනීමට නැවැත්වීමට නියමිත යට කී දිනයේ යටකී වේලාවේදී පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දී විවෘත කරනු ලැබේ.

(8) නියමිත ෆෝරමයේ ලියා නැති නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක් ටෙන්ඩර් පත්‍රයක් වශයෙන් සලකනු නො ලැබේ. ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් කිසිම වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර් කරුවන්ගේ කෙටි අත්සන තැබිය යුතුවේ. ටෙන්ඩර් කරන ලද ගණන් අකුරුවලින් සහ ඉලක්කන්වලින්ද ලිවිය යුතුයි. ඉලක්කන් වලින් ලියන ලද ගණන් වචනවලින් ලියනලද ගණන්වලට වෙනස් වුවහොත් ටෙන්ඩර් පත්‍රය ප්‍රතික්ෂෙප කිරීමට ඉඩ තිබේ.

(9) ටෙන්ඩර්කරුවන් තම ලිපිනය පැහැදිලි අකුරෙන් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුයි.

(10) ටෙන්ඩර් පත්‍රයේ සඳහන්වූද පිළිගනු ලැබුවාවූද ඉපනැලි කැපීමට යන මුලු වියදමෙන් සියයට 5ක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂකගේ නමින් තැන්පත් කිරීමටත් පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමටත් පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙන්නේ මේ කොන්ත්‍රාත්තුව නිසිපරිදි ඉටුකොට නිමවූ විට පමණකි. පත්කරනු ලැබූ ටෙන්ඩර්කරුවා මේ කොන්ත්‍රාත්තුව ඉටුනොකළ හොත් ඔහුගේ ඇප මුදල රාජ සන්තක වෙනවා පමණක් නොව ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවේ ඇතුලත් වෙනවාද ඇත.

(11) පොරොන්දු පත්‍රයට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ගෙවිය යුතුය.

(12) ටෙන්ඩර්පත්‍ර භාරගැනීම නැවැත්වූ දින සිට දෙමසක් යන තුරු ටෙන්ඩර්කරුවන් තම ටෙන්ඩර්පත්‍ර සැලකිල්ලට භාජන කිරීමට ඉඩ තැබිය යුතුයි.

(13) තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වැඩය කිරීම පිණිස ලාංකික කම්කරුවන් යෙදවිය යුතුයි.

ඒ වැඩය කිරීම සඳහා ලාංකික කම්කරුවන් යෙදවිය යුතු වග කොන්ත්‍රාත්තුවේ කොන්දේසියක් හැටියට සලකනු ලැබේ. තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරුට මේ කොන්දේසිය ඉටුකිරීමට නොහැකි වුවහොත් කොන්ත්‍රාත්තුව කඩකිරීමකැයි සලකා එය අවලංගු කරනු ලැබේ. විශෙෂ අවස්ථාවන්හිදී කොන්ත්‍රාත්කරුට ලාංකික නොවන කම්කරුවන් යෙදවීමට හැකි වන්නේ කෘෂිකර්ම අධ්‍යක්ෂකගේ අනුමැතිය ලියවිල්ලකින් ලබාගත්තාට පසුවය. එවැනි අවසරයක් නොමැතිව ලාංකිකයන් නොවන කම්කරුවන් යෙදවීම කොන්ත්‍රාත්තුව කඩකිරීමකැයි සලකනු ලැබේ. "ලාංකිකයා" යන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියාපදිංචිකරවා ගැනීමෙන් හෝ ලංකාවේ පුරවැසියෙක්වූ තැනැත්තෙක් යන්නයි.

(14) තමාගේ යම්කිසි සේවකයෙකු වෙනුවෙන් 1934රේ 19 වැනි අංකය දරණ කම්කරු වන්දි ආඥාපනත (117 වැනි ඡෙදය) යටතේ වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත්කරු ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

(15) යම් කිසි වැඩකරුවෙක් මේ වැඩෙහි යෙදවීම ගැන විරුද්ධ වීමට බලය ආණ්ඩුව වෙත තබාගනු ලැබේ.

(16) වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කාරයන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් කෙනෙකුගේ නම සමඟ ඇතුලත්වූ හෝ තමාට සැහේ යයි පෙනීයන හේතුපිට කෘෂිකර්ම අධ්‍යක්ෂක තැන විරුද්ධ වන හෝ කිසිවකු සමඟ කොන්ත්‍රාත්තුවට බැඳෙනු නො ලැබේ.

(17) උක්ගොවි පොළේ කළමනාකාර තැන වෙත කලින් ලියා දැන්වීමෙන් ඉපනැලි කැපීමට ඇති ඉඩම වැඩ කරන ඕනෑම දිනයක වැඩ කරන වේලාවක දී පරීක්ෂා කිරීමට පුළුවන.

(18) වැඩිවිස්තර කන්තලේ උක්ව්‍යාපාරයේ සාමාන්‍යාධිකාරී තැනගෙන් ලබා ගත හැකිය. එසේ එවන ලියුම් පහත සඳහන් අයගේ නමට නොඑවිය යුතුයි.

ඒ. වී. රිචඩ්ස්,
වැඩබලන කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1960.7.12 දින,
පේරාදෙණියේ දීය.

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

### පාවිච්චි නොකළහැකි, ජීප් රථයක් (Land Rover) විකිණීම

ලියා පදිංචිකළ ඊඇල් 1304 දරන "ජීප් රථය" විකිණීම සඳහා, ගොවිජනසේවා දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන (අංක 42, එඩින්බරෝ චන්ද්‍ර වංකය, කොළඹ 7) විසින් 1960 වේ අගෝස්තු මස 8 වෙනි දින සවස 2.30 දක්වා ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ. මේ සම්බන්ධව වැඩි විස්තර දැන ගැනීමට පහත සඳහන් ලිපිනයෙන් විමසන්න.

ජේ. ඒ. ජෙහරාජා,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

නො. 60, හෝටන් පෙදෙස,
කොළඹ 7,
8.7.60.

---

## ගාල්ලේ ඉඩම් සංවර්ධන නිලධාරිතැනට ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම

### (1960-61 වර්ෂයේ මුල් භාගය සඳහා)

ගාල්ලේ ඉඩම් සංවර්ධන නිලධාරිතැන විසින් පහත සඳහන් ව්‍යාපාරයන්ට ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩර් 1960ක්වූ අගෝස්තු මස 4 වැනි දින පෙරවරු 10 දක්වා භාරගනු ලැබේ :—

| මාතර දිස්ත්‍රික්කය | ගාළු දිස්ත්‍රික්කය | කළුතර දිස්ත්‍රික්කය |
|---|---|---|
| (අ) කළුබෝවිටියාන | (අ) වීරපාන | (අ) පැලවත්ත |
| (ආ) දැරංගල | (ආ) ඕපාත | (ආ) වරතල්ගොඩ |
| (ඇ) පස්ගොඩ | (ඇ) තලන්ගල්ල | (ඇ) හැඩිගල්ල |
| (ඈ) හීනිපැල්ල | (ඈ) හල්විටිගල | (ඈ) හත්තක |
| (ඉ) බානගල | | |

(1) පොල්අතු — දිග අඩි 7 වත් පළල අඟල් 12 වත් අඩු නොවිය යුතුයි (1000 ගණනින්).

(2) හුණු අළු — බුසල් ගණනින් (බුසලක් රාත්තල් 44 කට අඩු නොවිය යුතුයි).

(3) තම්බාපු හුණු — බුසල් ගණනින්

(4) කළුගල් — 6″ × 9″ — කියුබ් ගණනින්

(5) තලාපු කළුගල් — $\frac{3}{4}$″ — කියුබ් ගණනින්

(6) තලාපු කළුගල් — 1″ — කියුබ් ගණනින්

(7) තලාපු කළුගල් — $1\frac{1}{2}$″ — කියුබ් ගණනින්

(8) පිළිස්සූ ගඩොල් — 1000 ගණනින් ($8\frac{3}{4}'' \times 4\frac{1}{4}'' \times 2\frac{3}{4}$) ප්‍රමාණය විය යුතුයි. පෝරණුව වැඩපලට සැතපුම් 5 කට වඩා ඈත් නොවිය යුතුයි).

(9) වැලි — කියුබ් ගණනින්

2. මිළ ගණන් පහත දැක්වෙන අයුරු වෙන වෙනම සඳහන් කළ යුතුයි :—

(අ) ලොරි ගමන් කළ හැකි ස්ථානයක පිහිටා තිබේ නම් වත්ත, පෝරණුව, ගල්වළ අසළදීම භාරදීම සඳහා මිළ; පිහිටා ඇති ස්ථානය හා ව්‍යාපාරයේ සිට ඇති දුරත් සඳහන් කළ යුතුයි.

(ආ) ව්‍යාපාරයට භාරදීමට මිළ.

(ඇ) ටෙන්ඩර්කරු ඔහු විසින් ඉදිරිපත් කරන ලද මිළ ගණන් අනුව සැපයිය හැකි ප්‍රමාණය සඳහන් කළ යුතුයි.

3. 1960 අගෝස්තු මස 1 වැනි දින දහවල් 12 දක්වා ගාල්ලේ ඉඩම් සංවර්ධන නිලධාරිතැනගෙන් ලබාගත හැකි ෆෝර්මවල ටෙන්ඩර් පත්‍ර පිළියෙළ කොට අනුපිටපතකුත් සහිතව ඉදිරිපත් කළ යුතුයි. එක් එක් ව්‍යාපාරයට එක් එක් ටෙන්ඩර් පත්‍රය බැගින් ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් පත්‍රයට රුපියල් පණහක් (රු. 50) බැගින් ඇප මුදල් ගාල්ලේ ඉඩම් සංවර්ධන නිලධාරිතැනගේ කාර්යාලයේ හෝ කච්චේරියක තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් පසු ටෙන්ඩර් පත්‍ර ලබාගත හැකිය.

4. 1960 අගෝස්තු මස 4 වැනි දින පෙරවරු 10.30ට ගාල්ලේ ඉඩම් සංවර්ධන කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ඉල්ලුම් කරුවන්ට වුවමනානම් ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී පැමිණ සිටිය හැක.

5. මේ සඳහා වැඩි විස්තර ඉඩම් සංවර්ධන නිලධාරි තැනගෙන් ලබා ගත හැක.

ජී. අමරසේන,
ඉඩම් සංවර්ධන නිලධාරි තැන.
ගාල්ල.

1960ක් වූ ජූලි මස 8 වෙනි දින,
ගාල්ලේ නගර ශාලාවේ පිහිටි ඉඩම්
සංවර්ධන කාර්යාලයේදීය.

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### අමු ආහාර ද්‍රව්‍ය සැපයීම

වර්‍ෂ 1960 ඔක්තෝබර් මස 1 වෙනිදා සිට 1961 සැප්තැම්බර් මස 30 දසින් අවසන් වන වර්‍ෂය තුළ මේ සමග ඇති උපලේඛනයේ පළමු වැනි තීරයෙන් දක්වා ඇති ආයතනයන්ට අමු ආහාර ද්‍රව්‍ය සැපයීම සඳහා එවනු ලබන සිල් තැබූ ටෙන්ඩර පත්‍ර කොළඹ ගාලු මුවදොර මහා ලේකම් කාර්යාලයේ තැ. පෙ. 500, සෞඛ්‍ය හා සමාජ සේවා අමාත්‍යාංශයේ දී ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින්, 1960 අගෝස්තු මස 9 වෙනි දින දක්වා ලාංකිකයන්ගෙන් හෝ ලාංකික වෙළඳ ආයතනවලින් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. මෙම කාර්යාලයෙන් ලබාගන්නා ටෙන්ඩර් පෝර්මවල, කොළඹ ගාලු මුවදොර මහාලේකම් කාර්යාලයේ තැ. පෙ. 500, සෞඛ්‍ය හා සමාජ සේවා අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත අනු පිටපතක් සමග ටෙන්ඩර් සැසිය යුතුයි. නියමිත පෝරමයේ නොවන ටෙන්ඩර් පත්‍ර භාර නොගනු ලැබේ.

3. මේ සමග ඇති උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් ප්‍රමාණයේ මුදලක්, මගේ නමට කොළඹ කච්චේරියේ හැර අනිකුත් කච්චේරියක හෝ කොළඹ කොටුවේ බ්‍රිස්ටල් වීදියේ ලංකා බැංකුවේ තැන්පත් කළ බවට නිකුත් කරන කුවිතාන්සි ටෙන්ඩර් ලබාගැනීමට ප්‍රථම ලබා ගත යුතුයි. ලංකා බැංකුවෙහි මුදල් තැන්පත් කිරීමට අවශ්‍ය පෝර්ම, කොළඹ, සෞඛ්‍ය සේවා අධ්‍යක්‍ෂ තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන ටෙන්ඩර් පත් ලංකා බැංකුව භාර නොගනු ලැබේ.

අයදුම් කරුවන් ටෙන්ඩර් තැන්පත් මුදලට ලබාගත් කුවිතාන්සි ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනට ප්‍රථම දින දවල් 12 ට කලින් ඉදිරිපත් කිරීමෙන්, අවශ්‍ය පෝරම, සෞඛ්‍ය සේවා අධ්‍යක්‍ෂ තැන ගෙන් ලබාගත හැක. තැපෑලෙන් ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කරන අය, කල් වේලා ඇතිව ඉහත කී කුවිතාන්සිය එවා, ටෙන්ඩර් පෝර්ම ලබා ගෙන ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනට ප්‍රථම ටෙන්ඩර් එවිය යුතුයි.

4. සෑම ටෙන්ඩරයක්ම කොළඹ, තැ. පෙ. 500, සෞඛ්‍ය හා සමාජ සේවා අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත එවිය යුතුයි. සිල් තැබූ ටෙන්ඩර් පත්‍රය බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවන් සඳහාද යන්න සඳහන් කළ යුතුයි. ඒ කවරයේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළ යුතුයි.

ටෙන්ඩර් පත් කොළඹ, ගාලු මුවදොර මහාලේකම් කාර්යාලයේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ නො. 155 දරණ කාමරයේ ටෙන්ඩර් පෙට්ටියට දැමිය යුතුය. ටෙන්ඩර්කරුවන්ට සිය ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි තැපෑලෙන් ද එවිය හැක. ටෙන්ඩර්කරුවන් සිය ටෙන්ඩර් පත් ලියාපදිංචි තැපෑලෙන් එවීමට අසතුටු නම්, ඔවුන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයින්ට මෙහි පළමුවන ඡේදයේ සඳහන් ලිපිනයේ ඇති ටෙන්ඩර් පත් භාර ගැනීමේ අවසරය ඇති සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහකාර ලේකම් මහතාට පුද්ගලිකව ටෙන්ඩර් පත්‍ර භාරදී එය ලැබුණු බවට කුවිතාන්සියක් ද ලබාගත හැක. ටෙන්ඩර් පත් භාර ගැනීමේ අවසාන දින දවල් 10 පසුව තැපෑලෙන් හෝ පැමිණ භාරදෙන සෑම ටෙන්ඩරයක්ම ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5. ටෙන්ඩර් පත් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට එම ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුගේ නම සහ ඔවුන්ගේ ටෙන්ඩර් පත්වල සඳහන් මිළ ගණන් ද පැමිණ සිටින්නන් ඉදිරියේ කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවකුට ටෙන්ඩර් පත් පරීක්‍ෂා කිරීමට අවශ්‍ය වුවහොත් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපතක් පරීක්‍ෂා කළ හැක.

6. මෙම දෙපාර්තමේන්තුවේ දැනට කොන්ත්‍රාත්තුවක් නොදරන අය, ටෙන්ඩර් පත්‍ර ඉල්ලා එවීමට පෙර තම තමන්ගේ වටිනාකම් පිළිබඳ තොරතුරු මා වෙත දන්වා සිටිය යුතුයි. ඒ සඳහා අවශ්‍ය පෝර්ම මගෙන් ලබා ගත හැක. ටෙන්ඩර්කරුවන්ගේ මුදල් තත්ත්වයේ ස්ථිරභාවය පිළිබඳ තොරතුරු දැන ගැනීමට පෙර ටෙන්ඩර් පත්‍ර පිළිබඳ තීරණයක් කළ නොහැක. එබැවින් තමතමන්ගේ වටිනාකම් පිළිබඳ වාර්තාවක් එවිය යුතුය.

7. වර්‍ෂ 1959 අප්‍රේල් 1 ද සිට 1960 මාර්තු 30 ද දක්වා වූ කාලය තුළ ලබාගත් ආහාර ප්‍රමාණයේ විස්තරයක් මෙහි පහත දක්වා ඇත. ටෙන්ඩර් මණ්ඩලයේ අවසාන තීරණය රඳා පවත්නේ වියදම් වූ මුළු මුදල අනුවයි.

8. තෝරාගත් ටෙන්ඩර්කරුවා ඇප තබා අත්සන් කළ යුතු ගිවිසුමෙහි මිල ප්‍රමාණයන් වෙනස් කිරීම පිළිබඳ විශේෂයක් දී නැත්නම් ඔහු විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කර ඇති මිල ගණන් ප්‍රමාණය කිසිසේත් වෙනස් නොවනවා ඇත. එය පළමුවැනි ඡේදයෙහි සඳහන් කාලසීමාව තුළම බලපවත්වනවා ඇත.

9. තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය තැන්පත් කර තබනු සඳහා ආයතනයේ හෝ එය පිහිටි ඉඩම තුළ ඉඩකඩ සලසා නොදෙනු ලැබේ.

10. ටෙන්ඩරය පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රය පිටුපස දක්වා ඇත. ටෙන්ඩරයක් ඉල්ලන විට එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතු වන්නේය.

ඇස්. ඥානසේගරම්,
සෞඛ්‍යසේවා අධ්‍යක්‍ෂ වෙනුවට.

1960 ජූලි 11 වැනි දින,
සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මුදල් අංශය, කොළඹ.

### උපලේඛනය

| (1) සේවය | (2) ටෙන්ඩර සඳහා තැන්පත් මුදල රු. | (3) ඇප මුදල රු. | (4) ටෙන්ඩර භාර ගන්නා අවසාන දිනය හා වේලාව |
|---|---|---|---|
| අමු ආහාර ද්‍රව්‍ය සැපයීම— පැලවත්ත, උම්මත්තකාරෝග්‍යය ශාලාව | 100 | ... 1,000 | 9.8.60වැනි දින පෙර වරු 10 ට පෙර. |

ද්‍රව්‍යවල දළ ප්‍රමාණය

| ද්‍රව්‍යය | ප්‍රමාණය රාත්තල් | ද්‍රව්‍ය එළවළු | ප්‍රමාණ රාත්තල් |
|---|---|---|---|
| හරක්මස් | ... 7,600... | මුරුංගාකොළ | ... 15 |
| මාලු— | | ගොටුකොළ | ... 50 |
| තෝර | ... 80... | මුකුණුවැන්න | ... 2,500 |
| පරව් | ... 50... | තම්පලා | ... 100 |
| මීවාටිය | ... 100... | නිවිති | ... 200 |
| තුඹයා | ... 150... | කන්කුන් | 2,500 |
| ගල්මාළු | ... 1,500... | සාරන | ... 300 |
| බලයා | ... 100... | ගෝවා | ... 2,500 |
| කට්ටාවො | ... 400... | වම්බටු | ... 1,500 |
| | | බොම්බයිලූණු | ... 2,000 |
| බිත්තර | ... 700... | මුරුංගා | ... 500 |
| | | මාළු කෙසෙල්ගෙඩි... | 600 |
| පරිප්පු ((මයිසෝර්) | ... 1,000... | අමුතක්කලි | ... 1,200 |
| කට්ට පරිප්පු | ... 4,500... | වට්ටක්කා | ... 4,000 |
| තෝර පරිප්පු | ... 5,000... | පතෝල | ... 500 |
| මුං ඇට ... | ... 2,500... | මඤ්ඤොක්කා | ... 900 |
| කරවල— | | අර්තාපල් | ... 1,000 |
| පරව් ... | ... 300... | බතල | ... 2,200 |
| කට්ට ... | ... 700... | වැල් අල | 800 |
| වෙනත් ජාති | ... 1,600... | කිරිඅල | ... 600 |
| | | දෙල් | ... 400 |
| වෑන්ජනවලට අවශ්‍ය ද්‍රව්‍ය— | | | |
| වියලි මිරිස් | ... 1,100... | කොස් | ... 300 |
| කොත්තමල්ලි | ... 400... | බීට්රූට් | ... 800 |
| මාදුරු ... | ... 100... | බටර් බෝංචි | ... 100 |
| සූදුරු ... | ... 400... | කැරට් | ... 400 |
| උළුහාල් | ... 50... | රාබු | ... 2,700 |
| සුදුළූනු | ... 100 | | ගෙඩි |
| ගොරක | ... 50 | පලතුරු වර්ග— | |
| උම්බලකඩ | ... 200... | පොල් | ... 20,900 |
| අබ ... | ... 50... | දෙහි | ... 7,700 |
| ගම්මිරිස් | ... 50... | දොඩම් | ... 200 |
| රතුළූනු | ... 450... | ඉදිච්ච කෙසෙල්ගෙඩි | |
| ලුණු ... | ... 2,000... | (හොඩරවාලු) | 1,50,000 |
| සියඹල... | ... 300 | | |
| කහ ... | ... 100... | විවිධ— | |
| විනාකිරි (බෝතල්) | ... 100... | අමුමිරිස් | ... 500 |
| | | අමුඉඟුරු | ... 25 |
| විවිධ— | | කරපිංචා | ... 50 |
| පොල්තෙල් (බෝතල්) ... | 600... | පාන් (සුදු) | ... 54,000 |
| ජෑම් | ... 700 | | |
| කළුසීනි | ... 6,500 | | |
| බී. ඕ. පී. තේ | ... 1,000 | | |
| අමු පුවක් | ... 12,000 | | |
| බුලත් ... | ... 450 | | |
| හුණු ... | ... 50 | | |

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### සතුන්, තණ, දර සැපයීම

1960 ඔක්තෝබර් මස 1 වැනිද සිට 1960 සැප්තැම්බර් 30 දැයින් අවසන්වන වර්ෂය තුළ මේ සමග ඇති උපලේඛනයේ පළමුවැනි තීරයෙහි දක්වා ඇති දර, සතුන් සහ තණකොළ ආහාර සැපයීම සඳහා එවනු ලබන සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර ලාංකිකයන්ගෙන් හෝ ලාංකික ආයතනවලින් කොළඹ, ගාලු මුවදොර මහා ලේකම් කාර්යාලය යාබද "බී" අක්ෂරය දරණ ගොඩනැගිල්ලේ පිහිටි සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මුදල් අංශයේදී සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක තැන විසින් භාරගනු ලැබේ.

2. මෙම කාර්යාලය මඟින් සපයන ලද පෝර්මවල පමණක් පිටපත් දෙකකින් ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

3. මේ සමග ඇති උපලේඛනයේ 4 වැනි තීරයෙහි සඳහන් දිනවල පෙරවරු 10 ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැකිය. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් විසින් ටෙන්ඩර් පත්‍රවල සඳහන් කරන ලද මිල ගණන් ද පැමිණ සිටින්නන් ඉදිරියේ කියවනු ලැබේ. යම් කිසි ටෙන්ඩර් කරුවකුට ටෙන්ඩර් පත්‍ර පරීක්ෂා කිරීමට අවශ්‍ය වුවහොත් මගේ හෝ මවිසින් බලය පවරනු ලැබූ වෙනත් නිලධාරියකු ගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපතක් පරීක්ෂා කළ හැකිය.

4. මේ සමග ඇති උපලේඛනයේ දෙවැනි තීරයෙහි සඳහන් ප්‍රමාණයේ මුදලක් මගේ නමට කොළඹ කච්චේරියෙහි හැර අනිකුත් කච්චේරියක හෝ කොළඹ කොටුවේ බ්‍රිස්ටල් වීදියේ ලංකා බැංකුවේ මුදල් තැන්පත් කළ බවට නිකුත් කෙරෙන කුවිතාන්සියක් ටෙන්ඩර් පත්‍රය ලබා ගැනීමට පළමුව ඉදිරිපත් කළ යුතුයි. ලංකා බැංකුවේ මුදල් තැන්පත් කිරීමට අවශ්‍ය පෝර්ම මෙම කාර්යාලයෙන් ලබාගත හැකිය. නියමිත පෝර්මයේ නොවන තැන්පත් මුදල් බැංකුව භාර ගනු නො ලැබේ.

5. අයදුම්කරුවන් විසින් තැන්පත් කරන ලද මුදලට ලබාගත් කුවිතාන්සි, ටෙන්ඩර් පත්‍ර නිකුත් කෙරෙන අවසාන දින දවල් 12 ට පෙර ඉදිරිපත් කර අවශ්‍ය පෝර්ම ලබාගත යුතුයි. තැපැලෙන් ටෙන්ඩර පෝර්ම ඉල්ලුම් කරන අය, මුදල් තැන්පත් කළ කුවිතාන්සි කල්වේලා ඇතිව එවීමෙන් අවසාන දිනයට ප්‍රථම ටෙන්ඩර් එවීම සඳහා අවශ්‍ය පෝර්ම ලබාගත හැකිය.

6. මෙම දෙපාර්තමේන්තුවේ දැනට කොන්ත්‍රාත්තුවක් නොදරන අය ටෙන්ඩර් පත්‍ර ඉල්ලා එවීමට පෙර තම තමන්ගේ වටිනාකම් පිළිබඳ තොරතුරු මා වෙත දැන්විය යුතුයි. මේ සඳහා අවශ්‍ය පෝර්ම මෙම කාර්යාලයෙන් ලබාගත හැක.

ටෙන්ඩර්කරුවන්ගේ මුදල් තත්ත්වයේ ස්ථිර භාවය පිළිබඳ තොරතුරු දැන ගැනීමට පෙර ඔවුන් විසින් එවන ලද ටෙන්ඩර් පිළිබඳ තීරණයක් කළ නො හැකි බැවින් තම තමන්ගේ වටිනාකම් පිළිබඳ තොරතුරු කල්වේලා ඇතිව ඉදිරිපත් කළ යුතුයි.

7. සෑම ටෙන්ඩරයක්ම කොළඹ ගාලු මුවදොර මහාලේකම් කාර්යාලය යාබද "බී" අක්ෂරය දරණ ගොඩනැගිල්ලේ පිහිටි සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මුදල් අංශයේ තැ. පෙ. 584, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක තැනගේ නමට එවිය යුතුයි. සීල් තැබූ ටෙන්ඩර් පත්‍රය බහාලන කවරයේ වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහාද යන්න සඳහන් කළ යුතුයි. ඒ කවරයේ ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනයද සඳහන් කළ යුතුයි. ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ කොන්ත්‍රාත්තු පිළිබඳ ගණකාධිකාරිවරයාට පුද්ගලිකව භාර දී හෝ එය ලැබුණ බවට කුවිතාන්සියක්ද ලබාගත හැක. ටෙන්ඩර් කරුවන්ට තම ටෙන්ඩර්පත් ලියාපදිංචි තැපැලෙන්ද එවීමට පුළුවන. ටෙන්ඩර් පත් භාර ගන්නා අවසාන දින පෙරවරු 10 ට පසු තැපැලෙන් එවන හෝ පැමිණ භාරදෙන සෑම ටෙන්ඩරයක්ම ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

8. එක් ආයතනයක් සඳහා සැපයිය යුතු ආහාර ප්‍රමාණය දළ වශයෙන් ආයතනය භාර වෛද්‍ය නිලධාරිතුමාගෙන් හෝ මෙම කාර්යාලයෙන් ලබාගත හැකිය.

9. ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩරයක් ඉල්ලුම් කරන විට එහි අඩංගු කොන්දේසි හොඳින් දැන ගත යුතුවාක් මෙන්ම ඒවා පිළිපැදිය යුතුද වන්නේය.

10. කිසිම විමසුමක් නොමැතිව ටෙන්ඩරය සම්පූර්ණයෙන් හෝ කොටසක් භාර ගැනීමද නැතහොත් සියළුම ටෙන්ඩර් හෝ කොටසක් ප්‍රතික්ෂෙප කිරීමේ බලය රජය සතුව ඇත.

11. වැඩි විස්තර මෙම කාර්යාලයට අයදුම් පතක් එවීමෙන් දැන ගත හැකිය.

ඇස්. ඥානසේගරම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

ගාලු මුවදොර පිහිටි
සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මුදල් අංශය,
තැ. පෙ. 584, මහලේකම් ගොඩනැගිල්ල,
කොළඹ, 11.7.1960.

### උපලෙඛනය

| (1) සේවය | (2) ටෙන්ඩර සඳහා තැන්පත් මුදල | (3) ඇප මුදල | (4) ටෙන්ඩර භාර ගන්නා අවසාන දිනය හා වේලාව |
|---|---|---|---|
| | රු. | රු. | |
| කොළඹ වෛද්‍ය පර්යෙෂණායතනයට සහ කොළඹ මහාරෝග්‍යශාලාවට සතුන් සැපයීම | 100 ... | 800 | |
| **දර සැපයීම—** | | | |
| වැලිසර ළය රෝහලට සහ කඳාන විවේකාගාරය | 100 ... | 600 | |
| රාගම ළය රෝහල සහ උතුරු කොළඹ රෝහල රාගම | 100 ... | 600 | |
| හැඳල ලාදුරු රෝහල ... | 100 ... | 600 | 11. 8. 60 පෙ. ව.10ට |
| අංගොඩ මානසිකා රෝහල ... | 100 ... | 200 | |
| **කණ සැපයීම—** | | | |
| කොළඹ වෛද්‍ය පර්යෙෂනාගාරය... | 100 ... | 400 | |
| **අයිතිකම් නොකියන සද මෘත ශරීර අස්කිරීම හා වැළලීම—** | | | |
| මහනුවර රෝහළ ... | 100 ... | 300 | |
| කුලියාපිටිය රෝහල ... | 100 ... | 150 | |
| අනුරාධපුර රෝහල ... | 100 ... | 150 | |
| තිරිකුණාමල රෝහල ... | 100 ... | 150 | |

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### කිළිටි රෙදි සේදීම

**සේවාව සහ ටෙන්ඩර්කරුවන්ගේ සුදුසුකම් :**

1960 ඔක්තෝබර් 1 වැනි දින සිට 1961 සැප්තැම්බර් 30 වන දයින් (දින දෙකත් ඇතුළුව) අවසන්වන වර්ෂය තුළ, මෙහි පහත සඳහන් උපලේඛනයේ පළවෙනි වගන්තියෙහි දක්වා තිබෙන ආයතනයන්හි කිළිටි රෙදි සේදීම සඳහා, ලාංකිකයන් හා ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර කොළඹ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරයා විසින් බාරගනු ලැබේ.

2. **ටෙන්ඩර් තැන්පත් මුදල් :**

(i) මෙම උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරණලද මුදල මා නමට, කොළඹ හැර අනිකුත් කච්චේරියක හෝ කොළඹ බ්‍රිස්ටල් වීදියේ ඇති ලංකා බැංකුවේ හෝ තැන්පත්කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි. කොළඹ ලංකා බැංකුවේ මුදල් තැන්පත් කිරීම සඳහා වුවමනා පෝර්ම මෙම කාර්යාලයෙන් ලබාගත යුතුයි.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු බස්නාහිර පළාතේ ආයතනයන් සඳහා මෙම කාර්යාලයෙන්ද අනිත් පළාත්වල ආයතනයන් සඳහා ආයතානයන්භාර වෛද්‍ය නිලධාරින්ගෙන්ද ටෙන්ඩර් පෝර්ම ලබාගතහැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි.

ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම්පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර :**

මෙම දෙපාර්තමේන්තුවේ දැනට කොන්ත්‍රාත්තුවක් නොදරන අය ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමට සැලකියයුතු කාලයකට පළමු තම වත්කම, මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට සතුටු ආයතන භාර වෛද්‍ය නිලධාරියාට හෝ දැන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡෙදයේ දෙවන කොටසේ සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක.

වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරණලද මුදල අහිමිවන්නට ඉඩ තිබේ.

**4. සෝදන කැලි ප්‍රමාණය පිළිබඳ විස්තර :**

දළ වශයෙන් මාසයකට සේදිය යුතු කැලි ප්‍රමාණය මේ සමග ඇති උපලේඛනයෙහි 4වැනි වගන්තියෙහි දක්වා ඇත.

**5. ටෙන්ඩර් එවිය යුතු අන්දම :**

සියළුම ටෙන්ඩරපත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා ''සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, ''බී'' අක්ෂරය දරණ ගොඩනැගිල්ල, මුදල් අංශය, මහා ලේකම් කායර්‍යාලය, ගාලු මුවදෙර, කොළඹ'' කියා එවිය යුතුයි. සීල් කරණලද ටෙන්ඩර්පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවද යන්න පැහැදිලිව සඳහන් කළයුතුවාක් මෙන්ම එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළයුතුය. කවරයෙහි බහනලද ටෙන්ඩර්පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම ගණකාධිකාරී මහතාට (සැපයීම් සහ කොන්ත්‍රාත්තු) දීමෙන් ඒ ලැබුණු බවට ඔහු විසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියා පදිංචිකළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

**6. ටෙන්ඩර්පත් භාර ගන්නා අවසාන දිනය :**

මෙහි පහත පෙනෙන උපලේඛනයේ 5 තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන්වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ·

**7. ටෙන්ඩර් පත් විවෘත කිරීම :**

ටෙන්ඩර් පත් විවෘතකිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. · ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන්ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර කරුවෙකු ඉදිරිපත් කරනලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කටයුතු පිළියෙල කර ගැනීම හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

**8. ටෙන්ඩරයන්හි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව :**

ටෙන්ඩර් කරුවන් විසින් සඳහන් කරනලද මිළගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාල සීමාව ඉකුත්වනතුරු වලංගුවේ. කොන්ත්‍රාත්කරුගේ පොරොන්දුපත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම් එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

**9. තැන්පත් ඇප මුදල් :**

තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇපමුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

**10. ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි :**

ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවන්වීමට බලාපොරොත්තුවන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැන ගතයුතුවාක් හැර පිළිපැදිය යුතුද වන්නේය.

**11. අතික් විස්තර :**

(i) කොන්ත්‍රාත් කරුවන්ට ගබඩා, විදුලි බලය, ජලය ආදී පහසුකම් සැලසුවහොත් ඊට යන වියදම් ආදිය පළාතේ ආදයම් පාලක නිලධාරිතුමා තක්සේරු කළ ගණන්වලට අනුව වවුචරයෙන් කපා ගනු ලැබේ.

**(ii) කිළිටු රෙදිවල විෂබීජ නැති කිරීම සහ එහා මෙහා ගෙනයාමේ වියදම් .**—යම් අවස්ථාවක කිළිටු රෙදි සේදීමට පළමු ඒවායේ විෂබීජ නැති කිරීම සඳහා වෙන ස්ථානයකට ගෙනයාමට සිදු වුවහොත් ඒවා එහා මෙහා ගෙනයාමට කිසිම ගාස්තුවක් ගෙවනු නොලැබේ.

**(iii) පළාත් පාලන මණ්ඩලවල පිහිටා ඇති ආයතනයන් සඳහා ටෙන්ඩර්.**—පළාත් පාලන මණ්ඩල තුළ ඇති ආයතනයන්ට ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක්කේ, ඒ ඒ මණ්ඩලවල නීතිවලට අනුව (නීති ඇතොත්) රෙදි පිරිසිදු කරණ ස්ථාන හිමි අයට පමණි.

(iv) ටෙන්ඩර්කරුවන්ට උවමනා නම් කොටසක් හෝ සෑම කොටසක්ම ඒවාට නියමිත තැන්පත් මුදල බැඳීමෙන් පසු සඳහන් කළ හැකිය.

1960 ජුලි මස 11 දින,
කොළඹ, ගාලුමුවදෙර මහලේකම් කායර්‍යාලය යාබද ''බී''
අක්ෂරය දරණ ගොඩනැගිල්ලේ පිහිටි
සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ, මුදල් අංශයේදීය.

ඇස්. ඥාණසේගරම්,
සෞඛ්‍ය අධ්‍යක්ෂ වෙනුවට.

## උපලේඛනය

| (1) ආයතනය | (2) ටෙන්ඩර් තැන් පත් මුදල රු. | (3) ඇප මුදල රු. | (4) මසකට රෙදි සේදිය යුතු වාර ගණන | (5) මසකට සේදිය යුතු සාමාන්‍ය කැලි ගණන | (6) භාරගැනීම අවසන් වන දිනය හා වේලාව |
|---|---|---|---|---|---|
| **අංගොඩ මානසිකාරෝග්‍ය ශාලාව—** | | | | | |
| (1) වැනි අංශය.—පිරිමි වාට්ටු : 1ඒ, 1බී, 1සී, 2ඒ, 2බී, සහ 2සී ... ... | 100 0 ... | 200 0 ... | 8 ... | 8,200 | |
| (2) වැනි අංශය.— ගැහැණු වාට්ටු : 1ඒ, 1බී, 1සී, 2ඒ, 2බී සහ 2සී ... ... ... | 100 0 ... | 200 0 ... | 8 ... | 8,200 | |
| (3) වැනි අංශය.—පිරිමි වාට්ටු : 3ඒ, 3බී, 3සී, ඇන්, පී. ඩබ්ලිව්, ඇල්, සී, ඩබ්ලිව් ... ... ගැහැණු වාට්ටු : 3ඒ, 3බී, 3සී ... ... | 100 0 ... | 200 0 ... | 8 ... | 8,950 | |
| (4) වැනි අංශය.— ක්ෂය සහ බෝවෙන රෝග පිරිමි වාට්ටු : ඒ, බී, ඇල්, සී, ඩබ්ලිව් 3, 5 සහ ඇන්, ඩී, ඩබ්ලිව්,ගැහැණු අංශය.—සී, සහ ඩී ... | 100 0 ... | 200 0 ... | 8 ... | 5,075 | |
| (5) වැනි අංශය.—මිශ්‍ර පිරිමි නිවාස, ගැහැණු නිවාස, මුළු තැන්ගෙය ඩිස්පැන්සරි කායර්‍යාලය, දන්ත චිකිත් සාගාරය, ලැබෝටරිය, ඇක්ස්රේ කාමරය ... | 100 0 ... | 200 0 ... | 4 ... | 1,950 | |
| වතුපිටිවල සිවිල් ආරෝග්‍යශාලාව ... ... | 100 0 ... | 200 0 ... | 4 ... | 3,900 | |
| කොළඹ වික්ටෝරියා ඇස්රෝහල ... ... | 100 0 ... | 500 0 ... | 4 ... | 7,525 | |
| ද සොයිසා කාන්තා රෝහල, 1වෙනි අංශය වාට්ටු : 2, 5, 12, ප්‍රසූතිකා කාමරය, ''ඉ'' සහ ප්‍රධාන ශල්‍යාගාරය | 100 0 ... | 200 0 ... | 26 ... | 19,375 | 9.8.60 පෙ. ව. 10 |
| (2) වැනි අංශය.— වාට්ටු 8, 9, 10, 15 විශ්‍රාම ශාලාව, ප්‍රසූතිකා කාමරය ''ඒ'' සහ ''බී'' ... ... | 100 0 ... | 200 0 ... | 26 ... | 15,625 | |
| (3) වැනි අංශය වාට්ටු 7, 11, 17 වින්නඹු ශිෂ්‍යාවනගේ නිවාස, නේවාසික වෛද්‍ය නිලධාරින්ගේ සේවා කාමර, පූර්වක ප්‍රසව චිකිත්සාගාරය, ප්‍රධාන මුළුතැන්ගෙය | 100 0 ... | 200 0 ... | 26 ... | 10,125 | |
| (4) වාට්ටු 3, 14, 16 අඩු මැසි ළදරු කාමර බාහිර ලෙඩුන්ගේ අංශ ප්‍රසූතිකා කාමර සී සහ ඩී ... ... | 100 0 ... | 200 0 ... | 26 ... | 16,125 | |
| **කොළඹ මහාරෝග්‍ය ශාලාව—** | | | | | |
| කොළඹ මහාරෝග්‍යශාලාවේ මිනිසුන් සහ හිරගෙදර ලොන්ඩරියේ වැඩිපුරසේදූ කිළිටි රෙදි සේදීම සඳහා - | | | | | |
| (1) වැනි අංශය වාට්ටු නො. 1, 3, 5, 7 සහ 10 ... | 100 0 ... | 200 0 ... | 4 ... | 3,850 | |
| (2) වැනි අංශය වාට්ටු නො. 2,4,ඒ, 4බී, සහ 6 ... | 100 0 ... | 200 0 ... | 4 ... | 4,425 | |
| (3) වැනි අංශය වාට්ටු නො. 8, 12, 13, 14, 15, 16 සහ 17 | 100 0 ... | 200 0 ... | 4 ... | 2,200 | |
| (4) වැනි අංශය වාට්ටු : 18, 19, 20, සහ 21 ... | 100 0 ... | 200 0 ... | 4 ... | 1,350 | |

| (1) ආයතනය | (2) ටෙන්ඩර් තැන් පත් මුදල රු. | (3) ඇප මුදල රු. | (4) මසකට රෙදි සේදිය යුතු වාර ගණන | (5) මසකට සේදිය යුතු සාමාන්‍ය කැලි ගණන | (6) භාරගැනීම අවසන් වන දිනය හා වේලාව |
|---|---|---|---|---|---|
| (7) වැනි අංශය වාට්ටු : 40ඒ, 40බී, 41ඒ, 41බී ... 42ඒ, 42බී, 43ඒ, 43බී, දෙවෙනි මාලය 45ඒ, 45බී, 46ඒ, 46බී, තුන්වැනි මාලය ... ... | 100 0 ... | 200 0 ... | 4 ... | 2,025 | |
| (10) වැනි අංශය.— වාට්ටු 37, 39 වැව්ලිකරුවන්ගේ වාට්ටුව, වෙළඳුන්ගේ වාට්ටුව, සහ අනිත් ගෙවන වාට්ටු, පරණ සහ අළුත් ගොඩනැගිල්ලට අයිති සහ ලේබෑංකුව | 100 0 ... | 200 0 ... | 8 ... | 2,550 | |
| (11) වාට්ටුවල සේවකයන්ගේ කිළිටිරෙදි නො. 1 සිට 14 දක්වා මොක්ස් අනුස්මරණ වාට්ටුව ... | 100 0 ... | 200 0 ... | 4 ... | 2,800 | |
| (12) වැනි අංශය.— වාට්ටු නො. 15 සිට 29 දක්වා ඇති සේවකයන්ගේ කිලිටි රෙදි සහ කාන් අනුස්මරණ වාට්ටු, සහ වාට්ටු නො. 40, 41, 42, 43, 45, 46 සහ ඇන්, ඇස්, යූ සහ ගෙවන වාට්ටු ... ... | 100 0 ... | 200 0 ... | 4 ... | 2,500 | |
| (13) වැනි අංශය,—කොළඹ රෝහල් සමූහයෙහි අධිකාරී තැනගේ කායඹාලය, මහාරෝග්‍යශාලාවේ වෛද්‍ය අධිකාරී තැනගේ කායඹාලය, වෛද්‍ය රපෝර්තු කායඹාලය, බාහිර නිලධාරි මණ්ඩලයේ කාමරය, ගිලන් රථ ගරාජය, රශ්මි විකිත්සා අංශය සහ කාය විකිස්සා අංශය, කායික විද්‍යා පාඨශාලාව, අභ්‍යන්තර ඩිස්පැන්සරිය, කිරි කාමරය, රෝග නිධාන විද්‍යා පරීක්ෂණාගාරය, ජීව රසායන විද්‍යාගාරය සහ විකලාංග විකිත්සාගාරය ... ... | 100 0 ... | 200 0 ... | 4 ... | 2,800 | 9.8.60 පෙරවරු 10ට |
| (14) වැනි අංශය.—වෛද්‍ය බාහිර රෝගීන්ගේ අංශය, ශල්‍යකර්ම බාහිර රෝගීන්ගේ අංශය බාහිර රෝගීන්ගේ අංශයේ දිස්පැන්සරිය, බාහිර රෝගීන්ගේ අංශයේ ඇක්ස්රේ කාමරය, රෝග නිධාන විද්‍යා පරීක්ෂණාගාරය ස්නායුමාන සම්බන්ධාබාධ විකිත්සාගාරය සහ ළමා උපදේශ විකිත්සාගාරය ... .. | 100 0 ... | 200 0 ... | 4 ... | 1,600 | |
| (15) වැනි අංශය. --රිජන්ට් වීදි අංශයෙහි වාට්ටුවල සේවකයින්ගේ කිළිටු රෙදි ... .. | 100 0 ... | 200 0 ... | 4 ... | 650 | |
| (16) වැනි අංශය.—ප්‍රධාන කුස්සියේ සේවකයන්ගේ කුස්සියේ සහ රිජන්ට් වීදියේ අංශවල කුස්සියේ කිළිටු රෙදි ... ... ... | 100 0 ... | 200 0 ... | 8 ... | 1,150 | |
| නුවර මහාරෝග්‍ය ශාලාව— | | | | | |
| (1) වැනි අංශය.—ලේ බැංකුව සහ ප්‍රෙසර් අනුස්මරණ ගෙවීම් වාට්ටුවේ 1 වැනි සහ 2 වැනි වාට්ටු ... | 50 0 ... | 100 0 ... | 8 ... | 4,675 | |
| (2) වැනි අංශය.—ශල්‍යාගාරය ... ... | 50 0 ... | 100 0 ... | 10 ... | 6,650 | |
| (3) වැනි අංශය.—වාට්ටු නොම්මර 8. 9, 17 සහ 18 ... | 50 0 ... | 100 0 ... | 8 ... | 5,300 | |
| (4) වැනි අංශය.—වාට්ටු 14 සහ 15, ඇස් විකිත්සාගාරය සහ කන්, නාසා, උගුර පිළිබඳ විකිත්සාගාරය ... | 50 0 ... | 100 0 ... | 8 ... | 3,975 | |
| (5) වැනි අංශය.—වාට්ටු නො. 1, පාලක කායඹාලයේ කාමර, ඕ.පී.ඩී., නේවාසික වෛද්‍යවරුන්ගේ සහ ඇපෝතිකරි වරුන්ගේ සේවා කාමර, ඇක්ස්රේ දෙපාර්තමේන්තුව, ගිලන්රථ ගරාජය, සහ කුස්සිය ... | 50 0 ... | 100 0 ... | 8 ... | 1,350 | |
| (6) වැනි අංශය.—වාට්ටු 11 බී සහ 13 ... ... | 50 0 ... | 100 0 ... | 8 ... | 4,675 | |
| (7) වැනි අංශය—7 වැනි වාට්ටුව (කලින් 20 වැනි වාට්ටුව) ... ... ... | 50 0 ... | 100 0 ... | 10 ... | 1,850 | 10.8.60 පෙරවරු 10ට |
| (8) වැනි අංශය.—වාට්ටු නො. 12ඒ, 12බී, 16 සහ සාත්තුසේවිකාවන්ගේ වාට්ටුව ... ... | 50 0 ... | 100 0 ... | 8 ... | 3,875 | |
| (9) වැනි අංශය. —වාට්ටු නො. 3ඒ, 3බී, 5, 6, 11ඒ සහ අතිරේක වාට්ටුව ... ... ... | 50 0 ... | 100 0 ... | 8 ... | 2,150 | |
| (10) වැනි අංශය.—වාට්ටු නො. 4 සහ 20 ... | 50 0 ... | 100 0 ... | 8 ... | 4,700 | |
| (11) වැනි අංශය—බෝවන රෝගීන්ගේ වාට්ටුව ... | 50 0 ... | 100 0 ... | 8 ... | 450 | |
| (12) වැනි අංශය.—වාට්ටු නො. 2 කායික විද්‍යා අංශය, රෝග නිධාන විද්‍යා පරීක්ෂණාගාරය, දන්ත විකිත්සාගාරය, මාතෘ විකිත්සාගාරය, ශල්‍ය විකිත්සාගාරය සහ වෛද්‍ය විකිත්සාගාරය ... ... | 50 0 ... | 100 0 ... | 8 ... | 1,700 | |
| (13) වැනි අංශය.—වාට්ටු නො. 19 සහ 20 ... | 50 0 ... | 100 0. ... | 8 ... | 2,475 | |
| කුරුණෑගල මහාරෝග්‍යශාලාව— | | | | | |
| (1) වැනි අංශය—ගෙවන වාට්ටු නො. 17,18, 19 සහ 20 | 50 0 ... | 100 0 ... | 3 ... | 4,950 | |
| (2) වැනි අංශය—වාට්ටු නො. 1,2,3,5,6,7,8,13 සහ 21 | 50 0 ... | 100 0 ... | 3 ... | 3,450 | |
| (3) වැනි අංශය—වාට්ටු නො. 14ඒ, 14බී, 15, 16, ශල්‍යාගාරය සහ ප්‍රසූති කාමරය ... ... | 50 0 ... | 100 0 ... | 10 ... | 3,000 | |
| (4) වැනි අංශය—වාට්ටු නො. 9, 10, 11, 12, ඇක්ස්රේ දෙපාර්තමේන්තුව, කුස්සිය, රෝග නිධාන විද්‍යා පරීක්ෂණාගාරය, ලේ බැංකුව, දන්ත විකිත්සාගාරය, සහ මේට්‍රන්ගේ කායඹාලය ... ... | 50 0 ... | 100 0 ... | 3 ... | 1,800 | 10.8.60 පෙරවරු 10ට |
| (5) වැනි අංශය—කාශරෝග වාට්ටුව (පිරිමි), කාශරෝග වාට්ටුව (ගැහැණු), බෝවන රෝග වාට්ටුව (පිරිමි), බෝවන රෝග වාට්ටු (ගැහැණු), සමාජ රෝග විකිත්සාගාරය, ඇස් විකිත්සාගාරය, තුවාලවලට බෙහෙත් දමන කාමරය, බාහිර රෝගීන්ගේ ඩිස්පැන්සරිය, ඇස්, නාසා සහ උගුර පිළිබඳ විකිත්සාගාරය, ඇතුල් කරගන්නා කාමරය, නේවාසික වෛද්‍ය නිලධාරීන්ගේ සේවා කාමරය ... ... ... | 50 0 ... | 100 0 ... | 3 ... | 1,150 | |
| (6) වැනි අංශය—ළමා වාට්ටුව ... ... | 50 0 ... | 100 0 ... | 10 ... | 1,250 | |

| (1) ආයතනය | (2) ටෙන්ඩර් තැන්පත් මුදල රු. | (3) ඇප මුදල රු. | (4) මසකට රෙදි සෝදිය යුතු වාර ගණන | (5) මසකට සෝදිය යුතු සාමාන්‍ය කෑලි ගණන | (6) භාරගැනීම අවසන් වන දිනය හා වේලාව |
|---|---|---|---|---|---|
| යාපනයේ මහාරෝගශාලාව— | | | | | |
| (1) වැනි අංශය—වාට්ටු නො. 1, 2, 3 සහ 4 ... | 50 0 ... | 100 0 ... | 3 ... | 6,200 | |
| (2) වැනි අංශය—වාට්ටු නො. 5, 6, 8 සහ 10 ... | 50 0 ... | 100 0 ... | 3 ... | 5,900 | |
| (3) වැනි අංශය—වාට්ටු නො. 7, 11, 13, 9 ඇක්ස්රේ දෙපාර්තමේන්තුව සහ බාහිර රෝගීන්ගේ අංශය ... | 50 0 ... | 100 0 ... | 3 ... | 6,200 | |
| (4) වැනි අංශය—ශල්‍ය කාමරය ... ... | 50 0 ... | 100 0 ... | 4 ... | 6,975 | |
| කන්කසන්තුරේ සිවිල් ආරෝග්‍යශාලාව— | | | | | |
| (1) වැනි අංශය—සිවිල් ... ... | 50 0 ... | 100 0 ... | 3 ... | 2,825 | |
| (2) වැනි අංශය—කාශරෝග ... ... | 50 0 ... | 100 0 ... | 3 ... | 2,750 | |
| කරවනැල්ල සිවිල් ආරෝග්‍යශාලාව ... ... | 50 0 ... | 100 0 ... | 3 ... | 3,800 | |
| ගාල්ලේ මහාරෝගශාලාව— | | | | | |
| (1) වැනි අංශය—වාට්ටු නො. 12, 13, 14, 15, 16, 17, 18, 21 සහ 22, කුස්සිය, හදිසි තුවාලකරුවන්ගේ කාමරය, රසායනාගාරය, සහ තලපිටිය මාතෘ නිවාසය ... | 50 0 ... | 100 0 ... | 4 ... | 4,250 | 10,8.60 පෙරවරු 10ට |
| (2) වැනි කොටස—වාට්ටු නො. 1,2,3,4,5,6,7,9,11 රෝගීන් වෙන්කර තබන වාට්ටුව, ඇක්ස්රේ දෙපාර්තමේන්තුව ... ... ... | 50 0 ... | 100 0 ... | 4 ... | 4,550 | |
| (3) වැනි අංශය—අක්ෂි දෙපාර්තමේන්තුව, පරණ ගෙවීමේ වාට්ටු (ගැහැණු සහ පිරිමි), මෙමෝරියල් වාට්ටු නො. 1 සහ 2 ... ... ... | 50 0 ... | 100 0 ... | 4 ... | 1,575 | |
| (4) වැනි අංශය—ශල්‍ය කාමරය ... ... | 50 0 ... | 100 0 ... | 10 ... | 4,650 | |
| (5) වැනි අංශය—වාට්ටු නො. 10,19 සහ 20 ... | 50 0 ... | 100 0 ... | 6 ... | 2,225 | |
| රත්නපුර සිවිල් ආරෝග්‍යශාලාව— | | | | | |
| (1) වැනි අංශය—ශල්‍ය කාමරය, මාතෘ සහ ජයිනිකොලජිකල් වාට්ටු (වාට්ටු නො. 1 සහ 2) ... | 100 0 ... | 200 0 ... | 6 ... | 7,000 | |
| (2) වැනි අංශය—වාට්ටු නො. 1 සහ 2 හැර අනික් වාට්ටු සහ අංශ, එනම් : ඕ.පී.ඩී. චිකිත්සාගාර, කුස්සික බෝවන රෝග පිළිබඳ අංශය, දිස්පැන්සරිය සහ 1 වැනි අංශයට අයුනොවන අනික් අංශ ... ... | 100 0 ... | 200 0 ... | 4 ... | 10,000 | |

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—මාතර කොට්ඨාශය

### බඩු බාහිරාදිය එහාමෙහා ගෙනයාම

1960 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට 1962 සැප්තැම්බර් 30 වෙනිදායින් අවසන් වන දෙවර්ෂය තුළ මෙයට යාකොට ඇති උපලේඛනයේ සඳහන් දුම්රිය ස්ථාන බාහිර බඩු ගබඩා හා සෞඛ්‍ය ආයතනයන් අතර බඩු බාහිරාදිය එහා මෙහා ගෙනයාම සඳහා වෙන් වශයෙන් සීල් තැබූ ටෙන්ඩර් පත් ලාංකියන්ගෙන් හෝ ලාංකික වෙළඳ සමිති හා සමාගම් වලින් මාතර සෞඛ්‍ය සේවාධිකාරි තැන විසින් භාරගනු ලැබේ.

2. 1960 අගෝස්තු මස 2 වෙනි දින පෙරවරු 10ට ටෙන්ඩර් පත් භාරගැනීම අවසන්වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන් ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් හා ඔවුන් විසින් ටෙන්ඩර් පත්‍රවල සඳහන් කරන ලද මිල ගණන්ද පැමිණ සිටින්නන් ඉදිරියේ කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවෙකුට ටෙන්ඩර් පත්‍ර පරීක්ෂාකර බැලීමට අවශ්‍ය වුව හොත් සෞඛ්‍ය සේවා අධිකාරි තැනගේ හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ වෙනත් නිලධාරියකුගේ අනුමතිය ඇතිව ඒවායේ අනුපිටපත් පරීක්ෂා කළ හැක.

3. මෙම කායර්‍යාලයෙන් හෝ කොළඹ, කළුතර, ගාල්ල, මඩකලපුව, බදුල්ල, මාතලේ, මහනුවර, කුරුණෑගල, කෑගල්ල, පුත්තලම, රත්නපුර, අනුරාධපුර, වව්නියාව සහ යාපනය යන ස්ථානවල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරීන්ගේ කායර්‍යාලවලින් ලබාගන්නා ලද ටෙන්ඩර් පෝර්ම අනුපිටපතක්ද සමග එවිය යුතුය. අයදුම්කරුවන් විසින් මෙයට යාකොට ඇති උපලේඛනයේ දෙවෙනි තීරයේ සඳහන් මුදල කච්චේරියේ තැන්පත් කොට ඒ සඳහා ලබාගත් කුවිතාන්සිය ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනයට පෙර දින දවල් 12ට පෙර ඉදිරිපත් කර අවශ්‍ය පෝර්ම ලබාගත යුතුයි.

4. තැපෑලෙන් ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කරන අය මුදල් තැන්පත් කළ කුවිතාන්සි කල්වේලා ඇතිව එවීමෙන් අවසාන දිනයට ප්‍රථම ටෙන්ඩර් එවීම සඳහා පෝර්ම ලබාගත හැකිය.

5. සෑම ටෙන්ඩරයක්ම මාතර සෞඛ්‍ය සේවා අධිකාරි තැනගේ නමට එවිය යුතුය. සීල්තැබූ ටෙන්ඩර් පත්‍රය එවන කවරයේ වම් පස උඩ කෙළවරේ සේවයේ විස්තර පැහැදිලිව ලිවිය යුතුය. එම කවරයේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය සඳහන් කළ යුතුයි. ටෙන්ඩර් පත්‍ර මෙම කායර්‍යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමිය හැකිය. නැතහොත් මාතර සෞඛ්‍ය සේවා අධිකාරි තැනට පුද්ගලිකව භාරදී එය ලැබුනු බවට කුවිතාන්සියක් ලබාගත හැකිය. ටෙන්ඩර් කරුවන්ට සිය ටෙන්ඩර් පත් ලියාපදිංචි කළ තැපෑලෙන් එවීමට පුළුවන. ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දින පෙරවරු 10ට පසු තැපෑලෙන් ලැබෙන හෝ පැමිණ භාර දෙන සෑම ටෙන්ඩරයක්ම ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

6. සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ දැනට කොන්ත්‍රාත්තුවක් නොදරණ අය ටෙන්ඩර් පත්‍ර ඉල්ලා එවීමට පෙර තමන්ගේ වර්තාකම පිළිබඳ තොරතුරු මට හෝ ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට බලාපොරොත්තු වන නිලධාරීන්ට දැන්විය යුතුයි. ඒ සඳහා අවශ්‍ය පෝර්ම මෙම කායර්‍යාලයෙන් හෝ තුන්වන ඡෙදයේ සඳහන් සෞඛ්‍ය සේවා අධිකාරි කායර්‍යාලවලින් ලබාගත හැකිය. දැනට මෙම දෙපාර්තමේන්තුවේ කොන්ත්‍රාත්තු දරණ අයදුම්කරුවන් ඒ බව සඳහන් කළ යුතුයි. දැනට මෙම දෙපාර්තමේන්තුවේ කොන්ත්‍රාත්තු නොදරන අය තම තමන්ගේ වර්තාකම් පිළිබඳ තොරතුරු සපයා තිබේද? එසේ නම් කවරකු වෙතද යන්න සඳහන් කළ යුතුයි.

ටෙන්ඩර්කරුවන්ගේ මුදල් තත්ත්වයේ ස්ථිර භාවය පිළිබඳ තොරතුරු දැනගැනීමට ප්‍රථම ඔවුන් විසින් එවන ලද ටෙන්ඩර් භාර ගැනීමට නොහැකි බැවින් තම තමන්ගේ වර්තාකම් පිළිබඳ තොරතුරු කල්වේලා ඇතිව සපයා එවිය යුතුයි.

7. පහත සඳහන් කොන්දේසිවලට ටෙන්ඩර්කරුවන්ගේ අවධානය මෙයින් යොමු කරනු ලැබේ :—

(අ) බඩුබාහිරාදිය එහා මෙහා ගෙනයාමේදී සැතපුම් භාගය හා ඉන් වැඩි කොටස සැතපුමක් ලෙස ගණන් බලා මුදල් ගෙවනු ලැබේ. සැතපුම් භාගයට අඩු දුර ප්‍රමාණයට නියම දුර ප්‍රමාණයේ මුදල ගෙවනු ලැබේ.

(ආ) ටොන් එකක්ට වඩා බර එහා මෙහා ගෙනයාමට ප්‍රදේශයේ ආදායම් පාලක නිලධාරි තැනගේ නිර්දේශය අනුව ගෙවනු ලැබේ.

(ඉ) අළුතෙන් විවෘත කරන ආයතනවල බඩු බාහිරාදිය එහාමෙහා ගෙන යාමට ප්‍රාදේශීය ආදායම් පාලක තැනගේ ගණන් අනුව ගෙවනු ලැබේ.

8. ටෙන්ඩර් පෝර්මයේ පිට පැත්තේ කොන්දේසි දක්වා ඇත. ටෙන්ඩර් ඉදිරිපත් කරන විට මෙම කොන්දේසි පිළිපැදිය යුතුයි. කිසිම හේතුවක් නොදක්වා යම්කිසි ටෙන්ඩරයක් හෝ ටෙන්ඩර් සියල්ලම ප්‍රතික්ෂෙප කිරීමේ බලය දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත.

ඇෆ්. වී. අබේනායක,
සෞඛ්‍ය සේවාධිකාරි තැන.

1960 ජූලි මස 5 දින,
මාතර, සෞඛ්‍ය සේවාධිකාරී කායර්‍යාලයේදීය.

### උපලේඛනය

| 1 සේවය | 2 ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල රු. ශ. | 3 ඇප මුදල රු. ශ. |
|---|---|---|
| සෞඛ්‍ය ආයතන හා පහත සඳහන් දුම්රිය ස්ථාන/බාහිර බඩු ගබඩා අතර බඩු බාහිරාදිය එහා මෙහා ගෙනයාම— | | |
| මාතර සහ හම්බන්තොට දිස්ත්‍රික්කය— | | |
| වැලිගම හා මාතර ... ... | 100 0 ... | 400 0 |
| දික්වැල්ල හා බෙලිඅත්ත ... ... | 100 0 ... | 400 0 |
| තංගල්ල, රන්න, හුංගම, අම්බලන්තොට හම්බන්තොට හා තිස්සමහාරාමය ... | 100 0 ... | 400 0 |

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### බඩු එහා මෙහා ගෙනයාම

1960 ඔක්තෝබර් මස පළමුවෙනි දින සිට 1962 සැප්තැම්බර් 30 දක්වා වූ කාලය තුළ මෙහි උපලේඛනයෙහි සඳහන් දුම්රිය ස්ථානවල සහ බාහිර ඒජන්සිවල සිට වෛද්‍යායතනවලට බඩු එහා මෙහා ගෙන යාම සඳහා ලාංකිකයින්ගෙන් හෝ ලාංකික වෙළඳ සමාගම්වලින් හෝ වෙළඳයාතනවලින් හෝ වෙන වෙනම සීල් තබනලද ටෙන්ඩර් යාපනේ සෞඛ්‍ය සේවා අධිකාරී තැන විසින් ඉහත සඳහන් උප ලේඛනයේ 4 වැනි තීරයේ සඳහන් දිනවල පෙරවරු 10 වන තෙක් භාර ගනු ලැබේ.

(2) උපලේඛනයේ 4 වැනි තීරයේ සඳහන් දිනවල පෙරවරු 10 ට ටෙන්ඩර් භාර ගැනීම නැවැත්වූ පසු ඒ අවස්ථාවේදීම විවෘත කරණු ලැබේ. ටෙන්ඩර් විවෘත කෙරෙන අවස්ථාවේ ටෙන්ඩර්කරුවන්ට එහි සිටිය හැක. පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේ ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ සඳහන් කර ඇති මිල ගණන්ද කියවනු ලැබේ. යම් ටෙන්ඩර්කරුවෙකුට ටෙන්ඩරයක් පරීක්ෂා කිරීමට උවමනා උවහොත් අධිකාරිතුමා හෝ ඔහුගේ නියෝජිතයා සමග ඒ සඳහා පිළිවල කර ගත් පසු ඉදිරිපත් කර ඇති ඕනෑම ටෙන්ඩරයක අනු පිටපත පරීක්ෂා කිරීමට අවසර දෙනු ලැබේ.

(3) මේ කාර්‍යාලයෙන් හෝ කොළඹ, කළුතර, ගාල්ල, මාතර බදුල්ල, මාතලේ, නුවර, කුරුණෑගල, කෑගල්ල, පුත්තලම, රත්න පුර, අනුරාධපුර, වවුනියා, මඩකලපුව යන ස්ථානවල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරී වරයන්ගේ කාර්‍යාලවලින් හෝ සපයනු ලබන පෝර්මවල අනු පිටපතකින් යුතුව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පෝර්ම සැපයීම සඳහා ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනට පළමු දින මධ්‍යාහ්න 12ට පෙර ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කරුවන් විසින් උප ලේඛනයේ 2 තීරයේ සඳහන් තැන්පත් මුදල් කච්චේරියක තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

(4) ටෙන්ඩර් පෝර්ම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන්නවුන්, අවසාන දිනට පෙර ටෙන්ඩර් පත්‍ර ලබාගෙන ඉදිරිපත් කිරීම සඳහා මුදල් තැන්පත් කළ බවට කුවිතාන්සිය කල් වේලා ඇතිව ඉදිරිපත් කළ යුතුය.

(5) සීල් තබනු ලැබූ ටෙන්ඩර් පත්‍ර බහාලන කවරයේ වම්පස උඩ කෙළවරේ සේවය හා ගණය පැහැදිලිව සඳහන් කර යාපනේ සෞඛ්‍ය සේවා අධිකාරිවරයා වෙත සියලුම ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයත් කවරයේ සඳහන් කළ යුතුයි.

ටෙන්ඩර් මේ කාර්‍යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමට හෝ සෞඛ්‍ය සේවා අධිකාරිවරයා වෙත පුද්ගලිකව භාරදීමට හෝ පුලුවන. භාරදුන් ටෙන්ඩර් ලැබුනු බවට කුවිතාන්සියක් අධිකාරිවරයා විසින් නිකුත් කෙරේ. ටෙන්ඩර්කරුවන්ට ලියා පදිංචි කළ තැපැලෙන්ද ටෙන්ඩර් එවිය හැක. ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දින පෙරවරු 10 ට පසුව තැපැලෙන් හෝ අන්විධියකින් මේ කාර්‍යාලයට ලැබෙන ටෙන්ඩර් භාර නොගන්නා බව ටෙන්ඩර්කරුවන් විසින් සැලකිය යුතුය.

(6) සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ කොන්ත්‍රාත් නොදරන්නා වුන් ටෙන්ඩර් පත්‍ර ඉල්ලුම් කිරීමට පෙර මා වෙත හෝ ටෙන්ඩර් පත්‍ර ඉල්ලුම් කරන නිලධාරින් වෙත හෝ ඔවුන්ගේ වත්කම් පිළිබඳ විස්තර ඉදිරිපත් කළ යුතුය. මේ සඳහා අවශ්‍ය පෝර්ම මේ කාර්‍යාල යෙන් හෝ ඉහත 3 වන ඡේදයේ සඳහන් සෞඛ්‍ය සේවා අධිකාරීන් වෙතින් ලබාගත හැක. දෙපාර්තමේන්තුවේ කොන්ත්‍රාත් දරණ ඉල්ලුම්කරුවන් විසින් ඒ බව සඳහන් කළ යුතුය. දෙපාර්ත මේන්තුවේ කොන්ත්‍රාත් නොදරන්නාවුන් ඔවුන්ගේ වත්කම් පිළිබඳ විස්තර සපයා තිබේද? එසේ නම් කාටද? යන වග සඳහන් කළ යුතුයි.

**සැ. යු.** ටෙන්ඩර්කරුවන්ගේ මුදල් තත්ත්වය සම්බන්ධව රපෝර්තු ලබාගැනීමට උවමනා නිසාත් එවැනි රපෝර්තු නොමැතිව ටෙන්ඩර් ගැන සලකා බැලීමට නොහැකි නිසාත් ටෙන්ඩර්කරුවන්ට ඔවුන්ගේ වත්කම් පිළිබඳ විස්තර අවසාන දිනට පෙර කල්වේලා ඇතිව සපයන ලෙස අවවාද කරනු ලැබේ.

(7) පහත සඳහන් කොන්දේසි ගැන ටෙන්ඩර්කරුවන් ඉතා සැලකිලිමත් විය යුතු බව දන්වමි :—

(අ) බඩු එහා මෙහා ගෙන යාමේදී සැතපුම් භාගයක් හෝ ඊට වැඩි දුරක් සඳහා සැතපුමක මුදලද සැතපුම් භාගයකට අඩු දුරක් සඳහා බඩු ගෙන ගිය නියම දුර ප්‍රමාණයට මුදල්ද ගෙවනු ලැබේ.

(ආ) ටොන් එකකට වැඩි ප්‍රමාණ සඳහා පළාතේ ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි තැන නිර්දේශ කරණු ලබන මිල ගණන් අනුව ගෙවනු ලැබේ.

(ඇ) පසුව විවෘත කරණු ලබන ආයතනවලට බඩු එහා මෙහා ගෙනයාම සඳහා ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි තැනගේ මිල ගණන් ගෙවනු ලැබේ.

(8) ටෙන්ඩර් කොන්දේසි ටෙන්ඩර් පෝර්ම වල පසු පිටේ ඇත. ටෙන්ඩරයක් ඉදිරිපත් කරන විට මේ කොන්දේසි ගැන ඉතා සැල කිලිමත් වනවා පමණක් නොව ඒ අනුව ක්‍රියා කළ යුතුද වේ. කාරණ යක් නොදන්වා යම්කිසි ටෙන්ඩරයක් හෝ ටෙන්ඩර් සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ බලය දෙපාර්තමේන්තුව සතුව ඇත.

ජී. ඇන්. ආර්. නතානයෙල්,
සෞඛ්‍ය සේවා අධිකාරී,
යාපනය.

1960 ජූලි මස 29 වෙනිදා,
යාපනේ සෞඛ්‍ය සේවා
අධිකාරී කාර්‍යාලයේ දිය.

### උපලේඛනය

| (1) සේවය | (2) තැන්පත් මුදල | (3) ඇප මුදල | (4) ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය හා වේලාව |
|---|---|---|---|
| පහත සඳහන් දුම්රිය ස්ථානවල සිට වෛද්‍යාතන දක්වා බඩු බාහිරාදිය එහා මෙහා ගෙන යාම—යාපනේ දිස්ත්‍රික්කය | රු. | රු. | — |
| "අ" ගණය | | | |
| මාන්කුලම, කිලිනොච්චි, පරන්තන් වාල්ලයි, එලිපන්ට් පාස්, සහ කොඩිකාමයි | 100 ... | 400 | —1960 අගෝස්තු 9 වැනිද පෙ. ව. 10ට |
| "ආ" ගණය | | | |
| චාවකච්චෙරි, නවාන්තුලි, යාපනය සහ කොකුවිල් | 100 ... | 400 | ...1960 අගෝස්තු 12 වෙනිද පෙ. ව. 10ට |
| "ඇ" ගණය | | | |
| ඉනුවිල්, චුන්නාකෙඩ මොල් ලිපල්ලෙයි සහ කන්කසන් තුරෙයි | 100 ... | 200 | ...1960 අගෝස්තු 15 වෙනිද පෙ. ව. 10 ට |

---

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

### බදුල්ල 2 එම්. වර්ගයේ ගෙවල් 3ක් සහ 3 එම්. වර්ගයේ ගෙවල් 2ක් තැනීම

බදුල්ල 2 එම්. වර්ගයේ ගෙවල් 3ක් සහ 3 එම්. වර්ගයේ ගෙවල් 2ක් තැනීම සඳහා ජාතික නිවාස ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1960 අගෝස්තු මස 12 වෙනි සිකුරාදා පෙරවරු 10 වන තුරු ටෙන්ඩර් බාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර එදින එකී වේලාවට විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටිය හැක.

පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර් පත්‍ර මෙම දෙපාර්තමේන්තුවේ නිර්මානක ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකිවා මෙන්ම වැඩි විස්තරද ඔහුගෙන් ලබාගත හැක.

ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි කර්මාන්ත වැඩ සඳහා රුපියල් 60,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි කරන ලද කොන්ත්‍රාත්කරුවෝ පමණක් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට සුදුස්සෝ වෙති. එම ලියා පදිංචි කරන ලද සහතිකය සහ මෙම දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත රුපියල් 60ක තැන්පත් මුදලක් තැබූ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කරන අයවලුන්ට 1960 අගෝස්තු මස 10 වෙනි බදාදා දවල් 12 වන තුරු ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

රෙ. ලෝ. ආර්නෝල්ඩ,
ජාතික නිවාස කොමසාරිස් තැන.

ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
තැපැල් පෙට්ටිය නො. 544,
කොළඹ 2,
1960 ජූලි මස 7 වෙනි දින.

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

සී/වැල්ලවත්ත බෞද්ධ බාලිකා පාඨශාලාවේ ගොඩනැගිලි සෑදීම සඳහා ටැන්ඩර් පත්‍ර කැඳවමින් 1960.7.1 වැනි දින රජයේ ගැසට් පත්‍ර යෙහි පළ වූ 1960.6.24 වැනි දින දරණ ටැන්ඩර් දැන්වීම සම්බන්ධ යෙන්, ටැන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දිනය 1960 අගෝස්තු මස 5 වැනි කිවි දින පෙරවරු 10.30 දක්වා දීර්ඝ කර තිබෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

2. ඉහත සඳහන් දින දරන ටැන්ඩර් දැන්වීමේ 2 වැනි ඡේදය පරිදි 1960 අගෝස්තු මස 4 වැනි දින පස්වරු 3.30 දක්වා ටැන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. ටැන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබීමට අධ්‍යාපන අධ්‍යක්ෂ වරයාගේ කාර්‍යාලයෙහි (ඒ.සී. ශාඛාව) හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ රු. 100 ක මුදලක් තැන්පත් කළ යුතු බව සැලකිය යුතුයි.

ක්ලැරන්ස් ද සිල්වා,
අධ්‍යාපන අධ්‍යක්ෂ වෙනුවට.

11.7.1960.

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර 1960 අගෝස්තු මස 5 වෙනි දින පස්වරු 2.30 දක්වා භාර ගනු ලැබේ :—

| පාසැලේ නම | වැඩ විස්තර | |
|---|---|---|
| 1. අ/මඩවල සි. මි. පාසල ... | ගුරු නිවාසය | |
| සංලක්‍ෂ්‍යය 1—(අ) ප්‍රසිඛ වැඩ දෙපාතීම්න්තුව | ... | රු. 23,000 |
| අධ්‍යාපන දෙපාර්තමේන්තුව | ... | රු. 11,500 |
| (ආ) අනුමත කළ සමිති සමාගම් | ... | රු. 23,000 |

සංලක්‍ෂ්‍යය 2—අ/අනුරාධපුරය.

2. ඉහත සඳහන් පළමු වැනි (අ) කොටසේ ප්‍රකාර අධ්‍යාපන දෙපාතීමේන්තුවේ හෝ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ ගොඩනැගිලි වැඩ සඳහා ලියා පදිංචි වූ අයට ද, එකී පළමු වැනි (ආ) කොටසේ ප්‍රකාර ගොඩනැගිලි වැඩ කළහැකි බවට සමූපකාර රෙජිස්ට්‍රාර් තුමාගේ හෝ ග්‍රාම සංවර්ධන නිලධාරි තුමාගේ හෝ කම්කරු කොමසාරිස් තුමාගේ හෝ සහතිකයක් අනුරාධපුර අධ්‍යාපන නිලධාරිනි වෙත ඉදිරිපත් කළ හැකි අනුමත ලද සමූපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති හා කම්කරු සමිති වලට ද 1960 අගෝස්තු මස 4. වෙනි දින දහවල් 12 දක්වා කොළඹ අධ්‍යාපන අධ්‍යක්‍ෂ තුමාගේ කාර්යාලයයේ ඒ. සී. ශාඛාවෙන් හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියකින් වැඩය සඳහා රු. 100ක් තැන්පත් කළ කුවිතාන්සියක් අනුරාධපුර අධ්‍යාපන නිලධාරිනි වෙත ඉදිරිපත් කිරීමෙන් පසු ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර සඳහා මුදල් තැන්පත් කිරීමට අවශ්‍ය මුදල් ගෙවීමේ කුවිතාන්සි කොළඹ, අධ්‍යාපන අධ්‍යක්‍ෂතුමාගේ කායඝාලයේ ගොඩනැගිලි ශාඛාවෙන් හෝ අනුරාධපුර අධ්‍යාපන නිලධාරිනියගෙන් හෝ ලබා ගත හැක. මුදල් ගෙවීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ දෙවෙනි ඡේදයේ සඳහන් පරිදි ලියා පදිංචි වී සිටින බව ඔප්පු කළ හැකි අයට පමණී. සමිති සඳහා දෙවන ඡේදයේ ප්‍රකාර සහතිකයක් සෑහේ ;

4. ඉහත සඳහන් පරිදි පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර් පත්‍රිකා අනුරාධපුර අධ්‍යාපන නිලධාරිනිගෙන් ලබා ගත හැක. මේ සම්බන්ධ සැලැස්මවල් හා සියළුම වැඩි විස්තරද අනුරාධපුර අධ්‍යාපන නිලධාරිනිගෙන් ලබා ගත හැක. කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනට ටෙන්ඩර් පත්‍රිකා ලියා පදිංචි කළ තැපැලෙන් යැවිය යුතුයි. දේශීය ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් පත්‍රිකා ලියා පදිංචි කළ තැපැලෙන් එවීමට අකැමැති නම් ඔවුන් හෝ ඔවුන්ගේ ඒජන්තවරුන් සීල් තබනලද ටෙන්ඩර් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කායඝාල සහකාර තැනට භාර දී එසේ භාරගත් බවට ඒ විගසම ලියවිල්ලක් ලබා ගත යුතුයි. මුද්‍රාව තබන ලද ටෙන්ඩර් පත්‍රිකා ඇතුළත් කවරය මත ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයත්, වැඩයෙහි විස්තරත් සඳහන් කළ යුතුයි.

5. කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදී 1960.8.5 දින පස්වරු 2.30ට ටෙන්ඩර් පත්‍රිකා විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍රිකා විවෘත කරන අවසථාවේදී ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍රිකා විවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන්ගේ ගණන් පැමිණ සිටින ටෙන්ඩර්කරුවන්ට කියවනු ලැබේ.

6. ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ඉල්ලීම් ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනයේ සිට සති හයක කාලයක් තුළ විවෘතව තැබිය යුතුය.

7. වෙනත් අවශ්‍ය විස්තර උතුරු මැද පළාතේ අධ්‍යාපන කායඝාල යෙන් දැන ගත හැකි අතර ටෙන්ඩර් ලියකියවිලිද මෙහිදී පරීක්‍ෂා කර බැලිය හැකියි.

8. තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ පුහුණු හෝ වේවා නුපුහුණු හෝ වේවා. ලාංකික කම්කරුවන් ස. ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදෙශයෙන් ම කම්කරුවන් හැකිතාක් දුරට බඳවා ගත යුතුයි. සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් හා ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයේම කම්කරුවන්ම පමණක් බවට කොන්දේසියක් කොන්ත්‍රාත්තුවට ඇතුළත් කරනු ලැබේ. ලාංකික නොවූ කම්කරුවන් හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදෙශයෙහි නොවන කම්කරුවන් හෝ සේවයේ යෙදවීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ සථිර ලේකම්වරයාගේ සම්මුතිය ඇතිව අධ්‍යාපනාධ්‍යක්‍ෂවරයා විසින් අවසර දී ඇති විශෙෂ අවසථාවන්හිදී හැර අන් සෑම විටම ඉහත කී කොන්දේසි නොපිළිපැදීම කොන්ත්‍රාත්තුව අවලංගු කරනු ලැබීමට ද යටත් වේ. ලාංකික නොවූ හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයේ හෝ නොවන කම්කරුවන් ඉහත කී අනුමතිය හෝ සම්මුතිය ලබා නොගෙන සේවයේ යෙදීම තහනම්ය.

ඉව්ලින් ප්‍රනාන්දු,
උතුරු මැද පළාතේ අධ්‍යාපන නිලධාරිනී.

අනුරාධපුරය, 1960.7.4,
අධ්‍යාපන කාර්යාලය.

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

අනුරාධපුර අධ්‍යාපන කාර්යාලය යේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිනිය විසින් පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර 1960 අගෝස්තු මස 5 වෙනි දින පස්වරු 2.30 දක්වා භාරගනු ලැබේ :—

වැඩ විස්තර ...... යකඩ කම්බි යොදු වහල ශක්තිමත් කිරීම

(අ) කාණ්ඩය

1. පො/සෝවාමුක්ත කඳවුර, සි.මි. පාසල
2. පො/හතමුන සි.මි. පාසල
3. පො/කදුරුවෙල ගමේ සි.මි. පාසල
4. පො/දිවුලාන මු.මි. පාසල
5. පො/මනම්පිටිය මු.මි. පාසල
6. පො/ගල්ලැල්ල දෙ.මි. පාසල
7. පො/හිඟුරක්ගොඩ ගොවි ජනපද සි.මි. පාසල
8. පො/හිඟුරක්ගොඩ සි.මි. පාසල
9. පො/ගිරිතලේ ගමේ සි.මි. පාසල—ගොඩනැගිලි 2
10. පො/විජයරාජ සි.මි. පාසල—පුදූර්
11. පො/කලහගල සි.මි. පාසල

(ආ) කාණ්ඩය

1. අ/ඇටඹගස්කඩ සි.මි. පාසල
2. අ/කහටගස්දිගිලිය දෙ.මි. පාසල
3. අ/දියමසිලගස්වැව සි.මි. පාසල
4. අ/පුල්එලිය සි.මි. පාසල
5. අ/රම්පත්විල සි.මි. පාසල
6. අ/තම්මැන්නාව සි.මි. පාසල
7. අ/කිරිකෙටුවැව සි.මි. පාසල
8. අ/කරඹන්කුලම සි.මි. පාසල
9. අ/කැදුව සි. මි. පාසල
10. අ/මහපොතාන දෙමටවැව සි.මි. පාසල

(ඇ) කාණ්ඩය

1. අ/පුලියන්කුලම සි.මි. පාසල
2. අ/වලගම්බාහුව සි.මි. පාසල
3. අ/මහකනුමුල්ල සි. මි. පාසල
4. අ/මරදන්කඩවල සි.මි. පාසල
5. අ/ඉහල කාගම සි.මි. පාසල—ගොඩනැගිලි 2
6. අ/ගනේවල්පොල දෙ.මි. පාසල—ගොඩනැගිලි 2
7. අ/හබරන සි.මි. පාසල
8. අ/පලුගස්වැව සි.මි. පාසල
9. අ/මඩවල සි.මි. පාසල
10. අ/මාමිනියාව සි.මි. පාසල

(ඈ) කාණ්ඩය

1. අ/හෙට්ටියාව සි.මි. පාසල
2. අ/ගෝනුගද්දෙනාව සි.මි. පාසල—බී
3. අ/උඩියන්කුලම නිකවැව සි.මි. පාසල
4. අ/ඇටවීරගොල්ලැව සි.මි. පාසල
5. අ/මීමින්නාවල සි.මි. පාසල
6. අ/වලහවිද්දවැව සි.මි. පාසල
7. අ/වැලිමල්පොතාන සි.මි. පාසල
8. අ/වහගහපුවැව සි.මි. පාසල
9. අ/ඇතාකඩ සි.මි. පාසල

(ඉ) කාණ්ඩය

1. අ/මාන්කඩවල සි.මි. පාසල
2. අ/කොටියාව දෙ.මි. පාසල
3. අ/දෙමටවැව සි.මි. පාසල
4. අ/ගල්කුලම සි.මි. පාසල
5. අ/උච්චිමඩුව සි.මි. පාසල
6. අ/අලියවැටුනුවැව සි.මි. පාසල

සංලක්‍ෂ්‍ය : 1—

| | | |
|---|---|---|
| " අ " අධ්‍යාපන දෙපාර්තමේන්තුව—රු. | 10,000 | " අ "—" ඉ " කාණ්ඩ සඳහා |
| ප්‍රසිඛ වැඩ දෙපාර්තමේන්තුව—රු. | 20,000 | " අ "—" ඉ " කාණ්ඩ සඳහා |
| " ආ " අනුමත කළ සමිති සමාගම්—රු. | 20,000 | " අ "—" ඉ " කාණ්ඩ සඳහා |

සංලක්‍ෂ්‍යය : 2 අ=අනුරාධපුර දිස්ත්‍රික්කය.
පො=පොලොන්නරුව දිස්ත්‍රික්කය.

2. ඉහත සඳහන් පළමුවැනි (අ) කොටසේ ප්‍රකාර අධ්‍යාපන දෙපාතීමේන්තුවේ හෝ ප්‍රසිඛ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ ගොඩනැගිලි වැඩ සඳහා ලියා පදිංචි වූ අයට ද, එකී පළමු වැනි (ආ) කොටසේ ප්‍රකාර ගොඩනැගිලි වැඩ කළ හැකි බවට සමූපකාර රෙජිස්ට්‍රාර්තුමාගේ හෝ ග්‍රාම සංවර්ධන නිලධාරිතුමාගේ හෝ කම්කරු කොමසාරිස්තුමාගේ

හෝ සහතිකයක් අනුරාධපුර අධ්‍යාපන නිලධාරිනි වෙත ඉදිරිපත් කළ හැකි අනුමත ලද සමූපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති හා කම්කරු සමිතිවලට ද 1960 අගෝස්තු මස 4 වෙනි දින දහවල් 12 දක්වා කොළඹ අධ්‍යාපන අධ්‍යක්ෂකතුමාගේ කාර්යාලය යේ "ඒ.සී." ශාඛාවෙන් හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියකින් වැඩය සඳහා රු. 100ක් තැන්පත් කළ කුවිතාන්සියක් අනුරාධපුර අධ්‍යාපන නිලධාරිනි වෙත ඉදිරිපත් කිරීමෙන් පසු ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර සඳහා මුදල් තැන්පත් කිරීමට අවශ්‍ය මුදල් ගෙවීමේ කුවිතාන්සි කොළඹ අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගේ කායසීලයේ ගොඩනැගිලි ශාඛාවෙන් හෝ අනුරාධපුර අධ්‍යාපන නිලධාරිනියගෙන් හෝ ලබාගත හැක. මුදල් ගෙවීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ දෙවෙනි ඡේදයේ සඳහන් පරිදි ලියා පදිංචි වී සිටින බව ඔප්පු කළ හැකි අයට පමණී. සමිති සඳහා දෙවන ඡේදයේ ප්‍රකාර සහතිකයක් සෑහේ.

4. ඉහත සඳහන් පරිදි පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර් පත්‍රිකා අනුරාධපුර අධ්‍යාපන නිලධාරිනියගෙන් ලබා ගත හැක. මේ සම්බන්ධ සැලැස්මවල් හා සියලුම වැඩි විස්තරද අනුරාධපුර අධ්‍යාපන නිලධාරිනියගෙන් ලබා ගත හැක. අනුරාධපුර අධ්‍යාපන කායසීලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිනියට ටෙන්ඩර් පත්‍රිකා ලියා පදිංචි කළ තැපෑලෙන් යැවිය යුතුයි. දේශීය ඩෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් පත්‍රිකා ලියා පදිංචි කළ තැපෑලෙන් එවීමට අකැමැති නම් ඔවුන් හෝ ඔවුන්ගේ ඒජන්තවරුන් සීල් තබන ලද ටෙන්ඩර් අනුරාධපුර අධ්‍යාපන කාර්යාලයේ කායසීල සහකාරතැනට භාරදී එසේ භාරගත් බවට ඒ විගසම ලියවිල්ලක් ලබාගත යුතුයි. මුද්‍රාව තබන ලද ටෙන්ඩර් පත්‍රිකා ඇතුලත් කවරය මත ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයත්, වැඩයෙහි විස්තරත් සඳහන් කළ යුතුයි.

5. අනුරාධපුර අධ්‍යාපන කායසීලයේදී 1960. 8. 5 දින පස්වරු 2.30ට ටෙන්ඩර් පත්‍රිකා විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍රිකා විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍රිකා විවෘතකරන නිලධාරි තැන විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ ඔවුන්ගේ ගණන් පැමිණ සිටින ටෙන්ඩර් කරුවන්ට කියවනු ලැබේ.

6. ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ඉල්ලීම් ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනයේ සිට සති හයක කාලයක් තුල විවෘතව තැබිය යුතුය.

7. වෙනත් අවශ්‍ය විස්තර උතුරු මැද පළාතේ අධ්‍යාපන කායසීලයෙන් දැන ගත හැකි අතර ටෙන්ඩර් ලියකියවිලිද මෙහිදී පරීක්‍ෂාකර බැලිය හැකිසි.

8. තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ පුහුණු හෝ වේවා නුපුහුණු හෝ වේවා, ලාංකික කම්කරුවන්ය. ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයෙන් ම කම්කරුවන් හැකිතාක් දුරට බඳවා ගත යුතුය. සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් හා ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයේ ම කම්කරුවන් ම පමණක් බවට කොන්දේසියක් කොන්ත්‍රාත්තුවට ඇතුලත් කරනු ලැබේ. ලාංකික නොවූ කම්කරුවන් හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයෙහි නොවන කම්කරුවන් හෝ සේවයේ යෙදවීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ සථිර ලේකම්වරයාගේ සම්මුතිය ඇතිව අධ්‍යාපනාධ්‍යක්‍ෂකවරයා විසින් අවසර දී ඇති විශෙෂ අවස්ථාවන්හි දී හැර අන් සෑම විටම ඉහත කී කොන්දේසි නොපිළිපැදීම කොන්ත්‍රාත්තුව අවලංගු කරනු ලැබීමට ද යටත් වේ. ලාංකික නොවූ හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයේ හෝ නොවන කම්කරුවන් ඉහත කී අනුමතිය හෝ සම්මුතිය ලබා නොගෙන සේවයේ යෙදීම තහනම්ය.

ඉව්ලින් ප්‍රනාන්දු,
උතුරු මැද පළාතේ අධ්‍යාපන නිලධාරිනි.

1960 ජූලි මස 9 වැනි දින,
අධ්‍යාපන කායසීලය,
අනුරාධපුරය.

---

## තිරිකුණාමලයේ දිස්ත්‍රික්කයේ ගබඩාවලින් වෙනත් ගබඩාවලටද වෛනාබේ සහ තිරිකුණාමලේ දුම්රිය ස්ථාන අතරේද ආහාර ද්‍රව්‍ය ප්‍රවහණය කිරීම, පැටවීම හා බෑම සඳහා ටෙන්ඩර් 1960-61

1960 ඔක්තෝබර් 1 වෙනි දින සිට 1961 සැප්තැම්බර් 30 වෙනි දින දක්වා කාලය තුළ පහත සඳහන් සේවා සඳහා ටෙන්ඩර් පත්‍ර කොළඹ යූනියන් පෙදෙසේ අංක 330 දරණ ස්ථානයෙහි පිහිටි රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ (ආහාර අංශයේ) ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1960 අගෝස්තු මස 23 වෙනි දින පස්වරු 2.30 තෙක් භාරගනු ලැබේ.

සේවා :—

(අ) තිරිකුණාමලයේ ආහාර දෙපාර්තමේන්තුවේ ගබඩාවල අඩුක් කොට ඇති ආහාර ද්‍රව්‍ය එයින් ඉවත්කොට ලොරිවල පටවා අඩුක්කිරීම, ආහාර දෙපාර්තමේන්තුවට අයත් තිරිකුණාමලයේ වෙනත් ගබඩාවලට ප්‍රවහනය කිරීම, ලොරිවලින් බා ඕනෑම උසකට සිටින සේ අඩුක්කිරීම.

(ආ) තිරිකුණාමලයේ ආහාර දෙපාර්තමේන්තුවේ ගබඩාවල අඩුක් කොට ඇති ආහාර ද්‍රව්‍ය එයින් ඉවත් කොට ලොරිවල පටවා අඩුක්කිරීම, තිරිකුණාමලයේ දුම්රිය ස්ථානවලට ප්‍රවහනය කිරීම, ලොරිවලින් බා දුම්රිය පෙට්ටිවලට පටවා අඩුක්කිරීම.

* ගබඩා යන්නෙන් හැඟවෙන්නේ "හැංගර්" ගබඩාද, ගබඩාද, සැපයීමේ මධ්‍යස්ථානද, ආහාර ද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා ආහාර දෙපාර්තමේන්තුව මගින් පාවිච්චි කරන වෙනත් ස්ථානද වෙත්.

කොළඹ යූනියන් පෙදෙසේ අංක 330 දරණ ස්ථානයේ ආහාර කොමසාරිස් කාර්යාලයෙන් 1960 අගෝස්තු 23 වෙනි දින දවල් 12 තෙක් ලබාගත හැකි පෝර්මවල (පිටපත් දෙකක් ලෙස) ටෙන්ඩර් පත්‍ර පිළියෙල කළ යුතුයි.

ආහාර කොමසාරිස් වෙත රුපියල් 250ක් තැන්පත් කොට ලබාගන්නා කුයිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. මෙම සේවා පිළිබඳ වැඩි විස්තර ආහාර කොමසාරිස් කාර්යාලයෙන් ලබාගත හැක.

කේ. එම්. ඩී. ජයනෙත්ති,
ආහාර කොමසාරිස්.

1960.6.28,
කොළඹදීය.

---

## ආහාර ද්‍රව්‍ය සහ කෙයාර් කිරි පිටි ගෙනයැම

කොළඹ යූනියන් පෙදෙසේ 330හි ආහාර සහ වෙළඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින්, 1960 ඔක්තෝබර් මස සිට 1961 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා මුදල් වර්‍ෂය තුල, වවුනියාවේ සැපයීමේ මධ්‍යස්ථානයේ ආහාර ද්‍රව්‍ය සහ කෙයාර් කිරි පිටි ගෙනයැම සඳහා ටැන්ඩර් පත්‍ර 1960 අගෝස්තු මස 2 වැනි අඟහරුවාද සවස 2.30 දක්වා භාරගනු ලැබේ.

වවුනියාවේ කච්චේරියේ රුපියල් 250ක මුදලක් තැන්පත් කිරිමෙන්, 1960 අගෝස්තු මස 1 වැනි සඳුදා සවස 2.30 දක්වා ලබා ගත හැකි පෝර්මවල ටැන්ඩර් පත්‍ර එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර වවුනියාවේ නියෝජ්‍ය ආහාර පාලක තැනගේ කායසීලයෙන් ලබාගත හැක.

පී. වෙල්වරත්නම්,
වවුනියා දිස්ත්‍රික්කයේ සහකාර ආහාර පාලක.

1960 ජූලි 4 වෙනි දින,
වවුනියා කච්චේරියේ ආහාර පාලක කායසීලයේදී.

---

## 1960-61 වර්‍ෂය තුල ආහාර ද්‍රව්‍යයන් සහ කෙයාර් කිරි පිටි ගෙනයාම සඳහා ටෙන්ඩර්—මුලතිව්හි සැපයීමේ මධ්‍යස්ථානය, වවුනියා දිස්ත්‍රික්කය

1960 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1961 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වාවූ මුදල් වර්‍ෂය තුල වවුනියා දිස්ත්‍රික්කයේ මුලතිව්හි සැපයීමේ මධ්‍යස්ථානයේ ආහාර ද්‍රව්‍යයන් සහ කෙයාර් කිරි පිටි ගෙනයාම සඳහා ටෙන්ඩර් පත්‍ර 1960 අගෝස්තු මස 2 වැනි අඟහරුවාදා සවස 2.30 දක්වා, වවුනියාවේ නියෝජ්‍ය ආහාර පාලක තැන විසින් භාරගනු ලැබේ.

රුපියල් 50ක මුදලක් කච්චේරියේ තැන්පත් කිරීමෙන් 1960 අගෝස්තු මස 1 වැනි සඳුදා සවස 2.30 දක්වා වවුනියාවේ කච්චේරියෙන් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගත හැක.

මේ සම්බන්ධ වැඩි විස්තර වවුනියාවේ කච්චේරියෙන් ලබාගත හැක.

පී. වෙල්වරත්නම්,
වවුනියා දිස්ත්‍රික්කයේ සහකාර ආහාර පාලක තැන.

1960 ජූලි 4 වෙනි දින,
වවුනියාවේ කච්චේරියේ ආහාර පාලක කාර්යාලයේදී.

---

## ආහාර ද්‍රව්‍ය ගෙනයාම, පැටවීම හා බෑම සඳහා ටෙන්ඩර්, මඩකලපු දිස්ත්‍රික්කය, 1960-61

1960 ඔක්තෝබර් 1 වෙනි දින සිට 1961 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා කාලය තුළ ඉහත සඳහන් සේවය සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ. 1960 අගෝස්තු මස 22 වෙනි දින දවල් 12ට ටෙන්ඩර් වසනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර

කොළඹ 2, යූනියන් පෙදෙස, අංක 330 දරණ ස්ථානයේ, වාණිජ හා වෙළඳ අමාත්‍යාංශයේ "ආහාර අංශය" ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැනට යැවිය යුතුය. ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි, ටෙන්ඩර් ආකෘති පත්‍ර ආදිය පිළිබඳ සම්පූර්ණ විස්තර මඩකලපුවේ නියෝජ්‍ය අහාර පාලක තැනගේ කායඹාලයෙන් රාජකාරි කාලය තුළදී 1960 අගෝස්තු මස 20 වැනි දින දවල් 12 වනතුරු ලබාගත හැක.

ඒ. සුන්දර්මූර්ති,
නියෝජ්‍ය ආහාර පාලක තැන වෙනුවට.

කච්චේරිය,
මඩකලපුව, 15.7.1960.

---

## ලුණු දෙපාර්තමේන්තුව

වෂී 1960 ජූලි 1 වැනි දින නිකුත්වුන ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පලකරණ ලද මෙහි පහත සඳහන් 1960 ජූලි 20 වැනි දින දවල් 12 ට වසන්ට නියමව තිබුන ටැන්ඩර් දෙක වසන දිනය මෙම ජූලි මස 27 වැනි දින දවල් 12 වන තෙක් කල්දමන ලදි.

(1) ඇලිිපන් පාස් ලේවායට රළු ගල් සැපයීම.

(2) ඇලිිපන් පාස් ලේවායේ අඩු මිලට SDC ටයිප් ජෝඩු ගෙවල් තැනීම:

ඊ. බී. තිසවීරසිංහ,
ලුණු කොමසාරිස්.

1960 ජූලි 15 වැනි දින.
කොළඹ,

---

## ලුණු දෙපාර්තමේන්තුව

### බීමට ජලය සැපයීම

1960 ඔක්තෝබර් 1 වැනි දින පටන් 1961 කේ සැප්තැම්බර් 30 වැනි දින දක්වා කරතිව් සහ කල්පිටි ලුණු ලේවායන්හි නියුක්ත කායඹී මණ්ඩලයට බීමට සුදුසු ජලය සැපයීම සඳහා ටැන්ඩර් පත්‍ර 1960 ක්වූ අගෝස්තු මස 5 වැනි දින පස්වරු 3 වනතුරු කොළඹ කොම්පඤ්ඤ වීදියේ නො. 110 ජෙනරල්ස් ලේක් පාර, තැ. පෙ. නො. 539 දරණ ලුණු කොමසාරිස් තැන විසින් භාරගනු ලැබේ.

ටැන්ඩර් පත්‍ර සැපයිය යුත්තේ අනු පිටපත සමග ලුණු කොමසාරිස් තැනගේ කායඹාලයෙන් හෝ පුත්තලමේ ආණ්ඩුවේ දිසාපති තැනගෙන් හෝ පුත්තලමේ ලුණු අධිකාරි තැනගෙන් ලබා ගන්නා පෝර්ම කොළ වලය. ටැන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රු. 10ක් ඕනෑම කච්චේරියක හෝ ලුණු කොමසාරිස් තැනගේ කායඹාලයෙහි බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළවිට ටැන්ඩර් පෝර්ම කොළ දෙනු ලැබේ. වැඩි විස්තර ඉහත සඳහන් අයගෙන් ලබාගත හැක.

ඊ. බී. තිසවීරසිංහ,
ලුණු කොමසාරිස්.

අංකය ටීජී 120,
1960 ජූලි 15 වැනි දින,
කොළඹ.

---

## අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවට අයත් කොළඹ මරදානේ මැක්ලම් පාරේ පිහිටි රථවාහන අංශයේ තිබෙන, පාවිච්චි කළ මෝටර්රථ වාහන මිළදී ගැනීම පිණිස ටෙන්ඩර් පත්‍ර, කොළඹ කොටුවේ චැතැම් වීදියේ අංක 62 දරන ස්ථානයේ සිටින අලෙවිකිරීමේ කොමසාරිස්තුමා විසින් 1960 අගෝස්තු 22 වෙනි සඳුදා අ. භා. 2.30 වෙනතුරු භාරගනු ලැබේ.

කොළඹ කොටුවේ චැතැම් වීදියේ අංක 62 දරන ස්ථානයේ පිහිටි අලෙවිකිරීමේ කොමසාරිස් කායඹාලයට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකට රු. 150 ක් බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1960 අගෝස්තු 22 වෙනි සඳුදා දවල් 12 වෙනතුරු අවශ්‍ය ටෙන්ඩර් පෝරම අලෙවිකිරීමේ කොමසාරිස් කායඹාලයෙන් ලබාගත හැක.

ටෙන්ඩර් පත්‍ර අනු පිටපතක්ද සමග එවිය යුතුයි.

වැඩි විස්තර කොළඹ කොටුවේ චැතැම් වීදියේ අංක 62 දරන අලෙවි කොමසාරිස් කායඹාලයෙන් දැනගැනීමට පුළුවන.

ඇම්. ඩී. ඩබ්ලිව්. ආර්. සපරමාදු,
අලෙ/කො. වෙනුවට.

1960 ජූලි 8 වැනි දින.
අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුව,
අංක 62, චැතැම් වීදිය,
කොළඹ 1.

## අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුව

### අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවට අයත් බොරැල්ලේ සර්පන්ටයින් පාරේ පිහිටි මුළුතැන්ගෙට ශුඛ කරන ලද කෙසෙල් කොල සහ කැන්ද කොල 60.9.1 සිට 61.3.31 දක්වා සැපයීම

අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවට අයත් බොරැල්ලේ සර්පන්ටයින් පාරේ පිහිටි මුළුතැන්ගෙට 60.9.1 සිට 61.3.31 දක්වා කාලය තුළ මෙහි පහත සඳහන් දිග පළල ඇති ශුඛ කරන ලද කෙසෙල් කොල සපයා ගෙනත්දීම පිණිස ටැන්ඩර් 1960 අගෝස්තු 8 වැනි සඳුදා අ. භා. 2.30 වෙන තෙක් කොළඹ 2, යූනියන් ප්ලේස්හි පිහිටි ආහාර වාණිජ සහ වෙළඳ ඇමති කායඹාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් භාරගනු ලැබේ.

**ශුඛ කරන ලද කෙසෙල් කොළ:** අඟල් 18×12 අඩු නොවන දිග පළල ඇති සුමානයේ 5 ස් දින තුළ (සඳුදා සිට සිකුරාදා දක්වා) දවසකට ශුඛ කරන ලද කෙසෙල් කොල 3,800 ක් පමණද, සෙනසුරාදා දිනවල 3,000 ක් පමණද, ඉරිදා දිනවල 1,500 ක් පමණද ශුඛ කරන ලද කෙසෙල් කොල සපයා ගෙනත් දිය යුතුයි.

**ශුඛ කරන ලද කැන්ද කොල:** අඟල් 7½×6½ අඩු නොවන දිග පළල ඇති කැන්ද කොල ඉරිදා සිට සිකුරාදා දක්වා දිනකට 75—100 පමණ සපයා ගෙනත් දිය යුතුයි.

කොළඹ කොටුවේ චැතැම් වීදියේ අංක 62 දරන ස්ථානයේ පිහිටි අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකට රු. 50 ක් බැඳ කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1960 අගෝස්තු 8 වැනි සඳුදා දවල් 12 තෙක් ටෙන්ඩර් පෝරම අනු පිටපතක්ද සහිතව ලබාගත හැක.

වැඩි විස්තර කොළඹ කොටුවේ චැතැම් වීදියේ අංක 62 දරණ ස්ථානයේ පිහිටි අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවෙන් දැනගත හැක.

ඇම්. ඇස්. විජේරත්න,
අලෙ/කො. වෙනුවට.

1960 ජූලි 8 වැනි දින,
කොළඹ අලෙවිකිරීමේ සංවර්ධන දෙපාර්තමේන්තුවේදීය.

---

## අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් කොළඹ මරදානේ මැක්ලම් පාරේ පිහිටි රථවාහන අංශයේ තිබෙන මෝටර් රථවලට අවශ්‍ය පාවිච්චි කළ අමතර කොටස් රාශියක් මිල දී ගැනීම පිණිස ටෙන්ඩර් පත්‍ර, කොළඹ කොටුවේ චැතැම් වීදියේ පිහිටි අංක 62 දරණ කාර්යාලයේ අලෙවි කිරීමේ කොමසාරිස් තැන විසින් 1960 අගෝස්තු මස 31 බදාදා අ. භා. 2.30 දක්වා භාරගනු ලැබේ.

කොළඹ කොටුවේ චැතැම් වීදියේ අංක 62 දරණ ස්ථානයේ පිහිටි අලෙවිකිරීමේ කොමසාරිස් කාර්යාලයට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකට රු. 100 ක් බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1960 අගෝස්තු මස 31 වැනි බදාදා දවල් 12 වනතුරු අවශ්‍ය ටෙන්ඩර් පෝර්ම අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් ලබාගත හැක.

ටෙන්ඩර් පත්‍ර අනුපිටපතක්ද සහිතව එවිය යුතුයි.

වැඩි විස්තර කොළඹ කොටුවේ චැතැම් වීදියේ පිහිටි අංක 62 දරණ අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් දැනගැනීමට පුළුවන.

ඇම්. ඩී. ඩබ්ලිව්. ආර්. සපරමාදු,
අලෙවි කිරීමේ කොමසාරිස් තැන වෙනුවට.

1960 ජූලි මස 8 වැනි දින,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව,
අංක 62, චැතැම් වීදිය, කොළඹ 1.

---

## තැපැල් සහ විදුලි සංදෙශ දෙපාර්තමේන්තුව

### මැසූ ඇඳුම් විකිණීම

මැසූ ඇඳුම් විකිණීම සඳහා කොළඹ, ගාලු මුවදෙර මහ ලේකම් කායඹාලයේ තැපැල් ගුවන් විදුලි හා ප්‍රවෘත්ති අමාත්‍යාංශයේ, ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපති තුමා 1960 අගෝස්තු 16 දින පෙරවරු 9.30 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පෝර්මයේ සඳහන් කර ඇති වේලාවේදී ඒවා විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට එහි පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ.

3. කොළඹ මිලර්ස් ගොඩනැගිල්ලේ (1 වැනි තට්ටුව) තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ, සහකාර උපකරණ අධිකාරී කායඹාලයෙන් ලබාගත හැකි පෝරමවල ලියා අනුපිටපත් සහිතව ටෙන්ඩර් එවිය යුතුවේ.

## කොළඹ වරාය කොමිෂන් සභාව

කොළඹ වරාය කොමිෂන් සභාවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1960 අගෝස්තු මස 4 වෙනි බ්‍රහස්පතින්දා පස්වරු 2.30 දක්වා ගාළු වරායට ½" කළුගල් කියුබ් 150 ක් සහ ගංගා වැලි කියුබ් 100 ක් සපයා භාර දීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ. 1960 අගෝස්තු මස 4 වෙනි දින පස්වරු 2.30 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට එහි පෙනී සිටින්ට අවසර දෙනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපෑලෙන් නොඑවන අය විසින් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් ටෙන්ඩර් භාර ගැනීම සඳහා බලය පවරන ලද නිලධාරියාට ටෙන්ඩර් පත්‍ර පුද්ගලිකව භාර දී ඒ පිළිබඳව එම නිලධාරියාගෙන් කුවිතාන්සියක් ලබා ගත යුතුය.

3. ටෙන්ඩර් පිළිබඳ ලිපි ලේඛන කොළඹ වරාය කොමිෂන් කායසීලයේදී පරීක්ෂා කළ හැක. රු. 50 මුදලක් වරාය කොමිෂන් කායසීලයේ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම කොළ ලබා ගත හැක. ටෙන්ඩර් කොන්දේසි වලට අනුව ඇප මුදල ආපසු ගෙවනු ලැබේ.

4. ඉහත සඳහන් අන්දමට ලබා ගත් පෝර්ම කොලවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. 1960 අගෝස්තු මස 3 වෙනි බදාදා දවල් 12 දක්වා ටෙන්ඩර් පෝර්ම කොල නිකුත් කරනු ලැබේ. පිළිගත් ටෙන්ඩරය සඳහා ඇපකරුවන් අවශ්‍ය වී නම් එය සැපයීමට ටෙන්ඩර් කරු සූදානම්ව සිටිය යුතුය. ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනයේ සිට යටත් පිරිසෙයින් දින 60 ක් සෑම ටෙන්ඩරයක්ම වලංගුව පවතී.

ඒ. ඇස්. කොහොඹන්වික්‍රම,
වරායේ කොමසාරිස්.

1960 ජූලි මස 8 වෙනි දින,
කොළඹ වරාය කොමිෂන් කායසීලයේදීය.

---

## මහනුවර කච්චේරිය

### මහනුවර දිස්ත්‍රික්කයේ ජල නල මාර්ග, ලිං සෑදීම සහ පාරවල් දියුණු කිරීම සහ අළුත්වැඩියා කිරීම

පහත සඳහන් වැඩ සඳහා මහනුවර කච්චේරියේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් කොන්ත්‍රාත් කරුවන්ගෙන් 1960.8.8 වැනි දින පෙරවරු 9.30 දක්වා මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

| කටයුත්ත | පිහිටි ගම | ප්‍රා.ආ.නි. කොට්ඨාශය | ටෙන්ඩර් මුදල රු. ශ. |
|---|---|---|---|
| 1. ජල නල මාර්ගයක් සෑදීම | ... අංකුඹුර වත්ත | ... හාරිස්පත්තුව | 25 00 |
| 2. බීම සහ නෑම සඳහා ළිඳක් කැනීම | ... බාබර් වත්ත | ... එම | ... 25 00 |
| 3. එම | ... දියනිල්ල | ... මැදදුම්බර | ... 25 00 |
| 4. ළිඳක් කැනීම | ... උඩහේන ජනපදය | හාරිස්පත්තුව | 25 00 |
| 5. එම | ... හපුගස්තැන්න ගම් උඩබුලත්ගම විශාල කිරීමේ ව්‍යාපාරය | | 25 00 |
| 6. එම | ... වැනිලාවත්ත | ... තුම්පනේ | ... 25 00 |
| 7. අඹතැන්න-පරණගම කටුගස් තොට වත්ත පාර දියුණු කිරීම "1" 1 වැනි සැතපුම් ½ | අඹතැන්න | ... පාතදුම්බර | ...100 00 |
| අඹතැන්න-පරණගම කටුගස් තොට වත්ත පාර දියුණු කිරීම "2" 2 වැනි සැතපුම් ½ | එම | ... එම | ...100 00 |
| අඹතැන්න-පරණගම කටුගස් තොට වත්ත පාර දියුණු කිරීම "3" 3 වැනි සැතපුම් ¾ | එම | ... එම | ... 50 00 |
| 8. පොල්ගොල්ල-ඇත්ගාල කටු ගස්තොට වත්ත පාර අළුත් වැඩියා කිරීම "1" 1 වැනි සැතපුම් ¾ | ... පොල්ගොල්ල | ... එම | ...100 00 |
| පොල්ගොල්ල-ඇත්ගාල කටු ගස්තොට වත්ත පාර අළුත් වැඩියා කිරීම "2" 2 වැනි සැතපුම් ¾ | ... එම | ... එම | ... 50 00 |

2. ටෙන්ඩර් පත්‍ර මහනුවර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්තතුමාගෙන් ලබාගන්නා ලද පෝර්ම කොලවල පමණක්ම විය යුතුයි. පිළිගන්නා ලද පෝර්ම කොලවල නොවන ටෙන්ඩර් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3. ටෙන්ඩර් පෝර්ම පත් ලබාගන්නට ප්‍රථම එක එක වැඩය සඳහා ඉහත සඳහන් පළමුවෙනි ඡේදයේ සඳහන් ටෙන්ඩර් මුදල් මහනුවර කච්චේරියේ තැන්පත්කර ඒ වෙනුවෙන් ලැබෙන කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් පෝර්ම කච්චේරියෙන් ලබාගත හැක්කේ 1960.8.5 වැනි දින දහවල් 12 දක්වා පමණී.

4. ටෙන්ඩර් පිටපත් දෙක බැගින් මුද්‍රා තබන ලද කවරයක බහා ලියා පදිංචි කළ තැපෑලෙන් මහනුවර කච්චේරියේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා වෙත 1960.8.8 වැනි දින පෙරවරු 9.30 ට ප්‍රථම ලැබෙන පරිද්දෙන් එවිය යුතුයි. එක කවරයක එවිය යුත්තේ එක කටයුත්තක් සඳහා ටෙන්ඩර් පමණී. තවද කවරයේ පිට පැත්තේ වම් කෙළවරේ ටෙන්ඩර් එවන ලද කටයුත්තේ "වැඩයේ" නම පැහැදිළිව ලියා එවිය යුතුයි.

5. මෙම කාර්යය සම්බන්ධයෙන් වැඩි විස්තර මහනුවර කච්චේරියේ සංවර්ධන වැඩ පිළිබඳ අධිකාරි තැනගෙන් ලබාගත හැක.

6. ටෙන්ඩරයේ මුළු මුදල ටෙන්ඩර් පෝරමයෙහි අකුරින් හා ඉලක්කමින් සඳහන් කළ යුතුයි. අකුරින් ලියන ලද මුදල ඉලක්කමින් ලියන ලද මුදලට වෙනස් වී ඇති හෝ මුළු මුදල අකුරින් සඳහන් කර නැති ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට අවකාශ තිබේ. ටෙන්ඩර් පත්‍රවල යම් මැකීමක් හෝ වෙනස් කිරීමක් ඇත්නම් ඒ සියල්ල ටෙන්ඩර්කරුගේ කොට අත්සනින් සහතික කළ යුතුයි.

7. ඉහත සඳහන් කොන්දේසිවලට යටත් නොවන ටෙන්ඩර් නිෂ්ප්‍රභ කරනු ලැබේ.

8. මීට පෙර වතාවල වැඩ පැහැර හැරියේ යයි ආණ්ඩුව විසින් සම්මත කරනු ලැබූ ටෙන්ඩර් කරුවන්ගෙන් ටෙන්ඩර් භාරගනු නොලැබේ.

9. සෑම ටෙන්ඩරයක්ම ප්‍රතික්ෂේප කිරීමේ බලයත්, යම් ටෙන්ඩරයක කොටසක් පමණක් භාරගැනීමේ බලයත් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා වෙත රඳා පවතී.

10. ටෙන්ඩර් වසන දින පටන් සති තුනක් ඇතුළත කාලයේ දී කිසිම ටෙන්ඩර් කරුවෙකුට ඔහුගේ ටෙන්ඩරය ආපසු ගැනීමට බලයක් නැත. යම් ටෙන්ඩර් කරුවෙක් එසේ කළහොත් ඔහුගේ ටෙන්ඩර් ඇප මුදල රාජ සන්තක කර, වැඩ පැහැර හරින කොන්ත්‍රාත් කරුවන්ගේ නාම ලේඛනයට ඔහුගේ නමත් ඇතුළත් කිරීමට ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමාට බලය තිබේ.

11. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් ඉහත කී කර්මාන්තය නිසියාකාර කරන ලෙස, මහනුවර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත තුමා සමඟ ගිවිසුමකට නොහොත් කොන්ත්‍රාත්තුවකට අත්සන් තැබිය යුතුය. තවද ඔහු විසින් ටෙන්ඩර් කරන ලද මුළු මුදලෙන් සියයට 5 ක් ඇප වශයෙන් එකී ඒජන්තතුමා වෙත තැන්පත් කළ යුතුය.

12. මහනුවර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්තතුමා විසින් ලියවිල්ලකින් දන්වා දින 7 ක් ඇතුළත කාලයේ දී, ගිවිසුමකට හෝ කොන්ත්‍රාත්තුවකට අත්සන් නොතබන හෝ ඇප මුදල තැන්පත් නොකරන ටෙන්ඩර් කරුවන්ගේ තැන්පත් මුදල රාජ සන්තක කරනු ලැබේ. එසේ කරනු ලබන අයගේ නම්, වැඩ පැහැර හරින කොන්ත්‍රාත් කරුවන්ගේ නාම ලේඛනයට ඇතුළත් කිරීමට ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමාට බලය තිබේ. අන් සෑම ටෙන්ඩර් ඇප මුදලක්ම තෝරාගත් ටෙන්ඩර්කරු විසින් ගිවිසුමකට නොහොත් කොන්ත්‍රාත්තුවකට අත්සන් කළායින් පසුව නිදහස් කරනු ලැබේ.

13. ටෙන්ඩර්කරු විසින් දෙන ලද අන්තිම ලිපිනයට ලියා පදිංචි කළ තැපෑලෙන් එවන හෝ, ලිපිනයට බෙදාදෙන සෑම ලිය කියවිල්ලක්ම ඔහු විසින් ලත් බවට ඒත්තු ගනු ලැබේ.

14. ටෙන්ඩර් වසන දින පෙරවරු 10ට සියළුම ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. මහනුවර කච්චේරියේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගේ කාර්යාලයේ දී ටෙන්ඩර් විවෘත කරන වේලාවට ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට අවකාශ දෙනු ලැබේ. ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා සමග විධාන යොදාගෙන යම් ටෙන්ඩර් කරුවෙකුට ඔහුගේ ටෙන්ඩරයෙහි දෙවන පිටපත ටෙන්ඩර් විවෘත කරන වේලා වේදී පරීක්ෂා කිරීමට අවසර දෙනු ලැබේ.

15. ලියා පදිංචි කළ තැපෑලෙන් ලැබෙන ටෙන්ඩර් ලත් බව, ටෙන්ඩර් විවෘත කරන දින දක්වනු ලැබේ. ලියා පදිංචි කළ තැපෑලෙන් ටෙන්ඩර් එවීමට අකමැති ටෙන්ඩර් කරුවන් තමන්ගේ ටෙන්ඩර් පුද්ගලිකවම ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමාට හෝ එතුමාගේ බලයලත් අන් නිලධාරියෙකුට භාරදිය යුතුයි. ඒ නිලධාරි තැන විසින් ටෙන්ඩර්කරුට එවේලේම ඊට කුවිතාන්සියක් දෙනු ලැබේ. එසේ භාරගත් ටෙන්ඩරය එම නිලධාරි තැන විසින් සභාපති තැනගේ කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහා ලනු ලැබේ.

16. මෙම ටෙන්ඩරය සම්බන්ධ කොන්දේසි හෝ වෙනත් කරුණක් . වෙනස් කිරීමට සිදුවුවහොත් එසේ වෙනස් කරනු ලබන්නේ ටෙන්ඩර් විවෘත කළායින් පසුවය. එවැනි ක්‍රියා මාර්ගයක් ගැනීමට ප්‍රථම ටෙන්ඩර් මණ්ඩලය විසින් ටෙන්ඩර් කරුවන් සියළු දෙනාටම දැනුම් දෙනු ලැබේ. එවැනි වෙනස් කිරීමකට ප්‍රථම ඊට නියම අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම්තුමාගේ අවසරය ලබා ගැනීම අවශ්‍යය.

17. මෙම කොන්ත්‍රාත්තුවේ සෑම කර්මාන්තයක් සඳහාම කොන්ත්‍රාත්කරු විසින් ලාංකික කම්කරුවන්ම යෙදවිය යුතුයි. එසේම හැකිතරම් දුරට වැඩ කරන ප්‍රදේශයෙන්ම කම්කරුවන් වැඩට බඳවා ගත යුතුයි. විශෙෂ අවස්ථාවකදී ඒජන්තතුමාගෙන් ගන්නා ලද ලියවිල්ලකින් ලත් අවසරය පිට ලාංකික නොවූ හෝ අන් පෙදෙසක කම්කරුවන් වැඩෙහි යෙදවිය හැක. එවැනි අවසරයක් නොමැතිව ලාංකික නොවූ හෝ අන් ප්‍රදේශයක කම්කරුවන් වැඩෙහි යෙදවීම කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමට හේතුවේ.

ජේ. එස්. ප්‍රනාන්දු,
මහනුවර දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.

1960 ජූලි 9 වැනි දින,
මහනුවර කච්චේරියේ දීය.

---

## මාතර දිස්ත්‍රික්කයේ සුළු වාරි මාර්ග වැඩ

පහත සඳහන් සුළු වාරිමාර්ග වැඩ සඳහා 1960 අගෝස්තු මස 8 වෙනි දින පෙ. ව. 9.30 දක්වා මාතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත තුමා විසින් ටෙන්ඩර් පත්‍ර භාර ගන්නවා ඇත.

### ගඟබඩ පත්තුව

(1) අත්තනෝ අමුණ සෑදීම—පුහුල්වැල්ල.
(2) රුක්ගහ ඇල වේල්ල ශක්තිමත් කිරීම—කිතලගම.
(3) දෙල්ගහදෙනිය පැති බැම්ම සෑදීම—යටියන.

### වැලිගම් කෝරළය

(4) වේල්ලගාව ලියද්ද අමුණ සෑදීම—මාලිම්බඩ 3.
(5) පාලමක් සහිත අමුණක් සෑදීම—එගොඩ ඕකන්ද, වල්පිට.

### කන්දබඩ පත්තුව

(6) ජුල්ගහකුඹුර අමුණ පැති බැම්ම සෑදීම—පොත්තවෙල.

2. මේ වැඩ සඳහා සියළු විස්තර කායසීල වේලාවන් හිදී මාතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත තුමාගෙන් දැනගත හැකිය. ටෙන්ඩර් කළයුත්තේ එතුමාගෙන් ලබාගන්නා ලද ටෙන්ඩර් පත්‍ර වලය. 1960 ක්වූ ජූලි මස 18 වෙනිද සිට 1960 අගෝස්තු මස 6 වෙනි දින දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. මෙම වැඩය සඳහා රු. 10 බැගින් මෙම කච්චේරියේ හෝ වෙනත් කච්චේරියක තැන්පත් කිරීමෙන් ලබාගන්නා ලද කුවිතාන්සි ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් පෝරම් කොළ ලබාගත හැකිය. ලියාපදිංචි කළ විවිධ සේවා සමුපකාර සමිති හා ලියාපදිචි කළ ග්‍රාමසංවර්ධන සමිති වලින් ඉදිරිපත් කරන ටෙන්ඩර් පත්‍ර සඳහා මේ තැන්පත් මුදල අවශ්‍ය නොවේ.

3. ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලබන්නේ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ මෙම කච්චේරියේ රු. 1,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි කළ කොන්ත්‍රාත් කරුවන්ගෙන් පමණක් ය. ටෙන්ඩර් පත්‍රිකා ලබාගැනීමට පැමිණෙන විට ලියාපදිංචි කිරීමේ රැකෝඩ් පොත ද රැගෙන ආ යුතුයි. ග්‍රාම සංවර්ධන සමිති වලට සහ විවිධ සේවා සමුපකාර සමිති වලට ද මෙම කොන්දේසිය බලපාන්නේ නැත.

4. ටෙන්ඩර් පත්‍ර එවන සියළුම ලියුම් කවර වල වම් පැත්තේ ඉහළ කොනේ "සුළු වාරි මාර්ග වැඩ සම්බන්ධ ටෙන්ඩර් පත්‍ර" යනුවෙන් සඳහන් කර ලියාපදිංචි කළ තැපෑලෙන් මාතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත තුමා වෙත එවිය යුතුයි. නැතිනම් කච්චේරියේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතුය. 1960 අගෝස්තු මස 8 වෙනි දින පෙ. ව. 9.45ට මෙම කච්චේරියේ සහකාර ඡන්ද අධිකාරි තැන විසින් ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට ද පැමිණ සිටිය හැක.

5. 1960.8.8 වෙනි දින සිට දවස් 45ක් ගතවන තුරු තමන් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් පත්‍රය අනුව වැඩ භාරගැනීමට සූදානම්ව සිටිය යුතුයි.

පී. හත්තොටුව,
මාතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත වෙනුවට.

1960 ජූලි මස 8 වැනි දා,
මාතර කච්චේරියේදී ය.

---

## ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව

නාරාහේන්පිට පින් කරන පැක්ටරියේ අතිරේක ගබඩාව (2 වෙනි කොටස) තැනීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි රජයේ තැපැල් වැඩ හා විදුලිබල පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැන විසින් වර්ෂ 1960 අගෝස්තු මස 10 වෙනි බදාදා පෙරවරු 9.30 වන තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. කොළඹ ටොරිංටන් චතුරශ්‍රයේ, ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන නිර්මාණ ඉංජිනේරුතැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබගාත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1960 ජූලි මස 29 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 2,15,000කට නොඅඩු ගණනකට ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක්, ඉහත සඳහන් ඉංජිනේරුතැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රුපියල් 250ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමූපකාර තොග වෙළඳ ආයතනය,
(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන, නිදසුනක් : "වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන්"
(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්‍ෂතැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති, සහ
(ඈ) සමූපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර්තැන විසින් ලියාපදිංචි කරනු ලද සමූපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්‍ෂක වෙනුවට.

කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දීය, 1960.7.11.

---

හෝමාගම යුද කඳවුරේ විවාහක නිලධාරීන්ගේ නිවාස (5 වෙනි කොටස) තැනීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස් වර්ක්ස් හවුස්හි පිහිටි රජයේ තැපැල්, වැඩ හා විදුලිබල පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1960 අගෝස්තු මස 3 වෙනි බදාදා පෙරවරු 9.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. හෝමාගම ආ. වැ. දෙපාර්තමේන්තුවේ නිර්මාණ ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1960 ජූලි මස 22 වෙනි සිකුරාද පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 3,65,000ට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක්, ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රුපියල් 250ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමූපකාර තොග වෙළඳ ආයතනය,
(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන, නිදසුනක් : "වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන්"
(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්‍ෂතැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති, සහ
(ඈ) සමූපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර්තැන විසින් ලියාපදිංචි කරන ලද සමූපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්‍ෂක වෙනුවට.

කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දීය, 1960.7.11.

---

මාතර සාමාන්‍ය සේවා නිවාස තැනීම (1 වෙනි කොටස) සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි රජයේ තැපැල්, වැඩ හා විදුලිබල පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1960 අගෝස්තු මස 3 වෙනි

බදාදා පෙරවරු 9.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. මාතර ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැන ගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1960 ජූලි මස 22 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 2,00,000ට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක්, ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රුපියල් 200ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටෙන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමූපකාර තොග වෙළඳ ආයතනය,
(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන, නිදසුනක් : "වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන්"
(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂතැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති, සහ
(ඈ) සමූපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර්තැන විසින් ලියාපදිංචි කරන ලද සමූපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල් කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්ෂක වෙනුවට.

කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දීය, 1960.7.11.

---

අනුරාධපුර නව නගරයේ "3 ඉසැඩ්" ශ්‍රේණියේ ආණ්ඩුවේ නිවාස 5ක් තැනීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි රජයේ තැපැල්, වැඩ හා විදුලිබල පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1960 අගෝස්තු මස 3 වෙනි බදාදා පෙරවරු 9.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. අනුරාධපුර ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිට පතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1960 ජූලි මස 22 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 1,31,000ට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක්, ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රුපියල් 200ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටෙන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමූපකාර තොග වෙළඳ ආයතනය,
(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන, නිදසුනක් : "වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන්"
(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂතැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති, සහ
(ඈ) සමූපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර්තැන විසින් ලියාපදිංචි කරන ලද සමූපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල් කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්ෂක වෙනුවට.

කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දීය, 1960.7.11.

---

ගලමුරුවේ මධ්‍යම ඩිස්පැන්සරිය හා අපෝතිකරි තැනගේ නිවාසය තැනීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස් වර්ක්ස් හවුස්හි පිහිටි රජයේ තැපැල්, වැඩ හා විදුලිබල පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1960 අගෝස්තු මස 3 වෙනි බදාදා පෙරවරු 9.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙ දින පස්වරු 2.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. හලාවත ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැන ගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1960 ජූලි මස 22 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 64,000ට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක්, ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රුපියල් 100ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටෙන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමූපකාර තොග වෙළඳ ආයතනය,
(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන, නිදසුනක් : "වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන්"
(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂතැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති, සහ
(ඈ) සමූපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර්තැන විසින් ලියාපදිංචි කරන ලද සමූපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්ෂක වෙනුවට.

කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දීය, 1960.7.11.

---

මන්නාරමේ ආහාර සැපයීමේ මධ්‍යස්ථානයට විශේෂ අළුත්වැඩියා කිරීම් සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1960 අගෝස්තු මස 3 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර්කරුවන්ට එතනට පැමිණ සිටිය හැකිය.

2. මන්නාරමේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ පෝරම සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1960 ජූලි මස 22 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 8,900ට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරුතැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රුපියල් 25ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටෙන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමූපකාර තොග වෙළඳ ආයතනය,
(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන, නිදසුනක් : "වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන්"
(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂතැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධක සමිති, සහ
(ඈ) සමූපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර්තැන විසින් ලියාපදිංචි කරන ලද සමූපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්ෂක වෙනුවට.

කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දීය, 1960.7.11.

---

කොළඹ ටොරිංටන් චතුරශ්‍රයේ ඔඩිට් කාර්යාල කැන්ටීමේ වීදුරු අල්මාරියක් සහ වෙන්කිරීමක් ආදී අළුත්වැඩියා කිරීම් සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ

1960 අගෝස්තු මස 3 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. කොළඹ ටොරිංටන් චතුරශ්‍රයේ, ආ. වැ. දෙපාර්තමේන්තුවේ කොළඹ බටහිර ගොඩනැගිලි පිළිබඳ විධායක ඉංජිනේරුතැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1960 ජූලි මස 22 වෙනි සිකුරාදා පස්වරු 4.30 වනතෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 5,000ට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරුතැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමූපකාර තොග වෙළඳ ආයතනය,

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන, නිදසුනක් : "වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන්"

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂතැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති, සහ

(ඈ) සමූපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර්තැන විසින් ලියාපදිංචි කරන ලද සමූපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්ෂක වෙනුවට.

කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දීය, 1960.7.11.

---

# බඩු බාහිරාදිය විකිණීම්

## අංගොඩ මානසික ආරෝග්‍යශාලාවේ කිරිපට්ටිය—ගවයින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

වර්ෂ 1960 අගෝස්තු මස 1 වෙනි දින අපරභාග 3 ට පහත සඳහන් ගවයින් අංගොඩ මානසික ආරෝග්‍යශාලා භූමි භාගයේ පිහිටි කිරිපට්ටියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

| සතාගේ අංකය | විස්තර | වර්ගය | වයස අවුරුදු |
|---|---|---|---|
| 12 | ... එළදෙනුන් | ... දෙමුහුන් | ... 16 යි |
| 16 | ... ,, | ... එම | ... 16 යි |
| 17 | ... ,, | ... එම | ... 16 යි |
| 54 | ... ,, | ... එම | ... 17 යි |
| 67 | ... ,, | ... එම | ... 16 යි |
| 77 | ... ,, | ... එම | ... 11 යි |
| 106 | ... ,, | ... එම | ... 9 යි |
| 149 | ... ,, | එම | ... 5 යි |
| 166 | ... පට්ටි හරකා | ... "ජර්සි" | ... 4 යි |
| | | | මාස |
| 111 ඊ | ... වසු පැටවුන් | ... දෙමුහුන් | ... 18 යි |
| 106 එෆ් | ... ,, | ... එම | ... 14 යි |
| 128 සී | ... ,, | ... එම | ... 20 යි |
| 142 සී | ... ,, | ... එම | ... 4 යි |
| 105 එෆ් | ... ,, | ... එම | ... 8 යි |
| 151 බී | ... ,, | ... එම | ... 12 යි |
| 149 බී | ... ,, | ... එම | ... 10 යි |
| 54 ජේ | ... ,, | ... එම | ... 10 යි |
| 147 බී | ... ,, | ... එම | ... 13 යි |
| 77 එච් | ... ,, | ... එම | ... 10 යි |
| 83 එච් | ... ,, | ... එම | ... 9 යි |
| 164 ඒ | ... ,, | ... එම | ... 4 යි |
| 107 ඊ | ... ,, | ... එම | ... 4 යි |
| 165 ඒ | ... ,, | ... එම | ... 4 යි |
| 168 ඒ | ... ,, | ... එම | ... 3 යි |

සතියේ දිනවල (රජයේ නිවාඩු දවස් හැර) මේ ගවයින් අංගොඩ මානසික ආරෝග්‍යශාලාවේ කිරි පට්ටියේදී එහි වෛද්‍ය සුපිරින්ටැන්ඩන්ට් මහතා සමග දින යොදා ගැනීමෙන් පසු පරීක්ෂාකර බැලීමට පුළුවන.

2. විකිණීමෙන් පසු, ඒ ඒ ගවයින් වෙන්දේසියෙන් ගත්අය ඒ අවස්ථාවේ දීම සම්පූර්ණ මුදල ගෙවා ගවයින් ගෙනයා යුතුයි.

3. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක තුමාට මේ විකිණීම අවලංගු කිරීමට හෝ කල් දැමීමට හෝ ඉල්ලීම ප්‍රතික්ෂෙප කිරීමට හෝ සම්පූර්ණ බලය තිබේ.

4. වැඩි විස්තර අංගොඩ මානසික ආරෝග්‍යශාලාවේ වෛද්‍ය සුපිරින්ටෙන්ඩන්ට් තැනගෙන් ලබාගත හැක.

ඇස්. ඥාණසේගරම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
මුදල් අංශය, තැ.පෙ. 584,
කොළඹ.
වර්ෂ 1960 ජූලි මස 11 වෙනි දින,
කොළඹ.

---

# විවිධ දැන්වීම්

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

### බම්බලපිටියේ තට්ටු නිවාස

1960 සැප්තැම්බර් මාසය තුළදී පමණ බම්බලපිටියෙහි සාදා නිමවිය හැකි නිදන කාමර දෙකකින් සමන්විතවූ තට්ටු නිවාස කුලියට දීම සඳහා ලංකා පුරවැසියන්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

2. පහත සඳහන් අය ඉල්ලුම් පත් එවීමට නුසුදුස්සෝ වෙති :—

(අ) තමන්ගේ සහ තමන්ගේ භාර්යාව/පුරුෂයා ගේ තමන්ගෙන් සම්පූර්ණයෙන් හෝ අඩ වශයෙන් යැපෙන ළමයින්ගේ සහ දෙමව්පියන්ගේ සම්පූර්ණ මාසික ආදායම රුපියල් 400 ට අඩුවූද, රුපියල් 1,000 ට වැඩිවූද අය.

(ආ) තමන්ගේ නමින් හෝ තමන්ගේ භාර්යාව/පුරුෂයා නමින් හෝ තමන්ගෙන් යැපෙන ළමයෙකුගේ නමින් හෝ ගෙයක් ඇති අය.

3. තට්ටු නිවාස පිහිටා ඇත්තේ 1 වැනි, 2 වැනි සහ 3 වැනි තට්ටු වශයෙන් තට්ටු 3 කය. බිම තට්ටුවෙහි ඇත්තේ සාප්පු ගොඩනැගිලි වේ. විදුලි එළිය, නළ මගින් සැපයෙන ජලය සහ වැසිකිළි කාණු ක්‍රමය ආදී පහසුකම් සලසා තිබේ.

4. ගෙවල්වල පදිංචිය සඳහා සුදුසු අය තෝරා ගනු ලබන්නේ ජාතික නිවාස කොමසාරිස් වරයා විසිනි. මොනම අයථා පෙළඹීමක් ඇති වූවහොත් එයම ඉල්ලුම් කරුවකු නුසුදුස්සකු වීමට කාරණයක් වන්නේය. තේරීම කරනු ලබන්නේ කුසපත් ඇදීමෙන්ය. කුසපත් ඇදීමේ දිනය සහ ස්ථානය පුවත් පත් නිවේදනයකින් පසුව දන්වනු ලැබේ. කුසපත් ඇදීම ඉල්ලුම් කරුවන්ට නැරඹිය හැක.

5. මාසික කුලිය මෙසේ සි :—

(අ) 1 වැනි තට්ටුවේ නිවාසයක් රුපියල් 112.50 සි.

(ආ) 2 වැනි තට්ටුවේ නිවාසයක් රුපියල් 107.50 සි.

(ඇ) 3 වැනි තට්ටුවේ නිවාසයක් රුපියල් 105 සි.

තෝරා ගනු ලැබූ ඉල්ලුම් කරුවකු විසින් මසක කුලිය සහ රුපියල් 50 ක් තැන්පත් කළයුතු වේ.

6. කොළඹ ජාතික නිවාස දෙපාර්තමේන්තුවේ මේ සඳහා නොමිළයේ නිකුත් කිරීමට පිළියෙල කර ඇති ඉල්ලුම් පත්‍ර මගින් ඉල්ලුම් කළ යුතු අතර එකී ඉල්ලුම් පත්‍ර 1960 අගෝස්තු 5 වැනිදා පස්වරු 4.30 ට හෝ ඊට පෙර ජතික නිවාස කොමසාරිස් තැන වෙත ලැබෙන සේ එවිය යුතුයි.

7. දැනට බම්බලපිටිය තට්ටු නිවාසවල පදිංචි අයට "එම්" කොටසෙහි තනා ඇති මෙම අළුත් නිවාස දීම ගැන විශේෂයෙන් සලකා බලනු ලැබේ. අනිකුත් ඉල්ලුම් කරුවන් සඳහා මෙසේ හිස්වන නිවාස වෙන් කරනවා ඇත.

8. ආදායම් බදු ගෙවන ඉල්ලුම් කරුවන් ඔවුන්ගේ ඉල්ලුම් පත සමග ලියා පදිංචි කරන ලද තැපෑලෙන් ලඟදීම ලැබී ඇති ආදායම් බදු තක්සේරු දැන්වීමද එවිය යුතුය.

9. නියමිත ඉල්ලුම් පත් මගින් මීට පෙර තට්ටු නිවාස ඉල්ලුම් කළ අය නැවතත් ඉල්ලුම් පත් එවීම අනවශ්‍ය වේ. ඔවුන්ගේ ඉල්ලුම් පත්ද අනිකුත් ඉල්ලුම් පත් සමග සලකා බලනු ලැබේ. ඉල්ලුම් පත එවා දින 14 ක් තුළදී එය ලැබුණු බවට දැන්වීමක් නොලැබුනහොත් ඒ බැව් දන්වා තැපැල් කාර්යාලයේ ලියාපදිංචි කරන ලද ලිපියකින් මෙම දෙපාර්තමේන්තුවට දැන්විය යුතුය. ඉල්ලුම් පත් බහා එවනු ලබන පිට කවරයේ වම් පැත්තේ ඉහළ කෙළවරේ "බම්බලපිටිය තට්ටු නිවාස සඳහා ඉල්ලුම් පත්" යැයි සඳහන් කළ යුතුය.

ආර්. ඇල්. ආර්නෝල්ඩා,
ජාතික නිවාස කොමසාරිස් තැන.

ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
තැපැල් පෙට්ටිය නො. 544,
කොළඹ 2.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී